
# අපේ විනය පොත



2015.02.21

සියළුම හිමිකම් ඇවිරිණි.



**යො ගවං න විජානාති**

**න සො රකඛති ගොගණං**

**එවං සීලං අජානනෙතා**

**කිං සො රකෙඛයය සංවරං**

ගවයන් නොදන්නා ගොපල්ලා ගවයන් නොරක්නේය.
එසේම සීලය නොදන්නේ කෙසේ නම් සංවර සීලය රකින්නෙම්ද?

**කිකීව අණඩං චමරීව වාළධිං**

**පියංව පුතතං නයනංව එකකං**

**තථෙව සීලං අනුරකඛමානකා**

**සුපෙසලං හොථ සදා සගාරවා**

බිජුවට රක්නා කිරල් දෙන මෙන්ද
වල්ගය රක්නා සෙමෙර මුවා මෙන්ද
එක් පුතු රක්නා පියකු මෙන්ද
එක් ඇසක් ඇත්තකු එඇස රක්නා සේද
හැමකල්හි ප්‍රිය ඇතිව ගරු ඇතිව සිල් රැක්ම කටයුතු

# පටුන


| පෙළගැස්ම | පිටුව |
|---|---|
| පිදුම | 05 |
| පෙරවදන | 06 |
| විනය හැඳින්වීම | 07 |
| ප්‍රාතිමෝක්ෂය | 08 |
| උපෝසථ කර්මය | 11 |
| සීමා | 14 |
| උපසම්පදාව | 20 |
| පාරාජිකා | 23 |
| සංඝාදිසේස | 39 |
| අනියත | 61 |
| නිසැගි පචිති | 63 |
| ශුද්ධ පචිති | 85 |
| පාටිදේශනී | 132 |
| සේඛියා | 134 |
| අධිකරණ සමථ | 140 |
| ශාසන ඉතිහාසය | 142 |

# පිදුම

සසර බිය දකිමින්

අනේක දුක් කටොළු විදගනිමින්

සංසාර ඕඝය තරණය කරන්නට වෙරදරණ

සතරදිගින් වඩින මහ සඝ රුවන අභියස

මාගේ මේ අහිංසක වෑයම

පා දුහුවිල්ලක් වේවා...!

## පෙරවදන

සම්බුදු සසුනෙහි ආයුෂ හෙවත් ජීවය විනයයි. පන්දහසක් වස් සම්මා සම්බුදු සසුන රැකගැන්ම මෙන්ම සැබෑ භික්ෂුවක නිර්මාණය යන කරුණු එකට බැඳී ඇත්තේ ගසට පොත්ත මෙනි.

එකී භික්ෂුවක් නිර්මාණයෙහිලා කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව පවත්වන්නා වූ විනය ප රීක්ෂණයට පෙළගැස්මක් විදියට මෙම පොත් පිංච සකස් වී ඇත. සියුම් කරුණෙහි පටන් පරා ජය දක්වා මාතෘකාමය වශයෙන් සංග්‍රහ වන මෙය විනය සාගරය තරණය කරන්නන් හට පුංචි තොටුපලක් වැන්න. කෙටි වුවද අගනා ලෙස සකස් වී ඇති මෙම ග්‍රන්ථය පැවිද්දන්ගේ මෙන් ම විනය ඉගෙනීමෙහිලාද අල්ප මාත්‍ර වූ අස්වැසිල්ලක් ලබාදෙන්නේ නම් අප උත්සාහය ඵල දරා ඇතැයි සිතන්නෙමු.

මෙම කාර්යෙහිලා පූජ්‍ය බද්දේගම වජිරානන්ද ස්වාමීන් වහන්සේ සහ ලබුනෝරුවේ ධම්ම විහාරී ස්වාමීන්වහන්සේ යන ස්වාමීන් වහන්සේලාගේ විනය ග්‍රන්ථ ප්‍රධාන කොට සකස් වී ඇ ති බව කෘතඥතාපූර් වකව සිහිපත් කරන්නෙමු.

2015.02.21 දීය.
නා උයන ආරණ්‍ය සේනාසනය,
පන්සියගම,
මැල්සිරිපුර.

## විනය

| | |
|---|---|
| විවිධ විශේෂ නයත්තා | - විනයනතො චෙව කාය වාචානං |
| විනයතථ විදූහිං අයං | - විනයො විනයොති අකඛාතො |

විවිධ විශේෂ ණය ක්‍රම ඇති බැවින්ද කය වචනය හික්මවන බැවින්ද විනය යැයි කියනු ලැබේ.

**විනය පැනවීමේ ප්‍රයෝජන**

| | |
|---|---|
| සංඝ සුටඨුතාය | සංඝයාගේ යහපත පිණිස |
| සංඝඵාසුතාය | සංඝයාගේපහසුව පිණිස |
| දුමමංකූනං පුගගලානං නිගගහාය | දුසිල්වතුන්ට නිග්‍රහ කිරීම පිණිස |
| පෙසලානං භිකඛූනං ඵාසුවිහාරාය | සිල්වත් භික්ෂූන්ගේ පහසුව පිණිස |
| දිටඨධමමිකානං ආසවානං සංවරාය | මෙලොව වශයෙන් අසංවරයෙන් ඇතිවන දුක් විපාක නැතිවීම පිණිස |
| සමපරායිකානං ආසවානං පටිඝාතාය | පරලොව වශයෙන් අසංවරයෙන් ඇතිවන දුක් විපාක නැතිවීම පිණිස |
| අපපසනනානං පසාදාය | නොපැහැදුනු අයගේ පැහැදීම පැහැදීම පිණිස |
| පසනනානං භිය්යෝභාවාය | පැහැදුණු  අයගේ වැඩිදියුණුවීම පිණිස |
| සදධමමටඨිතියා | ධර්මයේ පැවැත්ම පිණිස |
| විනයානුගගහාය | විනයට අනුග්‍රහ පිණිස |

**ආසවටඨනීය ධර්ම**

| | |
|---|---|
| රතතඤ්ඤු මහනතතාව | සාසනය ඇරඹී දිගු කලක් ගතවීම |
| වෙපුලල මහනතතාව | සසුනෙහි සඝ පිරිස වැඩිවීම |
| ලාභගග මහනතතාව | සසුනට ලාභ සත්කාර වැඩිවීම |
| බාහුසචච මහනතතාව | සසුනෙහි බහුශ්‍රැතයන් වැඩිවීම |

**සංඝ**

සංඝරත්නය දෙයාකාරයකි. සම්මුති සංඝ හා දක්ඛිණෙය්‍ය සංඝ යනුවෙනි. විනය සාකච්ජාවෙහිදී සම්මුති සංඝ සැලකේ.

සම්මුති සංඝ　　　　　　දකඛිණෙයාා සංඝ

චතුවාර්ගික සංඝ

පංචවාර්ගික සංඝ

දසවාර්ගික සංඝ


වීසති වාර්ගික සංඝ

අතරේක වීසතිවාර්ගික සංඝ

- මෙයින් වීසති හා අතිරේකවීසති සංඝයාට අබ්භාහන ආදී සියලු විනයකර්ම කල හැකිය.
- දසවාර්ගික සංඝයාට අබ්භාහන හැර මධ්‍යා දේශයේ උපසම්පදාව ආදී සියලු විනයකර් ම කල හැකිය.
- පංචවාර්ගික සංඝයාට අබ්භාහන හා මධ්‍යා දේශයේ උපසම්පදාව හැර ප්‍රත්‍යාන්ත දේශ වල සියලු විනයකර්ම කල හැකිය.
- චතුවාර්ගික සංඝයාට අබ්භාහන,මධ්‍යා දේශයේ උපසම්පදාව. ප්‍රත්‍යාන්ත දේශවල උප සම්පදා පවාරණය හැර පිරිවෙස් දීම, මානත් දීම, උපෝසථ ආදී අනෙක් සියලු විනයකර් මකල හැකිය.

<u>**ප්‍රාතිමෝක්ෂය**</u>

සම්බුද්ධ සාසනයේ භික්ෂුව විසින් රකිනා ශීලය ප්‍රාතිමෝක්ෂයයි. අති උතුම්, අති ප්‍රමුඛ, අති ශ්‍රේෂ්ඨ (අතිපමොක්ඛං, අතිසෙට්ඨං, අතිඋත්තමං) වූ අර්ථයෙන් ප්‍රාතිමෝක්ෂය යැයි කියනු ලැ බේ.




<u>**ඕවාද ප්‍රාතිමෝක්ෂය**</u>

මෙම ප්‍රාතිමෝක්ෂය සම්මා සම්බුදු රජාණන් වහන්සේලා පමණක් දේශනා කරනු ලබයි. ආඥා

ප්‍රාතිමෝක්ෂය  දේශනා කිරීමට ප්‍රථම අවුරුදු විස්සක් වූ මුල් කාලය තුල ‘සබබ පාපස්ස අකර ණං‘ , ‘ඛනතී පරමං තපො තිතිකඛා‘ , ‘අනූපවාදො අනූපඝාතො‘ ආදී වශයෙන් සිදුකරනු ලැබූ අවවාදාත්මක ගාථාවන්ය.

**<u>ආණා ප්‍රාතිමෝක්ෂය</u>**

බුදුරජාණන්  වහන්සේලා විසින් අවවාද ස්වරූපයෙන් බැහැරව නීතියක් සේ පනවා වදාරණ ලද ශික්ෂාසමූහය ආණා ප්‍රාතිමෝක්ෂයයි. මෙය ශීල ප්‍රාතිමෝක්ෂය ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය වශයෙ න් ආකාර දෙකකි.

**<u>ශීල ප්‍රාතිමෝක්ෂය</u>**

' ආදිමෙතං, මුඛමෙතං, පමුඛමෙතං කුසලානං ධමමානං තෙන වුචචති පාතිමොකඛං' ආදි ලෙ ස ශීල  ප්‍රාතිමෝක්ෂය දක්වා ඇත.මෙය ආදිසමාචාරික ශීලය, හා ආදි  බ්‍රහ්මචරියක ශීලය වශ යෙන් ආකාර දෙකකි.

»ආදිසමාචාරික ශීලය

සප්තආපත්තිස්කන්ධ අතුරින් දුකකට, දුබ්භාසිත යන ආපත්ති ස්කන්ධ යටතේ එන පැ නවීම්  මේ යටතේ සංග්‍රහ වේ.

»ආදිබ්‍රහ්මචරියක ශීලය

සප්ත ආපත්තිස්කන්ධ අතුරින් පාරාජිකා, සංඝාදිසේස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදේශ නීය යන පංච ආපත්තිස්කන්ධ යටතේ මෙය සංග්‍රහ සිකපද සමූහය හෙවත් ප්‍රාතිමෝක්ෂ ය ආදිබ්‍රහ්මචරියක ශීලය.

**<u>ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය</u>**

‘උභයානි ඛො පනසස පාතිමොකඛානි විතථාරෙන සවගතානි හොනති‘ ආදී ලෙස ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය දක්වා ඇත.මෙය භික්ඛු ප්‍රාතිමෝක්ෂය හා භික්ඛුණී ප්‍රාතිමෝක්ෂය ලෙස දෙවැදෑරුම් වේ.

» භික්ඛු ප්‍රාතිමෝක්ෂය

උද්දේස (05)

නිදානුද්දේසය
පාරාජිකානුද්දේසය
සංඝාදිසේසුද්දේසය
අනියතුද්දේසය
විත්ථාරුද්දේසය

| ශික්ෂාපද | (220) |
|---|---|
| පාරාජිකා | 04 |
| සංඝාදිසේස | 13 |
| අනියත | 02 |
| නිසැගි පචිති | 30 |
| ශුද්ධ පචිති | 92 |
| පාටිදේශනී | 04 |
| සේඛියා | 75 |
| | |
| ශික්ෂාපද | 220 |
| සමථ අධිකරණ | 07 |
| | 227 |

» භික්ඛුණී ප්‍රාතිමෝක්ෂය

උද්දේස (04)

නිදානුද්දේසය

පාරාජිකානුද්දේසය

සංඝාදිසේසුද්දේසය

විත්ථාරුද්දේසය

| ශික්ෂාපද | (304) |
|---|---|
| පාරාජිකා | 08 |
| සංඝාදිසේස | 17 |
| නිසැගි පචිති | 30 |
| ශුද්ධ පචිති | 166 |
| පාටිදේශනී | 08 |
| සේඛියා | 75 |
| | 304 |
| අධිකරණ සමථ | 07 |
| | 311 |

## <u>උපෝසථ කර්මය</u>

<u>උපෝසථ පූර්වකෘතයා</u>

### <u>පුබ්බකරණ</u>

උපෝසථ කර්මයට ප්‍රථම (සංඝයා රැස්වීමට) උපෝසථාගාරයේ කලයුතු කෘතයා 04ක් වේ. ඒ වා පුබ්බකරණ යනුවෙන් හැදින්වේ.

සමමජජනී පදීපොච
උදකං ආසනෙනච
උපෝසථසස එතානි
පුබ්බකරණනති වුචචති

සමමජජනී — උපෝසථාගාරයේ ඇතුලත හා අවට හැමද පිරිසිදු කිරීම.
පදීපොච — උපෝසථය පැවැත්වෙන්නේ රාත්‍රියක නම් පහන් දැල්විය යුතුය.
උදකං — පැමිණෙන ආගන්තුක භික්ෂූන්ගේ බීමට හා පරිභෝජනය සඳහා පැන් ගෙ නැවිත් තැබිය යුතුය.
ආසනෙනච — පැමිණෙන භික්ෂූන්ට ආසන පැනවිය යුතුය.

### <u>පුබ්බකිච්ච</u>

උපෝසථ කර්මයට භික්ෂූන් රැස්වුණායින් අනතුරුව ප්‍රාතිමෝක්ෂය සජ්ඣායනයට පෙර කල යුතු කෘත්‍යය 05 කි. මේවා පුබ්බකිච්ච යනුවෙන් හැදින්වේ.

ජනද පාරිශුදධි උතුකඛානං
භිකඛු ගණනාච ඕවාදො
උපොසථසස එතානි
පුබබකිචචනති වුචචති

ජනදපාරිශුදධි
උපෝසථයට පැමිණිය නොහැකි ගිලන් හා ගිලානෝපට්ඨාක වැනි අය සිටිත් නම් ඔවුන්ගේ ජ න්දය හා පාරිශුද්ධිය ගෙනආ යුතුය.

උතුකඛානං
පොහොය කරන අවස්ථාව වනවිට එතෙක් එම වර්ෂය තුල පැවති ඍතුවලින් දැනට පවතින ඍ තුවද, ඍතුවේ මුළු පොහෝ ගණනත්, ගතවූ පොහොය දින ගණනත්, ඉදිරියට ශේෂව ඇති පොහෝ ගණනත්, දැනට පොහොයක් එළඹ ඇත්ද යන්න ප්‍රකාශ කරීමයි.

භිකඛු ගණනාව

උපෝසථාගාරයට රැස් වූ ඇති භික්ෂු සංඝයා පාමොක් උදෙසීමට පෙර ගණනය කල යුතුය.

ඔවාදො

භික්ෂුනී සංඝයා විසින් භික්ඛු සංඝයා වෙත අෂ්ඨ ගරු ධර්මයෙන් අවවාද ලබාගැනීම සඳහා කර ඇති ඉල්ලීම දැනුම් දීම.

**<u>පතතකලල</u>**

උපොසථො යාවතිකාව භිකඛු
කමමපතතා සභාගාපතතියො ච
න විජජනති වජජනීයාව පුගගලා
තසමිං න හොනති පතතකලලනති වුචචති

උපොසථො

චාතුද්දසී, පණ්ණරසී ආදී උපෝසථයක් එළඹ ඇති බව.

යාවතිකාව භිකඛු

ප්‍රමාණවත් භික්ෂු පිරිසක් අත්පසට එළඹ ඇති බව.

කමමපතතා සභාගාපතතියො ච  න විජජනති

කර්මප්‍රාප්ත භික්ෂු සංඝයා සභාග ආපත්තියකට පැමිණ නැති බව.

වජජනීයාව පුගගලා තසමිං න හොනති

එක්විසි වජජනීය පුද්ගලයින් අත්පසින් බැහැර කර ඇති බව.

**<u>වසරක පොහොය සටහන</u>**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| හේමන්ත | ඉල් | අව පක්ෂය | 01 | පණ්ණරසී | | මුළු වර්ෂය |
| | උඳුවප් | පුර පක්ෂය | 02 | පණ්ණරසී | | |
| | උඳුවප් | අව පක්ෂය | | ***චාතුද්දසී*** | 03 | |
| | දුරුතු | පුර පක්ෂය | 04 | පණ්ණරසී | | |
| | දුරුතු | අව පක්ෂය | 05 | පණ්ණරසී | | |
| | නවම් | පුර පක්ෂය | 06 | පණ්ණරසී | | |
| | නවම් | අව පක්ෂය | | ***චාතුද්දසී*** | 07 | |
| | මැදින් | පුර පක්ෂය | 08 | පණ්ණරසී | | |
| | | | | | | |
| ගිම්හාන | මැදින් | අව පක්ෂය | 09 | පණ්ණරසී | | |
| | බක් | පුර පක්ෂය | 10 | පණ්ණරසී | | |
| | බක් | අව පක්ෂය | | ***චාතුද්දසී*** | 11 | |
| | වෙසක් | පුර පක්ෂය | 12 | පණ්ණරසී | | |
| | වෙසක් | අව පක්ෂය | 13 | පණ්ණරසී | | |
| | පොසොන් | පුර පක්ෂය | 14 | පණ්ණරසී | | |
| | පොසොන් | අව පක්ෂය | | ***චාතුද්දසී*** | 15 | |
| | ඇසල | පුර පක්ෂය | 16 | පණ්ණරසී | | |
| | | | | | | |
| වස්සාන | ඇසල | අව පක්ෂය | 17 | පණ්ණරසී | | |
| | නිකිණි | පුර පක්ෂය | 18 | පණ්ණරසී | | |
| | නිකිණි | අව පක්ෂය | | ***චාතුද්දසී*** | 19 | |
| | බිනර | පුර පක්ෂය | 20 | පණ්ණරසී | | |
| | බිනර | අව පක්ෂය | 21 | පණ්ණරසී | | |
| | වප් | පුර පක්ෂය | 22 | පණ්ණරසී | | |
| | වප් | අව පක්ෂය | | ***චාතුද්දසී*** | 23 | |
| | ඉල් | පුර පක්ෂය | 24 | පණ්ණරසී | | |
| | | | | | | |
| සෘතු 03 | මාස 12 | පක්ෂ 24 | | පණ්ණරසී | 18 | |
| | | | | චාතුද්දසී | 06 | මුළු පොහෝ 24 |

**<u>එක්විසි වජ්ජනීය පුද්ගලයින්</u>**

ගහටෙඨා

භිකඛුණී

සිකඛමානා

සාමණෙරා

සාමණෙරී

සිකඛංපචචකඛාතකො

අනතිමවතථුං අජ්ඣාපනනකො

ආපතතියා අදසසනෙ උකඛිතතකො

ආපතතියා අපපටිකමෙම උකඛිතතකො

පාපිකාය දිටඨියා අපපටිනිසසගෙග  උකඛිතතකො

පණ්ඩකො

ථෙය්‍යසංවාසකො

තිත්ථියපක්කන්තකො

උභතෝබ්‍යඤ්ජනකො

මාතුඝාතකො

පිතුඝාතකො


අරහන්තඝාතකො

භික්ඛුණීදූසකො

ලෝහිතුප්පාදකො

තිරච්ඡානගතා

**සීමා**




<u>බද්ධ සීමා</u>

එකොලොස්විධ විපත්ති සීමාවන්ගෙන් බැහැරව,ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්තව නිමිත්තෙන් නිමිත්ත සම්බන්ධ කර සම්මත කරනලද සීමායි.

<u>ඒකාදස විපත්ති සීමා</u>

අතිබුද්දිකා

අඩුම තරමින් 21 නමකට වත් අසුන් ගත නොහැකි ප්‍රමාණයේ කුඩා සීමා.

අතිමහතී

දිගින් යොදුන් තුනකට වඩා කෙසගක් හෝ වඩි වුවහොත් එය අතිමහතී සීමාව නම් වේ.

ඛණ්ඩ නිමිත්ත

නිමිති කීර්තනය කිරීමේදී එක් දිශාවක නිමිත්ත කීර්තනය කොට පිළිවෙළින් අනෙක් දිශාවන් වල නිමිති කීර්තනය කිරීමෙන් පසු නැවතත් ආරම්භක නිමිත්ත කීර්තනය කල

යුතු අතර එසේ නොකොට සම්මත කරනලද සීමාව මෙයයි.

ජායා නිමිත්ත

නිමිත්තක් ලෙස පර්වතවලහෝ යම්කි වස්තුවක සෙවනැල්ල යොදාගෙන සම්මත කර නලද සීමාව.

අනිමිත්ත

සීමාවක්නියමාකාරයෙන් ස්ථානගතකොට හෝ ස්වභාවික නිමිති තෝරාගෙන සම්මත කරගන්නා ලදමුත් එම නිමිති කීර්තනය නොකරනලද සීමාව.

බහිසීමෙ ඨිතා සම්මතා

තෝරාගන්නා ලද නිමිති කීර්තනය කලමුත් එය නිමිතිවලින් බැහැරව සිට සම්මත කර ගන්නා ලද සීමාව.

නදියා සම්මතා

නදියක් මැදිවන සේ සම්මත කරගන්නා ලද සීමාව.

සමුදෙද සම්මතා

මුහුදේ සම්මත කරනලද සීමාව.

ජාතස්සරේ සීමාව

ජලාශවල සම්මත කරනලද සීමාව.

සීමාය සීමං සමභිදනෙතන සම්මතා

සීමාවක් තවත් සීමාවක් සම්බන්ධ කර සම්මත කරනලද සීමාව.

සීමාය සීමං අජඣොතථරනෙතන සම්මතා

සීමාවක් තවත් සීමාවක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම යටකොට සම්මත කරනලද සීමාව.

<u>**ත්‍රිවිධ සම්පත්ති**</u>

» නිමිති සම්පත්තිය

පබ්බත නිමිත්ත, පාෂාණ නිමිත්ත, වන නිමිත්ත, රුකඛ නිමිත්ත, මගග නිමිත්ත, වම්මි

ක නිමිත්ත, නදී නිමිත්ත, උදක නිමිත්ත යන අෂ්ඨ නිමිතිවලින් පරිපූර්ණ වන ලෙස සම්මත කරගන්නා ලද සීමාවක් නිමිති සම්පත්තියෙන් යුක්තයැයි කියනු ලැබේ.

පබ්බත නිමිත්ත

තනිකරම ගල් හෝ තනිකරම පස් හෝ දෙක මිශුව ඇතෙකුගේ පුමාණයට හෝ ඊට වඩා විශාල කන්ද.

පාෂාණ නිමිත්ත

හකුරු පිඩකට වඩා වැඩි ඇතෙකුට වඩා අඩු ගලක් හෝ යකඩ පාෂාණ නිමිතත්ත යි.

වන නිමිත්ත

අඩුම තරමින් අරටුව සහිත ගස් 04 ක්හෝ 05ක් වත් තිබෙන කැලයක්.

රුකඛ නිමිත්ත

සූචි දණ්ඩක් ප්‍රමාණයට වැඩුන ගසක් වුවද සෑහේ. උසින් අගල් 08 ක් පමණවත් වන අරටු සහිත ගස්.

මගග නිමිත්ත

ගම් දෙක තුනක් යා කර දිවෙන අඩි පාරක් හෝ ගැල් පාරක්.

වම්මික නිමිත්ත

අඩුම තරමින් එදවස සාදනලද අගල් 08 ක් පමණවත් උස හරක් අගක් ප්‍රමාණ යේ මහත වූ තුඹසක්

නදී නිමිත්ත

ගලායන ජලය ඇති ස්වභාවික ගංගා ඇලදොලවල්

උදක නිමිත්ත

වැව් පොකුණු මුහුද කලපු ආදී ගලානොයන ජලය ඇති  ස්ථානයි. අඩුම තරමින් එවේලෙහි සාරනලද වලකට ජලය වත්කර විනයකර්මය ඉවරවනතුරු ජලය රැදී තිබේනම් එයද උදක නිමිත්තක් සේ ගත හැකිය.

» පරිස සම්පත්තිය

සබබනතිම වශයෙන් චාතුවාර්ගික රැස්ව එම ගාම කෙෂ්ත්‍රයෙහි බදධ සීමාවක් හෝ නදී සමුදද ජාතස්සර සීමාවන් හෝ ආක්‍රමණය නොකොට සිටියා වූ සියලු භික්ෂූන් අත්පසහි

කොට ගෙන ජන්දාහරණයට යෝග්‍යවූවන්ගේජන්දය ලබාගෙන සම්මත කරන ලද සී මාව පරිස සම්පත්තියෙන් යුක්ත වේ.

›› කමමවාචා සම්පත්තිය

ඤතති දුතිය කර්ම වාක්‍යයෙන් පිරිසිදුව නිවැරදිව සම්මත කරගන්නා ලද සීමාව කමම වාචා සම්පත්තියෙන් යුක්ත වේ.

<u>බදධ සීමා</u>

›› බණ්ඩ සීමා

බද්ධසීමාවක් තුල විනයකර්ම කිරීමේදී රැදී සිටින සියළුම භික්ෂු සංඝයා රැස්වීමට නියමිතය. එය බොහෝ අපහසු මෙන්ම එසේ රැස්කිරීමද ඉතා අපහසුය. එබැවින් ගරු විනයකර්ම හැරෙන්නට සාමාන්‍ය විනයකර්ම කිරීම සඳහා සියළු භික්ෂූන් රැස්නොවී අවශ්‍ය පමණට සංඝයා රැස් කරවාගෙන කලහැකි ආකාරයට අරමුණු සහිතව සම්මත කරගන්නා ලද සීමාවයි. මෙය කොටස් දෙකකට බෙදිය හැක.

සමානසංවාස සීමා

සමගි සංඝයා එකට රැස්ව විනයකර්ම සිදුකරනු ලබනසීමාවයි.

තිචීවර අවිපපවාස සීමා

තමා දරා සිටින තුන් සිවුරෙන් සැමතැන වාසය කලයුතු අතර මෙම සීමාව කර්මවාක්‍යය කියා සම්මත කරගැනීමෙන් පසු එහි ඇතුලතදී තුන් සිවුරෙන් වෙන්වද වාසය කලහැකිය.

›› මහා සීමා

යොදුන් 03ක් දක්වා උපරිම ප්‍රමාණයෙන් යුත් සීමාවයි. යොදුන් තුනට වඩා කෙසගක් හෝ වැඩිවුවහොත් සීමා ගණයට නොවැටේ.

මෙයද කොටස් දෙකකට බෙදිය හැක.

සමානසංවාස සීමා

සමගි සංඝයා එකට රැස්ව විනයකර්ම සිදුකරනු ලබනසීමාවයි.

තිචීවර අවිපපවාස සීමා

තමා දරා සිටින තුන් සිවුරෙන් සැමතැන වාසය කලයුතු අතර මෙම සීමා වකර්මවාක්යය කියා සම්මත කරගැනීමෙන් පසු එහි ඇතුලත දී තුන් සිවු රෙන් වෙන්වද වාසය කලහැකිය.

## අබද්ධ සීමා

» ගාම සීමා

කිසියම් ගාම භෝජකයකුට අයිති බල ප්‍රදේශයයි. මෙය විසුංගාම සීමා, නිගම සී මා, නගර සීමා යනුවෙන් කොටස් තුනකට බෙදේ.

විසුංගාම සීමා

යම් පුදේශයක් තුල රජ කෙනකු හෝ වෙනත් බලධරයකු නීත්‍යානුකූලව තවත් අළුත් නියං ගමක් සාදනු ලබයි නම් එම ගම් ප්‍රදේශයට අයිති මේ අළුත් ගම විසුංගාම නම් වේ.

නිගම සීමා

නියං ගමකට අයිතිවන කුඩා ගම් පුදේශයයි.

නගර සීමා

අදාල බල පුදේශයේ නගරය සීමා කරගෙන ඇති පුදේශයයි.

» උදකුකඛෙප සීමා

නදියක, හෝ මුහුදේ හෝ ජලාශයක මැදුම් පුරුෂයකු ජලය හෝ වැලි ගෙන හා ත්පස විසිකලවිට ඒවා වැටෙන සීමාවෙන් මෙපිට හාත්පස උදකුකඛෙපයකින් ව ටවන ප්‍රදේශයයි. මෙයද තුන් ආකාරයකින් දැක්විය හැකිය.

නදී සීමා

නදියක් මැදිවන සේ සම්මත කරගන්නා ලද සීමාව.

සමුද්ද සීමා

මුහුදේ සම්මත කරනලද සීමාව.

ජාතසසර සීමා

ජලාශවල සම්මත කරනලද සීමාව.

» සතතබබනතර සීමා

විශාල වනාන්තරවල හාත්පස අබ්බන්තර 07 ක ප්‍රමාණය සතතබබනතර නම් වේ. අබබනතරයක් යනු රියන් 28කි.

## උපසම්පදාව

### අෂ්ඨවිධ උපසම්පදාව

| | |
|---|---|
| එහි භික්ඛු උපසම්පදාව | පස්වග මහණුන් හට |
| සරණාමන උපසම්පදාව | රාහුල මහ රහතන් වහන්සේට |
| ඔවාද පටිගගහණ උපසම්පදාව | මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට |
| පඤ්හබ්‍යාකරණ  උපසම්පදාව | සෝපාක මහ රහතන් වහන්සේට |
| ගරුධමමපටිගගහණ උපසම්පදාව | මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු 500 දෙනාට |
| දූතෙන උපසම්පදාව | අඩ්ඪකාසී ගණිකාවට |
| අටඨවාචික උපසම්පදාව | භික්ඛුණී සංඝයා හට |
| ඤතති චතුතථකමම උපසම්පදාව | වර්තමාන භික්ඛු සංඝයා හට |

### උපසම්පදාව අකොප්‍ය වන ආකාරය

මෙහිදී කරුණු පසකින්  විනයකර්මය පරිපූර්ණ විය යුතුය.

» වත්‍ථු සම්පත්ති

විසි වස් සම්පූර්ණ වූ, ඒකාදස අභව්‍ය පුද්ගලයකු නොවූ , පාරාජිකාපන්නයකු නොවූ උපසම්පදාවට සුදුසු පුද්ගලයා වත්‍ථු සම්පත්තියයි.

ඒකාදස අභව්‍ය පුදුගලයන්

පණ්ඩකො

ථෙය්‍යසංවාසකො

තිත්ථියපක්කන්තකො

උභතෝබ්‍යඤ්ජනකො

මාතුඝාතකො

පිතුඝාතකො

අරහන්තඝාතකො

භික්ඛුණීදූසකො

ලෝහිතුප්පාදකො

තිරච්ඡානගතා

» ඤත්ති සම්පත්තිය

මෙහිදී වත්ථු අපරාමාසන, සංඝ අපරාමාසන, පුගගල අපරාමාසන, ඤත්ති අපරාමාසන, පච්චාඤත්තිඨපන අපරාමාසන , යන පංචවිධ අපරාමර්ශනයන්ගන් විනිර්මුක්තව නිවැරදිව පිරිසිදුව ඤතතිය කීර්තනය කල යුතුය.

» අනුසාවන සම්පත්තිය

වත්ථු අපරාමාසන, සංඝ අපරාමාසන, පුග්ගල අපරාමාසන, සාවන හාපන අපරාමාසන, අකාලසාවන අපරාමාසන යන පංචවිධ අපරාමර්ශනයන්ගන් මිදී නිවැරදිව පිරිසිදුව අනු සාවනය කීර්තනය කල යුතුය.

» සීමා සම්පත්තිය

එකොලොස්විධ විපත්ති සීමාවලින් මිදී නිවැරදිව පිරිසිදුව සම්මත කරගන්නා ලද සීමාව ක් තිබි ය යුතුය.

» පරිස සම්පත්තිය

එකකර්මප්‍රාප්ත භික්ෂු සංඝයා අත්පසට නොඑලඹීම, ඡන්දාහරණය නොකිරීම, රාශිභූත භික්ෂු සංඝයාගේ ප්‍රතිකෝෂණය යන ත්‍රිවිධ දෝෂයන්ගෙන් මිදුණු සබබනතිම චතුවාර්ගි ක කර්මප්‍රාප්ත භික්ෂු සංඝයා සිටිය යුතුය.

## උපසම්පදාව ප්‍රතික්ෂේප කරන ආකාරය

යම් භික්ෂුවකට පැවිද්දෙහි උකටලී බවක් නොඇල්මක් කලකිරීමක් ඇතිවුවහොත් ඔහුට උපසම්පදාව ප්‍රතික්ෂේප කල හැකිය. එහිදී කරුණු සයකින් පරිපූර්ණ විය යුතුය.

**චිතත**

මුළු සිතින්ම උපසම්පදාව අතහරින සිත තිබිය යුතුය.

**ඛෙතත**

බුදධං පචචකඛාමි (මම බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කරමි)
ධමමං පචචකඛාමි
සංඝං පචචකඛාමි
සිකඛං පචචකඛාමි
විනයං පචචකඛාමි
පාතිමොකඛං පචචකඛාමි
උදෙදසං පචචකඛාමි

උපජඣායං පචචකඛාමි
ආචරියං පචචකඛාමි
සදධිවිහාරිකං පචචකඛාමි
අනෙතවාසිකං පචචකඛාමි
සමානුපජඣායකං පචචකඛාමි
සමානාචරියකං පචචකඛාමි
සබ්‍රහ්මචාරිං පචචකඛාමි

**මෙම තුදුස් ආකාරයෙන්ද**

| | |
|---|---|
| ගිහීති මං ධාරෙහි (මම ගිහි බව දරමි) | තිත්‍ථියොති මං ධාරෙහි |
| උපාසකොති මං ධාරෙහි | තිත්‍ථිය සාවකොති මං ධාරෙහි |
| ආරාමිකොති මං ධාරෙහි | අසසමණොති මං ධාරෙහි |
| සාමණෙරොති මං ධාරෙහි | අසක්‍යපුත්තියොති මං ධාරෙහි |

**මෙම අට අයුරින්ද** යන <u>**දෙව්සි කෙෂ්ත්‍ර**</u> පදයන් අතුරින් එක් ආකාරයකින් ප්‍රකාශ කිරීම.

**කාල**

ප්‍රකාශ කරන්නා වූ ප්‍රතික්ෂේපය වර්තමාන කාලයෙන්ම සිදුවිය යුතුය.

**පයොග**

ප්‍රකාශ කරන්නා වූ ප්‍රතික්ෂේපය වාචිකවම ප්‍රතික්ෂේප කල යුතුය.

**පුගගල**

මෙහිදී ප්‍රතික්ෂේපය කරන්නා හා එය අසන්නා යන දෙදෙනාම උම්මත්තක ආදී නොවූ පියවි සිහිය ඇති අය විය යුතුය.

**විජානන**

ඇසූ පුද්ගලයා එකෙණෙහිම එහි අර්ථය දැන ගත යුතුය.

# පාරාජිකා (04)

## 1. මෙථුනධම්ම පාරාජිකා

**යෝ පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නෝ සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මේථුනං ධම්මං පතිසේවෙය්‍ය අන්තමසෝ තිරච්ඡානගතාය'පි පාරාජිකෝ හෝති අසංවාසෝ.**

*යම් භික්ෂුවක් භික්ෂු ආජීවයට පැමිණ ශික්ෂාවන් ප්‍රතික්ෂේප නොකොට දුර්වල බව ද නොකියා යටත් පිරිසෙයින් තිරිසන්ගතයකු සමඟ වුව ද මෙවුන් දම් සෙවීනම් පරිජි වෙයි. (පියවි මහණුන් සමඟ) සඟවාසයට නුසුදුස්සෙක් ද වෙයි.*

### උපමාව

| | |
|---|---|
| සීසච්ඡින්න පුරිසො | හිස සිඳුණු පුරුෂයෙක් යලි හිස සවිකර ජීවත් කරවිය නොහැක්කාක් මෙන් |

### අර්ථ

| | |
|---|---|
| සික්ඛාසාජීව සමාපන්නො | අධිශීල සංඛ්‍යාත ප්‍රාතිමෝක්ෂයට සම්‍යක් ප්‍රතිපන්න වූයේ |
| සික්ඛං අපච්චක්ඛාය | රිසියෙන්ම ශික්ෂාව ප්‍රතික්ෂේප නොකර |
| මෙථුනං ධම්මං | කාමාශාවෙන් මැඩුණු සාමාන්‍ය ස්ත්‍රී පුරුෂ දෙදෙනකුගේ ලාමක ධර්මය හෙවත් රහස්‍ය කර්මය |
| පතිසෙවෙය්‍ය | පුරුෂ නිමිත්තෙන් ස්ත්‍රී නිමිත්තද ස්ත්‍රී නිමිත්තෙන් පුරුෂ නිමිත්තද එක තලැටක් පමණවත් ප්‍රකෘති වාතයෙන් ස්පර්ෂ නොවන තෙත් පෙදසෙහි ප්‍රවේශ කිරීම |

### අංග

සේවන චිත්තය

මාර්ගයෙන් මාර්ගය ප්‍රතිපාදනය

### ආපත්ති

| | |
|---|---|
| ඇතුල් කරන මාර්ගය ආවරණය කර ඇතුල් කලද | පාරාජිකා |
| බොහෝ සෙයින් විනාශ නොවූ මෘත ශරීරයකද | පාරාජිකා |

ජීවමාන ශරීරයක සම ආදිය විනාශ වූ, නිමිතිවල සටහන් පමණක් තිබියද ඇතුල් කළේ නම් පාරාජිකා

ජීවමාන ශරීරයක නිමිත්ත සම්පූර්ණයෙන් ඉවත්කර ඇතිවිට (වණ ස්වභාවයක් ඇතිවිට) ඇතුල් කළේ නම් ථුල්ලැසි

ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම ඇස් සිදුරුවල, කන් සිදුරුවල, නාස් සිදුරුවල,වස්තිකෝෂවලද, ඇත් අස් ගව ආදී ප්‍රමාණයෙන් විශාල තිරිසන් සතුන්ගේ වස්තිකෝෂවල නාසා සිදුරු වලද අංගජාතය ඇතුළුකිරීමෙන් ථුල්ලැසි

තොල්වලින් පිටට දිගු කල දිවෙන් පුරුෂලිංගය ස්පර්ෂ කිරීමෙන් ථුල්ලැසි

තොල්වල නොගැවෙන සේ දත්වල ලිංගය ස්පර්ෂ කිරීමෙන් ථුල්ලැසි

මෛථුන රාගයෙන් කවරකුගේ හෝ සිරුරක් ඇල්ලීමෙන් දුෂ්කට

තිරිසන්ගත සතුන්ගේ ඇස් සිදුරුවල, කන් සිදුරුවල, නාස් සිදුරුවල, තුවාලවල ඇතුළු කිරීමෙන් දුෂ්කට

## අනාපත්ති

අජානනතසස, අසාදියනතසස

උමමතතක, ඛිතතචිතත, වෙදනටඨ, ආදිකමමික

## සමතිස් මාර්ග

| පුද්ගලයන් | මාර්ග | | | එකතුව | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| මනුෂ්‍ය ස්ත්‍රී | මුඛ මගග | වචච මගග | පසසාව මගග | | |
| අමනුෂ්‍ය ස්ත්‍රී | ” | ” | ” | | |
| තිරච්ජාන ස්ත්‍රී | ” | ” | ” | | |
| මනුෂ්‍ය උබතෝබ්‍යංජනක ස්ත්‍රී | ” | ” | ” | | |
| අමනුෂ්‍ය උබතෝබ්‍යංජනක ස්ත්‍රී | ” | ” | ” | | |
| තිරච්ජාන උබතෝබ්‍යංජනක ස්ත්‍රී | ” | ” | ” | 18 | |
| | | | | | |
| මනුෂ්‍ය පුරුෂ | මුඛ මගග | වචච මගග | | | |
| අමනුෂ්‍ය පුරුෂ | ” | ” | | | |
| තිරච්ජාන පුරුෂ | ” | ” | | | |
| මනුෂ්‍ය පණ්ඩක පුරුෂ | ” | ” | | | |
| අමනුෂ්‍ය පණ්ඩක පුරුෂ | ” | ” | | | |
| තිරච්ජාන පණ්ඩක පුරුෂ | ” | ” | | 12 | 30 |

## සප්තදසාකාරය

*නිදානය* :- වෙසාලියයි

*පුග්ගල* :- සුදින්න ස්ථවිරයන් වහන්සේ

*වස්තුව* :- මෛථුන ධර්ම ව්‍යතික්‍රමණය

*පඤ්ඤත්තිය* :- යො පන භිකඛු...-පෙ- පතිසෙවෙය්‍ය

සිකඛං අපචචකඛාය යනුද , අනතමසො තිරචජානගතාය'පි යනුද අනුප්‍රඥපති වේ

*ආණත්තිය* :- අනාණතතික යි

*ආපත්තිය* :- පාරාජිකාපතතිය යි

*අනාපත්තිය* :- අජානනතසස, අසාදියනතසස

උමමතතක, ඛිතතචිතත, වෙදනටඨ, ආදිකමමික

*විපත්තිය* :- ශීල විපත්තිය යි

| | | |
|---|---|---|
| *අංග* | :- | සේවන චිත්තය, මාර්ගයෙන් මාර්ගය ප්‍රතිපාදනය |
| *සමුට්ඨාන* | :- | කාය චිත්ත සමුට්ඨානයි |
| *කිරිය* | :- | ක්‍රියා වශයෙනි |
| *සඤ්ඤා* | :- | සඤ්ඤා විමොක්ඛ යි |
| *චිත්ත* | :- | සචිත්තක යි |
| *වජ්ජ* | :- | ලොකවජ්ජ යි |
| *කම්ම* | :- | කාය කර්මයි |
| *කුසලත්‍රිකය* | :- | අකුසල යි |
| *වේදනාත්‍රිකය* | :- | ද්වි වෙදනා යි |

## 2. අදින්නාදාන පාරාජිකා

**යෝ පන භික්ඛු ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසංඛාතං ආදියෙය්‍ය, යථාරූපේ අදින්නාදානේ රාජානෝ චෝරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා: චෝරෝ'සි, බාලෝ'සි, මූළ්හෝ'සි, ථේනෝසී'ති. තථාරූපං භික්ඛු අදින්නං ආදියමානෝ; අයම්පි පාරාජිකෝ හෝති අසංවාසෝ.**

*යම් කිසි භික්ෂුවක් ගමින් හෝ ආරණ්‍යයෙන් (කැලෑවෙන්) හෝ නුදුන් වස්තුවක් සොරකම් කෙරේ ද එබඳු පැහැරගැනීමකදී රජවරු සොරුන් අල්වා මරත් ද සිර කරත් ද රටින් හෝ නෙරපා හරිත් ද තෝ සොරෙක බාලයෙක මෝඩයෙක සැඟවී සිටිය යුත්තෙකැයි නින්දා පරිභව කෙරෙත් එබඳු ආකාරයේ සොරකමක් කරන මහණතෙමේ පරිජිවූයේ වෙයි. (පියවි මහණුන් සමග) සහවාසයට නුසුදුස්සෙක් ද වේ.*

### උපමාව

| | |
|---|---|
| පණ්ඩුපලාසො | ගසකින් ඉදී වැටුණු කොලයක් යලි නිල්වන් නොවන්නා සේය. |

### අර්ථ

| | |
|---|---|
| ගාමාවා අරඤ්ඤාවා | ග්‍රාමයෙන් හෝ අරණ්‍යයෙන් හෝ |

<u>ගම</u>

ගඩොල් ප්‍රාකාරයකින් හෝ අන්තිම පරිවෙජදයෙන් කටු අතු වැටකින් හෝ පිරිකෙව් කලා වූද නොකලා වූද මනුෂ්‍ය වාස වූයේ හෝ නොවූයේ හෝ එකකුටි කාදී ප්‍රෙද්ශය ග්‍රාමය නම් වේ.

**අරණ්‍ය**

වහලේ කෙලවරින් වතුර වැටෙන ස්ථානය ‘සර‘ නම් වේ. ද්වාරයෙහි සිටි මාගමක් බඳුන් දෝනා ජලය විසිකලවිට පතිත ස්ථානය ‘සරුපචාරය‘ නම් වේ. සබ්බනතිම සරුපචාරයෙහි සිට මැදුම් පුරුෂයකු විසින් අධික ශක්තියෙන් විසිකරන ලද ගලක් පළමු වැටුණ තැනින් මෙපිට ‘ග්‍රාමය‘ වේ. ග්‍රාමානතයෙහි සිට උකතප්‍රකාරයෙන් දැමූ ගල පළමු වැටෙන ස්ථානයෙන් මෙපිට ‘ග්‍රාමෝපචාරය‘ නම් වේ. ග්‍රාමයත් ග්‍රාමෝපචාරයත් හැරුණුකොට ඉන් එපිට ‘අරණ්‍ය‘ වෙයි.

| | |
|---|---|
| අදිනනං | වත් හිමියා විසින් කයින් හෝ වදනින් හෝ ස්වකීය සවාමීතවය සමග නොදෙන ලද වස්තුව |
| ථෙය්‍යසංඛාතං | අවහරණ චිත්තය |
| ආදියෙය්‍ය | පස්විසි අවහාර අතුරින් එක් අවහාරයකින් සොරසිත් ඇතියාව ගැනීම |

**පස්විසි අවහාරය**

| | |
|---|---|
| නානාභාණ්ඩ පංචකය | 05 |
| ඒකභාණ්ඩ පංචකය | 05 |
| සාහත්ථික පංචකය | 05 |
| පුබ්බ පයොග පංචකය | 05 |
| ථෙය්‍යාවහාර පංචකය | 05 |
| | **25** |

❖ **නානාභාණ්ඩ පඤ්චකය**

» ආදියෙය්‍යය

මෙරමා අයත් ආරාමාදිය ගැනීම පිණිස බොරු පැමිණිලි කිරීම.

| | |
|---|---|
| වාග් ප්‍රයෝග | - දුෂ්කට |
| වස්තු හිමියාට සැක | - ථුල්ලැසි |

දෙදෙනාම බලාපොරොත්තු අතහරී - පරිජී

» හරෙය්‍යය

අන් අයකුගේ වස්තුවක් තමා ගෙන යමින් ඇතිවන සොරසිත.

ස්පර්ශය - දුෂ්කට
සෙලවීම - ථුල්ලැසි
ඨානාචාවනය - පරිජී

» අවහරෙය්‍යා

අනුන් තමා ළග තැබූ වස්තුවක් නැවත ඉල්ලූ කල සොරසිතින් ‘‘මම නොගත්තෙමි‘‘යි කියානම්

නොගත් බව කීම - දුෂ්කට
වස්තු හිමියාට සැක - ථුල්ලැසි
දෙදෙනාම බලාපොරොත්තු අතහරී - පරිජී

» ඉරියාපථං විකාපෙය්‍යා

බඩු ගෙනයන්නකුගෙන් සොරෙන් ගනු කැමතිව උපක්‍රම කර යන මග වෙනස්කොට තමන් කැමති මගට හරවා ගැන්ම.

බොරුව අසා මග වෙනස්කොට එක් පියවරක් හෝ තබයි - දුෂ්කට
දෙවන පියවර තැබීම - පරිජී

» ඨානාචාවෙය්‍යා

අනුන් සතු වස්තුවක් සොරකම් කරගැනීමේ සිත ඇතිවීම.

සොරසිතින් ස්පර්ෂය - දුෂ්කට
සෙලවීම - ථුල්ලැසි
ඨානාචාවනය(තිබූ තැනින් ඉවත්කිරීම) - පරිජී

❖ <u>ඒක භාණ්ඩ පඤ්චකය</u>

» ඉහත ආකාර පරිදිම සවිඤ්ඤාණක වස්තුවක් සොරසිතින් ගැනීම මෙයට අයිති වේ. නානාභාණ්ඩ පඤ්චකය අවිඤ්ඤාණක වස්තුවක් සඳහා වේ.(ඇවැත් පෙර පරිදිම වේ)

❖ <u>සාහත්ථික පඤ්චකය</u>

» සාහත්ථික

අනුන් සතු වස්තුවක් සොර සිතින් තමා අතින්ම ගැනීම.

» ආනතථික

'අසවලාගේ බඩු ගෙන එව' යි අණකර ගෙන්වා ගැනීමේ සොරකම.

» නිස්සග්ගිය

අය බදු අය කරන ආදි තැන්හිදී ඇතුලත සිට බඩු බාහිරාදිය පිටකර ගැනීම.

» අත්ථසාධක

'අසවලාගේ බඩු හැකි අවස්ථාවක ගොස් සොරාගනු' යි අණකර සොරකම් කරවීම.

- අණකරන්නා එකෙණෙහිම 'පරිජි'
- අණ ලබන්නා සොරකම් කළවිට 'පරිජි'

» ධූරනිකෙඛප

අනුන් සතු ආරාම ආදිය බොරු කියා අයිතිය ගැනීමේ අදහසින්

- බොරු අයිතිය පැවසීමද
- තමා ළග තැබූ පරිෂ්කාරයක් 'නොගතිමි'යි කියන විටද
- තාවකාලිකව භාණ්ඩයක් නොදෙන විටද

දෙදෙනාගේ ධූරනිකෙඛපයෙන් (බලාපොරොත්තු අතහැරීමෙන්) ගත්හට 'පරිජි' වේ.

❖ <u>**පුබ්බපයොග පඤ්චකය**</u>

» පුබ්බපයොග

'අසවලාගේ බඩු සොරා ගනුව'යි අණ කළ කල්හි අණ ලැබූ තැනැත්තා බඩු ගත් කෙණෙහිම අණකලහු පරිජි වේ.

» සහපයොග

අන්සතු වස්තුවක් ගැනීමට යෙදෙන අවසන් වැයමේදී පරිජි වේ.

» සංවිදාවරො

'අසවලාගේ බඩු සොරාගමුව' යි කිහිප දෙනකු ගොස් එකකු වුව සොරකම් කළේ නම් සියල්ලන්ම පරිජි වේ.

» සංකෙතකමම

වේලාව නියම කොට 'අසවලාගේ බඩු අසවල් වේලාවට ගනුව' යි ඒ වේලාවටම ගත්තේ නම් සංකේතය කලහුට එකෙණෙහිම පරිජි වේ.

» නිමිත්තකමම

අසවලාගේ බඩු මා අසවල් සංඥාව ගල කල්හි ගනුව යි කිසියම් සංඥාවක් කළ කල්හිම ගත්තේ කම් නිමිත්ත කළහුට එකෙණෙහිම පරිජි වේ.

## ❖ <u>ථෙය්‍යාවහාර පඤ්චකය</u>

» ථෙය්‍යාවහාරො

අයිතිකරුට නොදැනෙන්නට කරන සොරකම මෙයින් අගවයි. උමං කැණීම්, තලාකූට (තරාදියෙන් හොරට කිරීම), කූට කපාහන(හොර මුදල් ගනුදෙනු) ආදියෙන් වංචා කරනු ලබයිද පරිජි වේ.

» පසය්හාවහාරො

පල් හොරුන් මෙන් බලාත්කාරයෙන් වස්තු සොරකම් කිරීමද, නිල මුලාදෑනීන් මෙන් ගතයුතු අයබදු ආදිය අධිකව ගැනීමෙන්ද පරිජි වේ.

» පරිකප්පාවහාරො

සොරාගනු කැමතිව යමක් දැක එහි අසවල් දේ ඇතැයි සිතා සොරකම් කල කල්හි සිතූ පරිදි එය තිබුණේ නම් පරිජි වේ. නොතිබුණේ පරිජි නොවේ. වෙනත් දෙයක් තිබූ කල්හි ‘මෙයද කම් නැත‘ කියා ගත්තෙහි නම් පරිජි වේ.

» පටිච්ඡන්නාවහාරො

අන්සතු වස්තුවක් තැනෙක තිබෙනු දැක සොරසිතින් පස්වලින් හෝ කොලවලින් වසා පසුව එය ගැනීමේදී පරිජි වේ. එමෙන්ම තිබූ තැන වෙනස්කලේ නම්(ඨානාචාවනය) එකෙණෙහිම පරිජි වේ.

» කුසාවහාරො

කුසපත් දමා පරිෂ්කාර ආදිය බෙදීමේදී තම කොටසට වැඩි වූ හෝ සම වූ හෝ ‘අනිකකුගේ කොටස ගනිමි‘යි සිතා එහිමිගේ කුසපත තමාගේ කුසපතට දමා ගනී නම්, මාරු කලේ නම් හෝ තිබූ තැනින් වෙනස් කලේ නම් පරිජි වේ.

### අංග

මිනිසකු සතු දෙයක් වීම
මිනිසකුට අයත්ය යන හැගීම
පාදයක් හෝ පාදයක් වටිනා භාණ්ඩයක් වීම
සොරසිත
කවර ආකාරයකින් හෝ සොරකම් කිරීම

### දුතිය පාරාජිකා විනිෂ්චය

මෙහිදී කරුණු 05ක් සළකා බැලිය යුතුය.

| | | |
|---|---|---|
| I. | වත්ථු | - සොරකම් කල භාණ්ඩයට අයිතිකරුවකු සිටීද නැද්ද යනවග මෙන්ම අයිතිකරු එය සිතින් අතහැර ඇත්ද නැද්ද යනවග. |
| II. | කාල | - සොරකම සිද්ධ කල කාලය තුල භාණ්ඩයේ වටිනාකම. |
| III. | දේශය | - සොරකම සිද්ධ කල ප්‍රෙද්ශයේ එම භාණ්ඩයේ වටිනාකම. |
| IV. | අගය | - වස්තුව අලුත් භාණ්ඩයක්ද පරණ භාණ්ඩයක්ද යනවග. |
| V. | පරිභෝග | - පරිභෝග කළ වස්තුවක් නම් ඒ අනුව වටිනාකම. |

**ආපත්ති**

| | |
|---|---|
| මසු 05 හෝ එම ප්‍රමාණය ඉක්මවීම | - පරිජි |
| මසු 01-04 දක්වා | - ථුල්ලච්චය |
| මසු 01ට වඩා අඩු නම් | - දුෂ්කට |

**අනාපත්ති**

තමාගේ යන හැඟීමෙන් ගැනීමෙන්
විශ්වාසයෙන්
තාවකාලිකව
දෙවියන්ට අමනුෂ්‍යයන්ට අයත් දේ
තිරිසන් සතුන්ට අයත් දේ
පාංශුකූල සංඥාවෙන්
උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ට/ ආදිකම්මික

**සප්තදසාකාරය**

| | | |
|---|---|---|
| *නිදානය* | :- | රජගහනුවර යි |
| *පුග්ගල* | :- | ධනිය ස්ථවිරයන් වහන්සේ |
| *වස්තුව* | :- | රජුගේ දැවසොරාගැනීම් සංඛයාත වස්තුව |
| *පඤ්ඤත්තිය* | :- | යො පන භික්ඛු...-පෙ- අසංවාසො<br>ගාමාවා අරඤ්ඤාවා යනු අනුප්‍රඥපති වේ |
| *ආණත්තිය* | :- | සාණත්තික යි |
| *ආපත්තිය* | :- | දුකුලා, තුලැසි, පරිජි |
| *අනාපත්තිය* | :- | සකසඤ්ඤිසස, විසසාසගාහෙ, තාවකාලිකෙ,<br>පෙතපරිගගහෙ, තිරච්ඡානගතපරිගගහෙ,<br>පංසුකූලසංඤ්ඤිසස |

| | | |
|---|---|---|
| | | උම්මත්තක, ඛිත්තචිත්ත, වේදනට්ට, ආදිකම්මික |
| *විපත්තිය* | :- | ශීල විපත්තිය යි |
| *අංග* | :- | පරපරිග්ගහිතං, පරපරිග්ගහිත සඤ්ඤිතා, ගරුපරික්ඛාරො, ථෙය්‍යචිත්තං, අවහරණං |
| *සමුට්ඨාණ* | :- | අදින්නාදාන සමුට්ඨානයි |
| *කිරිය* | :- | ක්‍රියා වශයෙනි |
| *සඤ්ඤා* | :- | සඤ්ඤා විමොක්ඛ යි |
| *චිත්ත* | :- | සචිත්තක යි |
| *වජ්ජ* | :- | ලොකවජ්ජ යි |
| *කම්ම* | :- | කාය වචී කර්මයි |
| *කුසලත්‍රිකය* | :- | අකුසල යි |
| *වේදනාත්‍රිකය* | :- | ත්‍රිවෙදනා යි |

## 3. මනුස්ස විග්ගහ පාරාජිකා

**යෝ පන භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වෝරෝපෙය්‍ය, සත්ථහාරකං වා'ස්ස පරියේසෙය්‍ය, මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය, මරණාය වා සමාදපෙය්‍ය: අම්භෝ පුරිස! කිං තුය්හිමිනා පාපකේන දුජ්ජීවිතේන? මතන්තේ ජීවිතා සෙය්‍යෝ'ති. ඉති චිත්තමනෝ චිත්තසංකප්පෝ අනේකපරියායේන මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය මරණාය වා සමාදපෙය්‍ය; අයම්පි පාරාජිකෝ හෝති, අසංවාසෝ.**

*යම් කිසි භික්ෂුවක් මනුෂ්‍ය ශරීරය ජීවිතේන්ද්‍රියයෙන් තොර කරයි, මරණය සඳහා ආයුධ හෝ පිළියෙල කොට තබයි, මරණයෙහි අනුසස් හෝ ප්‍රකාශ කරයි, ඔබට මේ පව්වූ දුක්බර ජීවිතයෙන් කවර වැඩක් ද? ජීවත්වීමට වඩා ඔබේ මරණය උතුම්ය යි මරණු කැමති සිත් ඇතිව කල්පනා ඇතිව නොයෙක් අයුරින් මරණයෙහි ගුණ වනන්නාවූ ද මරණය පිණිස උත්සාහ ගන්වන්නාවූ ද මහණ තෙමේ පරිජි වූයේ වෙයි. (පියවි මහණුන් සමඟ) සහවාසයට නුසුදුස්සෙක් ද වෙයි.*

**උපමාව**

දවෙ ධා හිණණා පුපු සිලා            දෙපලු වූ පර්වතයක් යළි හා නොවන්නා සේ

**අර්ථ**

මනුසස විගගහං — ඉතා සියුම් පඨම කලලයේ පටන් මරණය තෙක් ජීවමාන ශරීරය

ජීවිතා වොරොපෙයාා — ඉතා සියුම් පඨම කලලයේ පටන් මරණය තෙක් ජීවමාන ශරීරය විනාශ කිරීම

සඤ්චිචච — දැන දැන

## මැරීමේ ප්‍රයෝග

සාහතථික - සිය අතින්ම මැරීම

නිසසගගිය - වෙඩි තැබීම්, දුණු, ඊතල ආදී විසිකරන දෙයකින් මැරීම

ආණතථික -

වතථු - 'අසවල් පුද්ගලයා මරන්නැ' යි
කාල - 'අසවල් කාලයේදී මරන්නැ' යි
ඕකාස - 'අසවල් ස්ථානයේදී මරන්නැ' යි
ආවුධ - 'අසවල් ආයුධයෙන් මරන්නැ' යි
ඉරියාපථ - 'අසවල් ඉරියව්වෙන් සිටිනවිට මරන්නැ' යි

කිරියා විශේෂ - මැරීම කරන ආකාරය ප්‍රකාශකිරීම යනාදී අණදීම් වලින් පසු එයාකාරයෙන්ම කළේ නම් පරිජි වේ.

ථාවර ප්‍රයෝග- උගුල් ඇටවීම, බොරු වලවල් කැපීමෙන් මැරීම

විජ්ජාමය - යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වලින් කරනු ලබන බලපෑම්වලින් මැරීම

සෘදධිමය - කර්ම සෘධිමය හැකියාවලින් ආදියෙන් මරණයට පත්කිරීම

## අංග

මිනිසකු වීම
පණ ඇතැයි යන හැගීම
වධක සිත
උපක්‍රමය
එයින් මරණයට පත්වීම

## ආපත්ති

| | |
|---|---|
| මිනිස් මරණය | පරිජි |
| මරණය පිණිස මිනිසකුට දුක් ඉපිදවීම | ථුලැසි |
| යක්ෂ ප්‍රේත මරණය | ථුලැසි |
| තිරිසන් මරණය | පචිති |
| වල කැපීමාදිය | දුෂ්කට |
| කැපූ වල ආදියෙහි කිසිවකු වැටීම | දුෂ්කට |
| යක්ෂ ප්‍රේත තිරිසන් අයට දුක් ඉපිදවීම | දුෂ්කට |

## අනාපත්ති

‘මෙයින් මෙතෙම මැරේ‘ යයි නොදැන
නොදන්නා කෙනාටය
මැරීමේ චේතනාව නැතිව
අසිහියෙන්
උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ට/ ආදිකම්මික

## සප්තදසාකාරය

| | | | |
|---|---|---|---|
| *නිදානය* | :- | වෙසාලියයි | |
| *පුග්ගල* | :- | බෙහෝ භික්ෂූන් | |
| *වස්තුව* | :- | ඔවුනොවුන් දිවිනසාගැනීම් සංඛ්‍යාත වස්තුව | |
| *පඤ්ඤත්තිය* | :- | යො පන භිකඛු…-පෙ- අසංවාසො | |
| | | මරණ වණ්ණංවා සංවණ්ණෙය්‍යාය ය අනුප්‍රඥප්ති වේ | |
| *ආණත්තිය* | :- | සාණත්තික යි | |
| *ආපත්තිය* | :- | වල කැණීම් ආදිය | දුකුලා |
| | | මිනිස් දැයෙහි වූවෙකුට දුක් ඉපිදවීම | තුලසි |
| | | තිරිසන් ගිය මරණය | පචිති |
| | | මිනිස් මරණය | පරිජි |
| *අනාපත්තිය* | :- | අජානනතසස, අසාදියනතසස | |
| | | උමමතතක, ඛිතතචිතත, වෙදනටය, ආදිකමමික | |
| *විපත්තිය* | :- | ශීල විපත්තිය යි | |

| | | |
|---|---|---|
| *අංග* | :- | මනුෂ්‍ය ප්‍රාණයෙක් වීම, ප්‍රාණියෙක්ය යන හැඟීම, වධක චේතනාව, උපක්‍රමය, එයින් මැරීම |
| *සමුට්ඨාණ* | :- | අයිනාදන් සමුටඨානයි |
| *කිරිය* | :- | ක්‍රියා වශයෙනි |
| *සඤ්ඤා* | :- | සඤ්ඤා විමොකඛ යි |
| *චිත්ත* | :- | සචිතතක යි |
| *වජ්ජ* | :- | ලොකවජජ යි |
| *කම්ම* | :- | කාය වචී කර්මයි |
| *කුසලත්‍රිකය* | :- | අකුසල යි |
| *වේදනාත්‍රිකය* | :- | දුකඛ වෙදනා යි |

✓ *මෙම පාරාජිකාව සිදුවන්නේ වධක චිත්තය සහිතව මැරීම සිදුවීමෙන් වුවද වධක චිත්තය කරුණා ස්වභාවයෙන්ද පහල විය හැකිය.*

## 4. උත්තරිමනුස්සධම්ම පාරාජිකා

**යෝ පන භික්ඛු අනභිජානං උත්තරිමනුස්සධමං අත්තූපනායිකං අලමරිය ඤාණදස්සනං සමුදාචරෙය්‍යඃ 'ඉති ජානාමි, ඉති පස්සාමි'ති, තතෝ අපරේන සමයේන සමනුග්ගාහියමානෝ වා අසමනුග්ගාහියමානෝ වා ආපන්නෝ සුද්ධාපෙක්ඛෝ ඒවං වදෙය්‍යඃ 'අජානමේවං ආවුසෝ අවචං ජානාමි, අපස්සං පස්සාමි' තුච්ඡං මුසාවිලපින්ති. අඤ්ඤත්‍ර අධිමානාඃ අයම්පි පාරාජිකෝ හෝති අසංවාසෝ**

*යම් කිසි භික්ෂුවක් සිය සනත්හි නුපන්නාවූ (අයසමාගඥානදශනය ඇතිකරන සුළු) උත්තරිමනුෂ්‍යධර්ම තමා කෙරෙහි ඇතැයි ද එය මේ කාරණයෙන් දනිමි, මේ කාරණයෙන් දකිමියි ප්‍රකාශ කරයි. එපමණකින් ආපත්තියට පැමිණියාවූ ඒ භික්ෂුව නැවත පිරිසිදුබව කැමතිව පසුකලෙක (අනෙකෙකු විසින්) විචාරණු ලැබුව ද නොලැබුව ද මම උතුරු මිනිස් දම් නොදැනම දනිමියි, නොදැකම දකිමියි , නිස්සාර බොරු කීම් යැයි කියා ද, අධිමානයෙන් තොරව කියන්නාවූ ඒ මහණ පරිජිවූයේ වෙයි. (පියවි මහණුන් සමඟ) සහවාසයට නුසුදුස්සෙක් ද වෙයි.*

**උපමාව**

මතථකවජිනන තාලො මුදුන සිදුනු තල් ගසක් මෙනි

## අර්ථ

| | |
|---|---|
| අනභිජානං | තමාගේ සන්තානයෙය් නූපන් |
| උත්තරි මනුස්ස ධම්ම | ඣාන, විමොක්ඛ, සමාධි, සමාපත්ති, ඤාණදර්ශන, මග්ගභාවනා, ඵලසච්ඡිකිරියා, කිලෙසප්පහාණ, විනීවරණතා චිත්තස්ස සුඤ්ඤාගාරෙ අභිරති |
| අලමරිය ඤාණදස්සන | කෙලෙස විධ්වංශනයට සමර්ථ වූ ආර්යයන්ගේ ඥානදර්ශනය |
| අඤ්ඤත්‍ර අධිමානා | අධිමානයෙන් තොරව |
| අත්තූපනායිකා | උතුරු මිනිස්දම් තමා කෙරෙහි විද්‍යමාන යැයි ආරෝපනය කොටගැන්ම |
| අනුල්ලපනාධිප්පායස්ස | හුවා දැක්වීමේ අදහසක් නැතිව |

## අංග

උතුරුමිනිස් දම් තමා තුල නැතිබව
මිනිසකුට කීම
වටින් ගොඩින් නොව ඍජු ලෙස කීම
අසන්නා මිනිසකුම වීම
පසුව නොව එකෙණෙහිම දැනගැනීම

## ආපත්ති

'මම ප්‍රථම ධ්‍යානයට(ද්‍විතිය/තතිය/චතුත්ථ) සමවදිමි/ සමවැදීමි' කී විට පරිජි වේ.
'මම ප්‍රථම ධ්‍යාන ලාභියෙක්/ මා හට ප්‍රථම ධ්‍යානය ඇත' ආදී ලෙස කීමෙන් පරිජි වේ.
'මා හට සොවාන් (සකදාගාමී/අනාගාමී/අරහත්)ඵලය ඇත' හෝ ඒ හා සමාන වචනවලින් කීවිට පරිජි වේ.
'මගේ සිත රාගයෙන්(ද්වේශයෙන්/මෝහයෙන්) මිදුනෙමි' කීවිට පරිජි වේ.

- ඉහත සියල්ලෙහිදී අසන්නා තේරුම් නොගතහොත් ථුලැසි වේ.

'යමෙක් ඔබගේ විහාරයේ වාසය කරයිද ඔහු ධ්‍යාන මාගඵල ලාභියෙක්' ආදී පරියායෙන් කීවිට ථුලැසි වේ.

- මෙහිදී අසන්නා තේරුම් නොගතහොත් දුෂ්කට වේ.

පණිධාය චංකමති - ගරු බුහුමන් පතා ඇවිදීම, ඉරියව් පැවැත්වීම ආදියෙන් දුෂ්කට වේ.

## අනාපත්ති

අධිමානයෙන් කීමෙන්

අනුලලපනාධිපපායසස - හුවා දැක්වීමේ අදහසක් නැතිව

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ඨ/ ආදිකම්මික

- මෙම පාරාජිකාව වචනයෙන් කීමෙන්/ ඇඟවීමෙන් යන දෙයාකාරයෙන්ම සිදුවේ.
- මෙම පාරාජිකාව මනුස්සයෙකුටම කීමෙන්/ ඇඟවීමෙන් සිදුවේ.

## සප්තදසාකාරය

| | | |
|---|---|---|
| *නිදානය* | :- | වෙසාලියයි |
| *පුග්ගල* | :- | වගගුමුදාතිරිය භික්ෂූන් |
| *වස්තුව* | :- | උතතරිමනුසසධමමාරොචනයයි |
| *පඤ්ඤත්තිය* | :- | යො පන භිකඛු...-පෙ- අසංවාසො |
| | | අඤඤත්‍ර අධිමානා අනුප්‍රඥපති වේ |
| *ආණත්තිය* | :- | අනාණතතික යි |
| *ආපත්තිය* | :- | 'මම ප්‍රථම ධ්‍යානයට සමවදිමි' |
| | | අසන්නා තේරුම් නොගතහොත් ථුල්ලැසි |
| | | අසන්නා තේරුම් ගතහොත් පරිජි |
| *අනාපත්තිය* | :- | අධිමානෙන ආරොචෙනතසස, අනුලලපනාධිපපායසස |
| | | උමමතතක, ඛිතතචිතත, වෙදනටඨ, ආදිකමමික |
| *විපත්තිය* | :- | ශීල විපත්තිය යි |
| *අංග* | :- | උතුරුමිනිස් දම් තමා තුල නැතිබව<br>පාපිච්ඡාවෙන් ආරොචනය<br>වටින් ගොඩින් නොව සෘජු ලෙස කීම<br>අසන්නා මිනිසකුම වීම<br>පසුව නොව එකෙණෙහිම දැනගැනීම |
| *සමුට්ඨාණ* | :- | අදින්නාදාන සමුටඨානයි |

| | | |
|---|---|---|
| *කිරිය* | :- | ක්‍රියා වශයෙනි |
| *සඤ්ඤා* | :- | සඤ්ඤා විමොකඛ යි |
| *චිත්ත* | :- | සචිතතක යි |
| *වජ්ජ* | :- | ලොකවජජ යි |
| *කම්ම* | :- | කාය වචී කර්මයි |
| *කුසලත්‍රිකය* | :- | අකුසල යි |
| *වේදනාත්‍රිකය* | :- | ත්‍රිවෙදනා යි |

## සූවිසි පාරාජිකා

| | |
|---|---|
| භිකෂූන්ට හා භික්ෂුණීනිට සාධාරණ | 04 |
| භික්ෂුනීන්ට සාධාරණ | 04 |
| ඒකාදස අභව්‍ය පුද්ගලයෝ | 11 |
| විබභනත (ගිහිබව ගැනීමේ අදහසින් සිවුරු ගැලවූ භික්ෂුනිය) | 01 |
| ලම්භි | 01 |
| මුදු පිට්ඨිකො | 01 |
| පරසස අංගජාතං මුඛෙන ගණහාති | 01 |
| පරසස අංගජාතෙ අභිනිසීදති | 01 |
| | 24 |

### භික්ෂුනීන්ට සාධාරණ

උබභජානුමණඩලිකා — කාය සංසගග රාගයෙන් යුත් භික්ෂුණියක එබඳුම කාය සසගග රායෙන් යුත් පුරුෂයකුගේ අකු ඇටයෙන් යට දණ මඩලෙන් උඩ හා වැලමිටින් උඩ පෙදෙස්හි කාය සංසර්ගය ඉවසීම.

වජජ පටිචඡාදිකා — අන්‍ය භික්ෂුණියකගේ පරිජි ඇවතක් දැක එය සැගවීම.

උකඛිතතානුවතතුකා — උක්ඛෙපනීය කර්මය ලද භික්ෂුවකගේ පක්ෂය දෘෂ්ටි වශයෙන් ගැනීම

අටඨවතථුකා

කාය සංසර්ගයෙන් යුක්තව මිනිස් පිරිමියකුගේ අත ගැන්ම
සගල සිවුරු කොන ගැන්ම
කාය සංසර්ග පිණිස අත්පස්හි සිටීම
අත්පස්හි සිට බිණීම
පුරුෂයා කී තැනට යාම
පුරුෂයාගේ ආගමනය ඉවසීම
මුවා තැනකට පිවිසීම

කාය සංසර්ගය පිණිස කය එළවීම

යන අට ආකාරයෙන් එක් කාරණයකින් එළඹීම.

- යථාපුරේ තථා පචජා - පෙර ගිහිබව යම්සේද දැනුදු එසේමය
- පාරාජිකො - ශාසනයෙන් ගිලිහුණා/ පරාජයට පත්වුණා/ චුතවුණා
- අසංවාසො - අනෙකුත් ප්‍රකෘති භික්ෂූන් වහන්සේලා සමග උපෝසථ ආදී විනය කර්ම වලට සහභාගීවීමෙක් නැත.සහවාසයට නුසුදුසුය.
- ඡෙජජගාමිණී ඇවැත් - නැවැත නැගීසිටිය නොහැකි බැවින් සතර පාරාජිකාව මෙසේද හැඳින්වේ.

# සංඝාදිසේස (13)

සංඝො ආදිම්හි චෙව සෙසෙ ච ඉච්ඡිතබ්බො අස්සා'ති සංඝාදිසෙසො

මේ ඇවැත් සමූහයෙන් පිරිසිදු වීම සඳහා මුලදී පිරිවෙස් සමාදන්වීම් සංඛ්‍යාත ආදියටත්, මැදදී මානත් දීමට මූලාය පටිකස්සනය කිරීමට සුදුස්සන්ට ඒ සඳහාත්, අගදී අබ්භාහන විනය කර්මයටත් සංඝයා ලැබිය යුතු හෙයින් සංඝාදිසේස නම් වේ.

## 5. සුක්කවිසට්ඨි ශික්ෂාපදය

**සඤ්චේතනිකා සුක්කවිසට්ඨි අඤ්ඤත්‍ර සුපිනන්තා සංඝාදිසේසෝ.**

***සිහිනයක දී විනා දැන දැන ශුක්‍ර මුදන මහණහට සඟවෙසෙස් නම් ඇවත වෙයි.***

### අර්ථ

සංචෙතනිකා  මෝචන ආශ්වාද චේතනාව

සුක්කවිසට්ඨි  සුකුරු ධාතුව පිටවීම

අඤ්ඤත්‍ර සුපිනන්තා සිහිනයකදී හැර

<u>සුකුරු ධාතු මුදවන ක්‍රම</u> (04)

අඣජතත රූප  අභ්‍යන්තර රූපයේ ගටා මිදීම

බහිද්ද රූප  භාහිර රූපයේ ගටා මිදීම

අඣජතත බහිද්ද රූප  අභ්‍යන්තර භාහිර රූපයේ ගටා මිදීම

ආකාසෙ කටි කම්පන  ඉන ආදී ලෙස සොලවා හිස් ආකාසෙ ගටා මිදීම

### ආපත්ති

| | | | |
|---|---|---|---|
| චෙතෙති-සිතයි | උපක්කමති - උපක්‍රම කරයි | මුච්චති - මිදෙයි | සංඝාදිදේස |
| චෙතෙති | උපක්කමති | න මුච්චති | ථුල්ලච්චය |
| චෙතෙති | න උපක්කමති | මුච්චති | අනාපත්ති |
| න චෙතෙති | උපක්කමති | න මුච්චති | අනාපත්ති |
| චෙතෙති | න උපක්කමති | න මුච්චති | අනාපත්ති |

අනිකකුගේ ලිංගය ඇල්ලීම නිසා තමාට මෝචනය වීම දුකකට

**අනාපත්ති**

අනුපකකමනතසස අංගජාතයේ උපක්‍රම නොකොට වෙන ක්‍රමයකින් පිටවීම

අමොචනය සුකුරු මිදීමේ අදහසක් නැතිව

සුපිනං සිහිනවලදී

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ට/ ආදිකම්මික

**අංග**

මෝචනය කරන චේතනාව

උපක්‍රමය

මෝචනය

## 6. කාය සංසග්ග ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ඔතිණ්ණෝ විපරිණතේන චිත්තේන මාතුගාමේන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය, හත්ථගාහං වා වේණිගාහං වා අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අංගස්ස පරාමසනං, සඞ්ඝාදිසේසෝ.**

*යම් භික්ෂුවක් රාගයෙන් පෙරළී ගිය සිතින් අතිනත ගැනීම කෙහෙ අල්ලා ගැනීම හා අවයවයන් පරාමශනය කිරීම වශයෙන් ස්ත්‍රියක හා කයින් කය ස්පර්ශ කෙරේයි ද (ඔහු හට) සංඝවෙසෙස් ඇවැත් වෙයි.*

**අර්ථ**

ඔතිණෙණා රාගයට බැසගත් සිතින්

මාතුගාමෙන සදධිං එදවස උපන් දැරියගේ පටන් ජීවමාන මනුෂ්‍ය ස්ත්‍රියක්

හතථගාහංවා අත ඇල්ලීම

වෙණිගාහංවා ගොතන ලද කෙස් වැටිය

**අංග**

මිනිස් කාන්තාවක් වීම

කාන්තාවක්ය යන හැඟීම

සිරුර අල්ලන රාගය

ඒ රාගයෙන් උත්සාහ කිරීම

අත් ආදිය ඇල්ලීම

## ආපත්ති

ස්ත්‍රියක සිටියදී ස්ත්‍රියක යන හැඟීමෙන් රාග සිතින්
භික්ෂුවක් කයින් එක කෙස් ගසක් හෝ ලෝමයක් ස්පර්ෂ කලේ නම්
සංඝාදිසේස

ස්ත්‍රියක සිටියදී
ස්ත්‍රියකද, පණ්ඩකයද, පුරුෂයකද, තිරිසනකද යන සැකයෙන් කය ස්පර්ෂ කිරීම
ථුල්ලැසි

කායපටිබද්ධයෙන් කය ස්පර්ෂ කිරීම ථුල්ලැසි

කායපටිබද්ධයෙන් කායපටිබද්ධය ස්පර්ෂ කිරීම දුෂ්කට

නිස්සග්ගියෙන් (ගල් කැට ආදිය විසිකිරීමෙන්) දුෂ්කට

පිරිමියකු, තිරිසනකු, ස්ත්‍රියක, පණ්ඩකයකු යන හැඟීමෙන් සිරුර ඇල්ලීමෙන්
දුෂ්කට

පිරිමියකු යන සැකයෙන් සිරුර ඇල්ලීමෙන් දුෂ්කට

ස්ත්‍රියක නැග සිටින අත්තක් සෙලවීමෙන් දුෂ්කට

## අනාපත්ති

පාත්‍ර ආදිය පිළිගැනීමේදී ස්ත්‍රියකගේ අත් කෙස් ආදිය ස්පර්ෂ වනවිට

භික්ෂුව අතපය දිගහරිනවිට ස්ත්‍රී සිරුරක ස්පර්ෂ වීම

ස්ත්‍රියක් ස්පර්ෂ කරද්දී භික්ෂුව ආශ්වාදයක් නොවිද සිටීම

ස්ත්‍රියක් ස්පර්ෂ කරද්දී භික්ෂුව කයින් වෑයම් නොකර සිටී

බේරීමේ අදහසින් තල්ලු කිරීම

නොදැන නොසිහියෙන්

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ට/ ආදිකම්මික

## 7. දුට්ඨුල්ලාවාචා ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ඕතිණ්ණෝ විපරිණතේන චිත්තේන මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඕභාසෙය්‍ය, යථා තං යුවා යුවතිං මේථුනූපසංහිතාහි, සඞ්ඝාදිසේසෝ.**

*යම් භික්ෂුවක් රාගයෙන් පෙරළී ගිය සිතින් තරුණයෙකු තරුණියකට මෛථුන සන්නිශ්‍රිතව කරන කථාවක්මෙන් යම් ස්ත්‍රියකට (ඇගේ වසමග පසමග පිළිබඳව) අසභ්‍ය ව්‍යවහාරයෙන් කථාකරයි නම් (ඔහු හට) සඟවෙසෙස් ඇවැත් වෙයි.*

### අර්ථ

| | |
|---|---|
| දුට්ඨුල්ලාවාචා | වස මග, පස මග, මෛථුන ධම්ම ගැන අසැබි කතා |
| මාගම | සභ්‍ය අසභ්‍ය තේරුම් ගතහැකි ස්ත්‍රියක් |

### අංග

මිනිස් ස්ත්‍රියක වීම

ස්ත්‍රියක යන හැඟීම ඇතිබව

අසභ්‍ය වචන කතාකිරීමේ රාගය ඇතිබව

ඒ රාගයෙන් අසභ්‍ය වචන කතාකිරීම

එකෙණෙහිම ඇය තේරුම්ගැනීම

### ආපත්ති

ස්ත්‍රියකගේ වසපග පසමග ගැන(මෛථුන නිශ්‍රිත ගුණ හෝ අගුණ) කතා කිරීම හා ඇසූ කෙනා දැනගැනීම **සංඝාදිසේස**

ඇසූ කෙනා තේරුම් නොගතහොත්
**ථුල්ලැසි**

වචන ගණනට ස්ත්‍රීන් ගණනට ඇවැත් වේ

ස්ත්‍රියගේ අකු ඇටයෙන් පහළ දණ මඩලෙන් ඉහළ වෙනත් අවයව ගැන කතාකිරීම
**ථුල්ලැසි**

පණ්ඩක අයගේ වසමග ගැන කතා කිරීම
**ථුල්ලැසි**

අකු ඇටයෙන් ඉහළ දණ මඩලෙන් පහළ ගැන කතා කිරීම
**දුෂ්කට**

පණ්ඩක අයගේ වෙනත් අවයව ගැන කතා කිරීම
**දුෂ්කට**

**අනාපත්ති**

කියාදීමේ අර්ථයෙන්

පෙළ අටඨකතා කියවීමේදී එම වචන භාවිතය

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ට/ ආදිකම්මික

## 8. අත්තකාම පාරිචරිය ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ඕතිණ්ණෝ විපරිණතේන චිත්තේන මාතුගාමස්ස සන්තිකේ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසෙය්‍යඃ 'ඒතදග්ගං භගිනි! පාරිචරියානං යා මාදිසං සීලවන්තං, කල්‍යාණධම්මං බ්‍රහ්මචාරිං ඒතේන ධම්මේන පරිචරෙය්‍යාති. මේථුනූපසංහිතේන, සඞ්ඝාදිසේසෝ.**

*යම් භික්ෂුවක් රාගයෙන් පෙරළී ගිය සිතින් "නැගනියනි සිල්වත් වූ යහපත් ගතිගුණ හා බඹසර ඇත්තාවූ මා වැන්නකුට මෛථුන ධමයෙන් උවටැන් කෙරේනම් එය උපස්ථානයන් අතර ශ්‍රේෂ්ඨ යැ"යි ස්ත්‍රියක් හමුවෙහි තමාහා මෛථුන්දම් සෙවීමේ අනුසස් ප්‍රකාශ කරන්නේ ද (ඔහු හට) සඟවෙසෙස් නම් ඇවැත් වෙයි.*

**අර්ථ**

| | |
|---|---|
| මාතුගාම | සහා අසහා තේරුම් ගතහැකි ස්ත්‍රියක් |
| අතතකාමපාරිචරිය | මෛථුන නිශ්‍රිත ඉල්ලීමේ කතා |

**අංග**

මිනිස් ස්ත්‍රියක වීම

ස්ත්‍රියක යන හැඟීම

භික්ෂුව මෛථුන රාගයෙන් යුත් බව

ඒ රාගයෙන් මෛථුන සංග්‍රහයේ ගුණ කීම

ස්ත්‍රිය එකෙණෙහිම දැනගැනීම

**ආපත්ති**

ස්ත්‍රියකට කයින් හෝ වචනයෙන් මෛථුනයෙහ් උපස්ථාන කිරීමේ ගුණ කීමෙන් සංඝාදිසේස

| | |
|---|---|
| එම කියූදෙය ස්ත්‍රියට නොතේරුණේ නම් | ථුල්ලැසි |
| පණ්ඩකයකුගෙන් මෛථුනයා ඉල්ලීමෙන් | ථුල්ලැසි |
| පණ්ඩකට නොතේරුනේ නම් | දුෂ්කට |
| පුරුෂ ආදී අනෙකුත් අයගෙන් මෛථුනය ඉල්වීමෙන් | දුෂ්කට |

**අනාපත්ති**

ඇසූවිට 'සිවුපසයෙන් උපස්ථාන කරන්නැ'යි කීමෙන්

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ඨ/ ආදිකම්මික

## 9. සඤ්චරිත්ත ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං, ජායත්තනේ වා ජාරත්තනේ වා අන්තමසෝ තංඛණිකායපි, සඞ්ඝාදිසේසෝ.**

*යම් භික්ෂුවක් (ස්වීර අඹුසැමි බවකින් හෝ සොර අඹුසැමි බවකින් යුතු) ස්ත්‍රියකගේ කැමැත්ත පුරුෂයාට ද පුරුෂයාගේ කැමැත්ත ස්ත්‍රිය වෙත ගෙනයයි නම් යටත් පිරිසෙයින් එකෙනෙහි රමණය කරනු කැමති ස්ත්‍රී පුරුෂයන්ගේ හෝ අදහස් ඔවුනොවුන් අතර ගෙනයන්නේ නම් (ඔහු හට) සංඝාදිසේස ආපත්තිය වෙයි.*

**අර්ථ**

| | |
|---|---|
| සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය | ආවාහ විවාහ වනු කැමමති ස්ත්‍රී පුරුෂයන්ගේ පණිවුඩ හුවමාරුව |

| | |
|---|---|
| ජායතතනෙවා | නිබද භාර්යා පිණිස |
| ජාරතතනෙවා | අනියම් භාර්යා පිණිස |
| අන්තමසෝ තංඛණිකාය'පි | එම මොහොතේ අභිරමණයට කැමති |
| සම්පූර්ණයෙන්ම වෙන්වූ අය | අලංවචනීයෝ |
| තාවකාලිකව වෙන්වූ අය | නාලංවචනීයෝ |

- අලංවචනීයත්වයෙන් වෙන්වූ දෙමාපියන් පවා එක්කිරීම සඝවෙසෙස් වේ.

**අංග**

මනුෂ්‍යයන් වීම
දික්කසාද වූ බිරිඳක් වීම
යෝජනාව පිළිගැනීම
විමසීම
පිළිතුර ආපසු ගෙනගොස් පැවසීම

**ආපත්ති**

| පතිගණ්හාති(පණිවිඩය පිළිගැනීම) | වීමංසති(එය පිළිබද සොයාබැලීම) | පච්චාහරති(එහි ප්‍රතිඵලය නැවත දැන්වීම) | සංඝාදිසේස |
|---|---|---|---|
| පතිගණ්හාති | වීමංසති | න පච්චාහරති | ථුල්ලච්චය |
| න පතිගණ්හාති | වීමංසති | පච්චාහරති | ථුල්ලච්චය |
| න පතිගණ්හාති | වීමංසති | න පච්චාහරති | දුක්කට |

- කරුණු 01ක යෙදීම දුක්කට
- කරුණු 02ක යෙදීම ථුල්ලච්චය

**අනාපත්ති**

සංඝයාගේ, චෛත්‍යයක හෝ ගිලන් අයකුගේ කටයුත්තකට

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ට/ ආදිකම්මික

## 10. කුටිකාර ශික්ෂාපදය

**සඤ්ඤාචිකාය පන භික්ඛුනා කුටිං කාරයමානේන අස්සාමිකං අත්තුද්දේසං පමාණිකා කාරේතබ්බා, තත්‍රි'දං පමාණං: දීඝසෝ ද්වාදස විදත්ථියෝ සුගතවිදත්ථියා, තිරියං සත්තන්තරා. භික්ඛූ අභිනේතබ්බා වත්ථුදේසනාය, තේහි භික්ඛූහි වත්ථුං දේසේතබ්බං අනාරම්භං සපරික්කමනං. සාරම්භේ චේ භික්ඛු වත්ථුස්මිං අපරික්කමණේ, සඤ්ඤාචිකාය**

**කුටිං කාරෙයස, භික්ඛු වා අනභිනෙයස වත්ථුදේසනාය, පමාණං වා අතික්කාමෙයස, සඞ්ඝාදිසේසෝ.**

*තමන් සඳහාවූ ද කරවාදෙන දායකයන් නැත්තාවූ ද (එහෙයින්ම) ඉල්ලාගත් වෑ පොරෝ ආදිය ඇතිව කුටියක් කරවනු කැමති භික්ෂුව විසින් එය ප්‍රමාණවත් ලෙස කරවිය යුත්තේය. මේ එහි ප්‍රමාණයයි: දිගින් සුගත් වියතින් දොළොස් වියතකි. පළලින් (භිත්ති හැර) ඇතුළත සුගත් වියතින් සත් වියතකි. කුටි බිම දෙසීම පිණිස භික්ෂූහු කැඳවිය යුත්තාහ. ඒ භික්ෂූන් විසින් ද උපද්‍රව රහිතව උපචාර සහිතව කුටි බිම දෙසිය යුත්තේය. යම් භික්ෂුවක් උපද්‍රව සහිතව උපචාර රහිතව ඉල්ලාගත් වෑ පොරෝ ආදියෙන් කුටියක් කරවන්නේ ද කුටිබිම නොකැඳ වන ලද්දාහු ද එසේම ප්‍රමාණය ද ඉක්මවා නම් (ඔහු හට) සඟවෙසෙස් වෙයි.*

**අර්ථ**

සඤ්ඤාචිකාය — තමන් ඉල්ලාගත් වෑ පොරෝ ආදියෙන්

අනාරම්භං — උපද්‍රව නැතිබව

සපරික්කමණං — උපචාර සහිත බව - ගොන් දෙදෙනකු යොදන ලද ගැලක් කුටිය සිසාරා ගමන් කල හැකිවිය යුතුය.

සුගතවිදත්ථියා — සුගත වියත - මැදුම් පුරුෂයකුගේ අතින් රියන් 1 1/2 (දැන් මැදුම් පුරුෂයකුගේ අතින් රියන් 3)

( කුටිය සුගත් වියත් 12* 07 අතර විය යුතුය - කුඩාම ප්‍රමාණය 12* 04 අතර විය යුතුය)

**කුටි**

උල්ලිත්තා — ඇතුලත පමණක් පිරියම් කල

අවලිත්තා — පිටත පමණක් පිරියම් කල

උල්ලිත්තාවලිත්තා — ඇතුලත හා පිටත පිරියම් කල

- දහයියා පුළුස්සා හෝ එසේම ගත් කුඩු හෝ මැටි සමග කවලම් කර පිරියම් කල හැකිය. සුදුහුණු පිරියම් කිරීම එම බිත්තිය මත කරනු ලබයි.

**ආපත්ති**

කුටි වස්තුව නොදෙසා ප්‍රමාණය ඉක්මවා කුටියක් කිරීමේදී හෝ කරවීමේදී ප්‍රයෝගයක් පාසා දුක්කට

පිරියම් කිරීමේදී කුටිය අවසන් කිරීමට අවසන් මැටි පිඩට පෙර මැටි පිඩ තැබීමේදී ථුල්ලච්චය

අන්තිම මැටි පිඩ තැබීමේදී
සංඝාදිසේස

**අනාපත්ති**

භාගෙට නිමකල කුටිය අනෙකකුට දීමෙන්

තම වාසය සඳහා නොව අනෙකකු සඳහා

කුටිය පොලවටම සමතලා කිරීමෙන්

ලෙන්, ගුහා, තෘණ කුටි, උපෝසථාගාර ආදී පොදු තැන්

**අංග**

උල්ලිතතාදී කුටි තුනෙන් එකක් වීම
කුඩාම ප්‍රමාණයවත් තිබීම
කුටිබිම අනුමත කරවා නොගැනීම
ලොකුම ප්‍රමාණයට වඩා කෙසගසක අග තරම්වත් ප්රමාණයක් ඉක්මවීම
තමා වෙනුවෙන් කරන කුටියක් වීම
තමාගේ වාසය පිණිස කුටියක් කිරීම
අවසන් ලේපය තැබීම

## 11. විහාරකාර ශික්ෂාපදය

**මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානේන සස්සාමිකං අත්තුද්දේසං භික්ඛූ අභිනේතබ්බා වත්ථු දේසනාය, තේහි භික්ඛූහි වත්ථුං දේසේතබ්බං අනාරම්භං සපරික්කමනං. සාරම්භේ චේ භික්ඛු වත්ථුස්මිං අපරික්කමනේ මහල්ලකං විහාරං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදේසනාය, සඞ්ඝාදිසේසෝ.**

*තමන් සඳහාවූ ද කරවාදෙන දායකයන් ඇත්තාවූ ද ලොකු විහාරයක් කරවනු කැමති භික්ෂුව විසින් විහාරබිම දෙසීම සඳහා භික්ෂූහු කැඳවිය යුත්තාහ. ඒ භික්ෂූන් විසින් ද උපද්‍රව රහිතව උපචාර සහිතව විහාරබිම දෙසිය යුත්තේය. යම් භික්ෂුවක් උපද්‍රව සහිතව උපචාර රහිතව ලොකු විහාරයක් කරවන්නේ නම් විහාරවස්තුව දෙසීම පිණිස භික්ෂූහු ද නොකැඳවනු ලද්දාහු නම් (ඔහු හට) සංඝාදිසේසාපත්තිය වෙයි.*

ආපත්ති අනාපත්ති පෙර ශික්ෂාපදය පරිදිමය.

## 12. පඨම දුට්ඨදෝෂ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුං දුට්ඨෝ දෝසෝ අප්පතීතෝ අමූලකේන පාරාජිකේන ධම්මේන අනුද්ධංසෙය්‍ය: අප්පේ’ව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්’ති. තතෝ අපරේන සමයේන සමනුග්ගාහියමානෝ වා අසමනුග්ගාහියමානෝ වා අමූලකඤ්චේ’ව තං අධිකරණං හෝති, භික්ඛු ච දෝසං පතිට්ඨාති, සඞ්ඝාදිසේසෝ.**

*යම් භික්ෂුවක් භික්‍ෂුවක් කෙරෙහි කිපියේ නොසතුටු වූයේ දුෂ්ඨ වූ සිත් ඇත්තේ ඒ මහණ සස්නෙන් නෙරපා දමන්නෙම් නම් යෙහෙකැයි සිතා අමූලික වූ පරිජි ඇවතකින් චෝදනා කරයි. ඉක්බිති පසු කලෙක කිසිවෙකු විසින් විනිශ්චය කරනු ලැබුව ද නොලැබුව ද ඒ චෝදනාව හේතු රහිතවූවක් වෙයි නම් එමෙන්ම චෝදක භික්ෂුවද (තමා විසින්ම) දෝෂයෙහි පිහිටා නම් (ඔහු හට) සඟාවෙසෙස් ඇවැත් වෙයි.*

### අර්ථ

| | |
|---|---|
| දුටෙඨාදොසො | එකම පුද්ගලයකුගේ ආකාර නානාත්වය |
| අපපතීතො | ප්‍රීති සුඛ ආදියෙන් අපගත වූයේ |
| අමූලකෙන පාරාජිකෙන ධමෙමන | බොරුවට(මුල්නැති) චූදිත භික්ෂුව පාරාජිකා යැයි නොදැක(අදිටඨ) නොඅසා(අශ්‍රැත), සැකයකින් තොරව(අපරිසංකිත) චෝදනා කිරීම. |
| අනොකාසං කාරාපෙතවා | චෝදනා කිරීමට භික්ෂුවගෙන් අවසර නොගෙන |

### අංග

චූදිතකයා උපසම්පදා භික්ෂුවකි යන පිළිගැනීම ඇතිබව
චෝදනා කරන භික්ෂුවට චෝදනාව ලබන්නා පාරාජිකා වී නැතැයි යන හැඟීම ඇතිබව
මූලයක් නැතිව චෝදනා කිරීම
පැවිද්දෙන් නෙරපන අදහසින් ඉදිරිපිටදී චෝදනා කිරීම
චෝදනාව ලබන්නා එකෙණෙහිම චෝදනාව තේරුම් ගැනීම

### ආපත්ති

භික්ෂුවකට ද්වේෂ සහගත සිතින් සාසනයෙන් නෙරපීමේ අදහසින් එම එම භික්ෂුව ඉදිරියේම චෝදනා කලවිට (චාවනාදිපපායේන) සංඝාදිසේස වේ.

වෙනත් කෙනෙකුන් ලවා කරවීමේදීද සංඝාදිසේස වේ.

බැනීමේ අදහසින් කරනවිට(අකෙකාසාදිපපායෙන) පචිති වේ.

අවසර නොගෙන චෝදනා කිරීමේදී දුෂ්කට වේ.

**අනාපත්ති**

මූලයක් ඇතිව චෝදනා කිරීමෙන්

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ට/ ආදිකම්මික

**13.දුතිය දුට්ඨදෝෂ ශික්ෂාපදය**

**යෝ පන භික්ඛු භික්ඛුං දුට්ඨෝ දෝසෝ අප්පතීතෝ අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චි දේසං ලේසමත්තං උපාදාය පාරාජිකේන ධම්මේන අනුද්ධංසෙය්‍ය: අප්පේව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති. තතෝ අපරේන සමයේන සමනුග්ගාහියමානෝ වා අසමනුග්ගාහියමානෝ වා අඤ්ඤභාගියඤ්චේව තං අධිකරණං හෝති, කෝචි දේසෝ ලේසමත්තෝ උපාදින්නෝ භික්ඛු ච දෝසං පතිට්ඨාති, සඞ්ඝාදිසේසෝ.**

*යම් භික්ෂුවක් භික්ෂුවක් කෙරෙහි කිපියේ නොසතුටුවූයේ දුෂ්ඨ වූ සිත් ඇත්තේ ඒ මහණ සස්නෙන් නෙරපා දමන්නෙම් නම් යෙහෙකැයි සිතා ලේසමාත්‍රයක් ගෙන (තිරිසන් ආදී සතකු පිළිබඳ වූ ආපත්තියට හේතුවන දෙසීම පිණිස භික්ෂූහු ද කාරණයක් ආරෝපනය කොට) පරිජි ඇවතකින් චෝදනා කරයි. ඉක්බිති පසු කලෙක කිසිවෙකු විසින් විනිශ්චය කරනු ලැබුව ද නොලැබුව ද ඒ චෝදනාව තිරිසනුන් පිළිබඳ වූවක් බවත් ආරෝපිත වූවක් බවත් පැහැදිලි වෙයි නම් එමෙන්ම චෝදක භික්ෂුවද (තමා විසින්ම) වරදෙහි පිහිටා නම් (ඔහු හට) සඟාවශෙස් ඇවැත් වෙයි.*

**අර්ථ**

අඤඤභාගියසස — දබබමලලපුතත රහතන් වහන්සේට එළුවෙක් හා මෙත්තියා භික්ෂුණියට එළුදෙනක් ආදේශ කර සංවාසයේ යෙදෙනු දුටුබව කීම හෙවත් මනුෂ්‍ය ජාතියෙන් වෙනස් වූ භික්ෂු ජාතියෙන් වෙනස් වූ අය ආදේශ කර චෝදනා කිරීම.

කිඤ්චි දෙසං ලෙස මතතං උපාදාය

ලෙසය (දසප්‍රකාර)එයින් එකක් හෝ වැඩියක් ගෙන චෝදනා කිරීම

ජාති ලෙසය

ගොතත ලෙසය

ආපතති ලෙසය
චීවර ලෙසය
ආචරිය ලෙසය
නාම ලෙසය
ලිංග ලෙසය
හතත ලෙසය
උපජඣාය ලෙසය
සෙනාසන ලෙසය

## අංග

චූදිතකයා උපසම්පදා භික්ෂුවකි යන පිළිගැනීම ඇතිබව
චෝදනා කරන භික්ෂුවට චෝදනාව ලබන්නා පාරාජිකා වී නැතැයි යන හැඟීම ඇතිබව
ලේශමාත්‍රයන් චෝදනා කිරීම
පැවිද්දෙන් නෙරපන අදහසින් ඉදිරිපිටදී චෝදනා කිරීම
චෝදනාව ලබන්නා එකෙණෙහිම චෝදනාව තේරුම් ගැනීම

## ආපත්ති

සාසනයෙන් නෙරපීමේ අදහසින් ඉහත දැක්වූ දස ලේස අතරින් යමකින් භික්ෂුවකට චෝදනා කිරීමේදී සංඝාදිසේස වේ.

| | |
|---|---|
| අමූලක පාරාජිකා චෝදනා | සංඝාදිසේස |
| අමූලක සංඝාදිසේස චෝදනා | පචිති |
| අමූලක පචිති චෝදනා | දුකකට |

## අනාපත්ති

භික්ෂුවක් සගවෙසෙස් ඇවතකට පත්වෙයි. එය දුටු භික්ෂුවක් ඔහු පාරාජිකා ඇවතකට පත් වී ඇතැයි අවංකව සිතයි. එසේ සිතා චෝදනා කරයි හෝ කරවයි නම් හෝ ආපත්ති නොවේ.

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ඨ/ ආදිකම්මික

## 14. සංඝභේදක ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භේදාය පරක්කමෙය්‍ය, භේදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ තිට්ඨෙය්‍ය. සෝ භික්ඛු භික්ඛූහි ඒවමස්ස වචනීයෝ: ‘මා ආයස්මා! සමග්ගස්ස සඞ්ඝස්ස භේදාය පරක්කමි භේදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි. සමේතායස්මා සඞ්ඝේන, සමග්ගෝ හි සඞ්ඝෝ සම්මෝදමානෝ අවිවදමානෝ ඒකුද්දේසෝ ඵාසු විහරතී’ති. ඒවඤ්ච සෝ භික්ඛු භික්ඛූහි වුච්චමානෝ තථේව පග්ගණ්හෙය්‍ය, සෝ භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බෝ තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්ච චේ සමනුභාසියමානෝ තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චේතං කුසලං. නෝ චේ පටිනිස්සජ්ජෙය්‍ය, සඞ්ඝාදිසේසෝ.**

*යම් භික්ෂුවක් සමගි සංඝයාගේ භේදය පිණිස උත්සාහ කරයි ද භේදය පිණිස පවත්නා කාරණයක් හෝ දැඩිව ගෙන සිටියි ද ඒ භික්ෂුවට සෙසු භික්ෂූන් විසින් මෙසේ කිව යුත්තේය. "ඇවැත්නි සමගි සංඝයාගේ භේදය පිණිස උත්සහ නොකරාවා! භේදය පිණිස පවත්නා කාරණයක් හෝ දැඩිව ගෙන නොසිටාවා! ඇවැත්නි! පියවි සංඝයා සමඟ එක්වනු මැනව. ඔවුනොවුන් ප්‍රිය වූ , විවාද රහිත වූ , සමාන පාමොක් උදෙසීම් ඇත්තාවූ, සමගි සංඝයා සුවසේ වාසය කරන්නේ ද එහෙයිනි. මෙසේ පියවි භික්ෂූන් විසින් අවවාද කරන්නාවූ යථෝක්ත භික්ෂුව පෙරසේම දැඩිව සිටියි නම් ඒ දෘෂ්ඨිය දුරුකරනු සඳහා පියවි භික්ෂූන් විසින් තෙවරක් දක්වාම අවවාද දිය යුත්තේය. ඉදින් තෙවැනිවර හෝ හික්මෙනු ලබන්නේ සිය අදහස් හළේ නම් මැනවි. නොහළේ නම් (ඔහු හට) සඟවෙසෙස් ඇවැත් වෙයි.*

**අර්ථ**

| | |
|---|---|
| සමගගසස සංඝසස | සිතින් හා සිරුරින් එකීභූත වීමයි |
| භෙදනසංවතතනිකං වා අධිකරණං | සංඝභේදයට හේතුවන අටලොස් භේදකර වස්තු |

<u>අටලොස් භේදකර වස්තු</u>

අධර්මය ධර්මය යැයි කීම
ධර්මය අධර්මය යැයි කීම
අවිනය විනය යැයි කීම
විනය අවිනය යැයි කීම
තථාගතයන් වහන්සේ දේශනා නොකල දේ දේශනා කලැයි කීම

තථාගතයන් වහන්සේ දේශනා කල දේ දේශනා නොකලැයි කීම
තථාගතයන් වහන්සේ පුරුදු නොකල දේ පුරුදු කලැයි කීම
තථාගතයන් වහන්සේ පුරුදු කල දේ පුරුදු නොකලැයි කීම
තථාගතයන් වහන්සේ නොපැනවූ දේ පැනවූ බව කීම
තථාගතයන් වහන්සේ පැනවූ දේ නොපැනවූ බව කීම
අනාපත්ති ආපත්ති යැයි කීම
ආපත්ති අනාපත්ති යැයි කීම
ලඝු ඇවැත් ගරු ඇවැත් යැයි කීම
ගරු ඇවැත් ලඝු අඇවැත් යැයි කීම
සාවශේස ආපත්ති අනවශේස ආපත්ති යැයි කීම
අනවශේස ආපත්ති සාවශේස ආපත්ති යැයි කීම
දුට්ඨුල්ලාපත්ති අදුට්ඨුල්ලාපත්ති යැයි කීම
අදුට්ඨුල්ලාපත්ති දුට්ඨුල්ලාපත්ති යැයි කීම

- ✓ සංඝභේදය සිදුවීමට නම් භික්ෂූන් වහන්සේලා සතර නමක් සමගි සංඝයාගෙන් වෙන්ව ගොස් එකම සීමාවක් තුල උපෝසථ ආදී විනය කර්ම කල යුතුය.

## අංග

සංඝභේදයට උත්සාහ කිරීම
ධර්මානුකූලව සමනුභාසනය කිරීම
කර්මවාක්‍යය තුන්වර කියා අවසන් වීම
භික්ෂුව සංඝයා බිඳුවන අදහස අත නොහැරීම

## ආපත්ති

| | |
|---|---|
| සමනුභාෂන කර්මයේදී ඤත්තිය තැබීමේදී | දුෂ්කට |
| කර්මවාක්‍යය පළමුවර හා දෙවනවර කීමේදී | ථුලැසි |
| කර්මවාක්‍යය තෙවැනිවර අවසන්වීමේදී | සංඝාදිසේස |

## අනාපත්ති

සමනුභාෂන කර්මය නොකලේ නම්

සමනුභාෂන කර්මය කරනවිට දෘෂ්ඨිය හලේ නම්

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ඨ( මෙහි ආදිකම්මිකයකු නැත)

## 15. දුතිය සංඝභේදක ශික්ෂාපදය

**තස්සේව ඛෝ පන භික්ඛුස්ස භික්ඛූ හොන්ති අනුවත්තකා වග්ගවාදකා, ඒකෝ වා ද්වේ වා තයෝ වා, තේ ඒවං වදෙය්‍යුං: 'මා ආයස්මන්තෝ! ඒතං භික්ඛුං කිඤ්චි අවචුත්ථ, ධම්මවාදී චේසෝ භික්ඛු, විනයවාදී චේසෝ භික්ඛු, අම්හාකඤ්චේසෝ භික්ඛු, ඡන්දඤ්ච රුචිඤ්ච ආදාය වෝහරති, ජානාති නෝ භාසති, අම්හාකම්පේතං ඛමතී'ති. තේ භික්ඛූ භික්ඛූහි ඒවමස්සු වචනීයා: 'මා ආයස්මන්තෝ! ඒවං අවචුත්ථ. න චේසෝ භික්ඛු ධම්මවාදී, න චේසෝ භික්ඛු විනයවාදී. මා ආයස්මන්තානංපි සඞ්ඝභේදෝ රුච්චිත්ථ. සමේතායස්මන්තානං සඞ්ඝේන, සමග්ගෝහි සඞ්ඝෝ සම්මෝදමානෝ අවිවදමානෝ ඒකුද්දේසෝ ඵාසු විහරතී'ති. ඒවඤ්ච තේ භික්ඛූ භික්ඛූහි වුච්චමානා තථේව පග්ගණ්හෙය්‍යුං, තේ භික්ඛූ භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චේ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍යුං ඉච්චේතං කුසලං. නෝ චේ පටිනිස්සජ්ජෙය්‍යුං, සඞ්ඝාදිසේසෝ.**

*යථෝක්ත සංඝභේදයට උත්සහ කරන ඒ භික්ෂුවට පක්ෂවූ , වගවාදී වූ එක් භික්ෂුවක් හෝ දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝ භික්ෂූහු වෙත්. ඒ භික්ෂූහු ද මෙසේ පවසත්: "ඇවැත්නි යථෝක්ත භික්ෂුවට කිසිවක් නොකියවූ. ඔහු විනය වාදීය, ධර්‍ම වාදීය, අපගේ කැමැත්ත ද රුචිය ද ඔහු දනී. (එසේම) කියයි. ඒ අනුව ද ක්‍රියා කරයි. අපගේ අදහස ද එයමය"යි කියත් නම් , පියවි භික්ෂූන් විසින් ඒ භික්ෂූන්ට මෙසේ කිය යුත්තාහු වෙති. "ඇවැත්නි එසේ නොකියවූ යථෝක්ත මහණ අධමවාදීය, අවිනයවාදිය. ඔබ හැම ද සංඝභේදය රුචි නොකරනු මැනව. පියවි සංඝයා සමඟ එක්වනු මැනව. ඔවුනොවුන් ප්‍රිය වූ, විවාද රහිත වූ , සමාන පාමොක් උදෙසීම් ඇත්තාව, සමගි සංඝයා සුවසේ වාසය කරන්නේ ද එහෙයිනි". මෙසේ පියවි භික්ෂූන් විසින් අවවාද කරන්නාවූ යථෝක්ත භික්ෂූහු පෙරසේම දැඩිව සිටිත් නම් ඒ දෘෂ්ඨිය දුරුකරනු සඳහා පියවි භික්ෂූන් විසින් තෙවරක් දක්වාම අවවාද දිය යුත්තාහ. ඉදින් තෙවැනි වර හෝ භික්මෙනු ලබන්නාවූ ඒ භික්ෂූහු සිය අදහස් හළේ නම් මැනවි. නොහළේ නම් (ඔවුනට) සඟවෙසෙස් ඇවැත් වෙති.*

ආපත්ති අනාපත්ති පෙර ශික්ෂාපදය පරිදිමය.

## 16. දුබ්බච ශික්ෂාපදය

**භික්ඛු පනේව දුබ්බචජාතිකෝ හෝති, උද්දේසපරියාපන්නේසු සික්ඛාපදේසු භික්ඛූහි සහධම්මිකං වුච්චමානෝ අත්තානං අවචනීයං කරෝති: 'මා මං ආයස්මන්තෝ! කිඤ්චි අවචුත්ථ, කල්‍යාණං වා පාපකං වා, අහම්පායස්මන්තේ න කිඤ්චි වක්ඛාමි, කල්‍යාණං වා පාපකං වා, විරමථායස්මන්තෝ! මම වචනායා'ති. සෝ භික්ඛු භික්ඛූහි ඒවමස්ස වචනීයෝ: 'මා ආයස්මා! අත්තානං අවචනීයං අකාසි. වචනීයමේවායස්මා අත්තානං කරෝතු, ආයස්මාපි භික්ඛූ වදේතු සහධම්මේන, භික්ඛූපි ආයස්මන්තං වක්ඛන්ති සහධම්මේන, ඒවං සංවද්ධාහි තස්ස භගවතෝ පරිසා යදිදං අඤ්ඤමඤ්ඤවචනේන අඤ්ඤමඤ්ඤවුට්ඨාපනේනා'ති. ඒවඤ්ච සෝ භික්ඛු භික්ඛූහි වුච්චමානෝ තථේව පග්ගණ්හෙය්‍ය, සෝ භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බෝ තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චේ සමනුභාසියමානෝ තං පටිනිස්සජ්ජෙය්‍ය ඉච්චේතං කුසලං. නෝ චේ පටිනිස්සජ්ජෙය්‍ය, සඞ්ඝාදිසේසෝ.**

*යම් කිසි භික්ෂුවක් දුවච ස්වභාව ඇත්තේ වෙයි. සෙසු භික්ෂූන් විසින් ප්‍රාතිමෝක්ෂයෙහි ඇතුළත් ශික්ෂාපදයන්හි පිහිටා අවවාද කරනු ලබන කල්හි ද ඔහු (තමා) අවවාද කට යුත්තෙකැයි නොසලකයි. "ඇවැත්නි ඔබ වහන්සේලා මාහට හොඳක් හෝ නරකක් හෝ නොකියනු මැනවි. මම ද ඔබ වහන්සේලාට හොඳක් හෝ නරකක් නොකියමි. එහෙයින් මට අනුශාසනා නොකරවු." යැයි තමා අනුශාසනා කටයුත්තෙකු කොට නොසලකයි. මෙබඳු භික්ෂුවකට සෙසු භික්ෂූන් විසින් මෙසේ කිය යුතුයි. "ඇවැත්නි තමා නොකිය යුත්තෙකු කොට නොසලකනු මැනව, හුදෙක් කියයුත්තෙක් ලෙස සලකනු මැනව, ඔබද භික්ෂූන්ට විනයානුකූලව කියන්න. සෙසු භික්ෂූහු ද ඔබට විනයානුකූලව කියති. එය එසේම විය යුතුය. මක් නිසා ද ඔවුනොවුන්ගේ අනුශාසනාවෙන් ඔවුනොවුන් ඇවතින් නගා සිටුවීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිස වැඩෙන්නේ ද එහෙයිනි." මෙසේ පියවි භික්ෂූන් විසින් අවවාද කරන කල්හිද ඒ භික්ෂුව පෙරසේම දැඩිව සිටියි නම් ඒ දෘෂ්ඨිය දුරුකරනු සඳහා පියවි භික්ෂූන් විසින් තෙවරක් දක්වාම අවවාද දිය යුත්තේය. ඉදින් තෙවැනි වර හෝ හික්මවනු ලබන්නේ සිය අදහස් හළේ නම් මැනවි. නොහළේ නම් (ඔහු හට) සඟවෙසෙස් ඇවැත් වෙයි.*

ආපත්ති අනාපත්ති පෙර ශික්ෂාපදය පරිදිමය.

## 17.කුලදූෂක ශික්ෂාපදය

**භික්ඛු පනේව අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති කුලදූසකෝ පාපසමාචාරෝ, තස්ස ඛෝ පාපකා සමාචාරා දිස්සන්ති චේව සුය්‍යන්ති ච, කුලානි ච තේන දුට්ඨානි දිස්සන්ති චේව සුය්‍යන්ති ච. සෝ භික්ඛු භික්ඛූහි ඒවමස්ස වචනීයෝ: 'ආයස්මා ඛෝ කුලදූසකෝ පාපසමාචාරෝ, ආයස්මතෝ ඛෝ පාපකා සමාචාරා දිස්සන්ති චේව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චේව සුය්‍යන්ති ච, පක්කමතායස්මා ඉමම්හා ආවාසා, අලන්තේ ඉධ වාසේනා'ති. ඒවඤ්ච සෝ භික්ඛු භික්ඛූහි වුච්චමානෝ තේ**

**භික්ඛූ ඒවං වදෙය්‍යුං: 'ඡන්දගාමිනෝ ච භික්ඛූ, දෝසගාමිනෝ ච භික්ඛූ, මෝහගාමිනෝ ච භික්ඛූ, භයගාමිනෝ ච භික්ඛූ, තාදිසිකාය ආපත්තියා ඒකච්චං පබ්බාජෙන්ති, ඒකච්චං න පබ්බාජෙන්තී'ති. සෝ භික්ඛු භික්ඛූහි ඒවමස්ස වචනීයෝ: 'මා ආයස්මා! ඒවං අවච, නච භික්ඛූ ඡන්දගාමිනෝ, න ච භික්ඛූ දෝසගාමිනෝ, න ච භික්ඛූ මෝහගාමිනෝ, න ච භික්ඛූ භයගාමිනෝ, ආයස්මා ඛෝ කුලදූසකෝ පාපසමාචාරෝ, ආයස්මතෝ ඛෝ පාපකා සමාචාරා දිස්සන්ති චේව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චේව සුය්‍යන්ති ච, පක්කමතායස්මා ඉමම්හා ආවාසා, අලන්තේ ඉධ වාසේනා'ති. ඒවඤ්ච සෝ භික්ඛු භික්ඛූහි වුච්චමානෝ තථේව පග්ගණ්හෙය්‍ය, සෝ භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බෝ තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චේ සමනුභාසියමානෝ තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චේතං කුසලං. නෝ චේ පටිනිස්සජ්ජෙය්‍ය, සඞ්ඝාදිසේසෝ.**

*යම් භික්ෂුවක් දායකයන්ගේ ශ්‍රද්ධාව දූෂණය කරමින් පහත් ඇවතුම් පැවතුම් ඇතිව යම් කුලයක් හෝ ගමක් ඇසුරු කොට වාසය කෙරේ. ඔහුගේ ලාමක හැසිරීම හා එයින් දූෂණයවූ කුල ද දකින්නටත් අසන්නටත් ලැබේ.(එසේ ඇති කල්හි) පියවි භික්ෂූන් විසින් ඒ භික්ෂුවට මෙසේ කිව යුතුවෙයි. "ඔබ වනාහි දායකයන්ගේ ශ්‍රද්ධාව දූෂණය කරන්නෙකි, ලාමක හැසිරීම් ඇත්තෙකි, ඔබගේ ලාමක පැවතුම් හා එයින් දූෂිතවූ කුල ද දකින්නටත් අසන්නටත් ලැබෙයි. එබැවින් ඔබගේ මෙහි සිටීමෙන් වැඩක් නැත. මේ ආරාමයෙන් ඉවත්ව යව". මෙසේ දන්වනු ලැබූ ඒ භික්ෂුව: "මෙබඳුම ආපත්තියක් මුල් කොට සමහර අය (ආරාමයෙන් ) බැහැර කරති, සමහර අය බැහැර නොකරති මේ භික්ෂූහු ඡන්දයෙන් අගතියට ගියහ, ද්වේෂයෙන් මෝහයෙන් හා භයෙන් අගතියට ගියේ යැ"යි කියයි නම් පියවි භික්ෂූන් විසින් යලින් ඔහු හට මෙසේ කිය යුතු වෙයි. "ඇවැත්නි මෙසේ නොකියාවා මේ භික්ෂූහු ඡන්දයෙන් අගතියට නොගියහ ද්වේෂයෙන් මෝහයෙන් හා භයෙන් අගතියට නොගියහ, ඔබ වනාහි කුල දූෂණය කරන්නෙකි. ලාමක හැසිරීම් ඇත්තෙකි. ඔබගේ ලාමක පැවතුම් හා එයින් දූෂිත කුළ ද දකින්නටත් අසන්නටත් ලැබේ.( එබැවින්) ඔබගේ මෙහි සිටීමෙන් වැඩක් නැත. මේ ආරාමයෙන් ඉවත්ව යව"යනුවෙනි. භික්ෂූන් විසින් මෙසේ කියනු ලබද්දීත් පෙරසේම සිටී නම් නැවත තෙවරක් දක්වා අවවාද කළ යුතුයි. තුන් වෙනි වර හෝ හික්මෙනු ලබන්නේ, සිය ලාමක හැසිරීම් අත්හළේ නම් මැනවි. නොහළේ නම් (ඔහු හට) සඟවෙසෙස් ඇවැත්වෙයි.*

| | |
|---|---|
| කුලදූෂකො | ආරාමයේ ඇති මල්, එල, සුණු, මැටි, දර, උණගස් ආදී සාංඝික භාණ්ඩ ගිහියන්ට දීම, ගිහියන්ට |
| | වෙදකම් කිරීම, නැකැත් බැලීම, ගිහියන්ගේ පණිවුඩ ගෙනයාම.(සෑම ක්‍රියාවකටම දුෂ්කට) |
| පාප සමාචාර | ගිහියන් සතුටු කිරීම සඳහා මල් සිටවීම, නෙලීම, මල් ගෙතීම ආදිය |

(බුද්ධ පූජා සඳහා මල්ගස් රෝපනය ගිරීමෙන් ඇවැත් නැත. එහෙත් බුද්ධ පූජා ආදිය සඳහා මල්මාලා ගෙතීම් ආදියෙන් දුෂ්කට වේ.)

✓ *මල් සිටවීම නෙලීම අකැප ව්‍යවහාරය*

මෙතැන වලක් හාරන්න
මේ මල් කඩන්න

✓ *මල් සිටවීම නෙලීම කැප ව්‍යවහාරය*

මේ ගස දැනගන්න
මේ මල දැනගන්න
මේ වල දැනගන්න

✓ *පරියාය කැප ක්‍රම*

නුවණැත්තෙක් නම් මේ මල් පැල සිටුවනවා
මල් ටිකක් අරන් දෙන්න
මේ මල් පූජා කල හැකියි

✓ *ඕභාෂය*

උදළු අලවංගු ආදී උපකරණ ගෙනැවිත් මල්පැල සිටුවන තැන තැබීම


✓ *නිමිත්ත කර්මය*

උදළු අලවංගු ආදී උපකරණ ගෙනැවිත් සාමණේර හිමිවරු ළඟ තැබීම

**ආපත්ති**

| | |
|---|---|
| අවවාද නොපිළිගැනීම | දුෂ්කට |
| සමනුභාෂන කර්මය කරනවිට ඥත්තිය තැබීමේදී | දුෂ්කට |
| කර්මවාක්‍යය පළමුවර හා දෙවනවර කීමේදී | ථුල්ලැසි |
| කර්මවාක්‍යය තෙවැනිවර අවසන්වීමේදී | සංඝාදිසේස |

## සංඝාදිසේස පිළිබඳ විස්තර




## ආපත්ති පටිච්ඡාදනය (ආපත්ති වැසීම)


සංඝාදිසේස ඇවතකට පත් වූ භික්ෂුව පසුදින අරුණට ප්‍රථම ඒ බව තවත් භික්ෂුවකට ආරෝචනය කල යුතුය. ආපත්තියක් බව දැන දැනම ආරෝචනය කිරීමේ හැකියාවද තිබියදී එසේ ආරෝචනය නොකර සිටීමෙන් ආපත්ති පටිච්ඡාදනය සිදුවේ.

## සංඝාදිසේස ඇවතකින් පිරිසිදු වන ආකාරය

සංඝදිසේස ඇවතක් පටිච්ඡානය නොකලේ නම් (එදවසම ආරෝචනය කර) දින 06ක මානතක් පිරිය යුතුය. ඉන් පසු අබ්භාන විනය කර්මයක් කරවාගැනීමෙන් පිරිසිදු විය හැකිය.

සංඝදිසේස ඇවතක් පටිච්ඡානය කලේ නම් (එදවසම ආරෝචනය නොකර) පටිචජනන කල දින ගණනට පිරිවෙසක් ගෙන පුරා මානත, අබ්භාහන යන විනය කර්මවලින් පිරිසිදු විය හැකිය.

## පිරිවෙස



01). <u>**පටිච්ඡන්න පරිවාසය**</u>

ආපත්ති වැසූ දින ගණන සලකා දෙන පිරිවෙසයි.

උදා-: ඇවතට පත් වී දින 05කට පසු ආරෝචනය කලේ නම් දින 05ක පිරිවෙසක් දිය යුතුය.

02). <u>**සුද්ධන්ත පරිවාසය**</u>

ආපත්තිගණන් හා වැසුණු අරුණු ගණන් නොදන්නා හට , සිහි නොකරන්නා හට, විමති ඇති අයට දෙන පිරිවෙස මෙයයි. මෙය දෙයාකාරයකි.

» චූල සුද්ධන්තය

උපසම්පදා වූ දිනයේ සිට සැලකීමේදී කිසියම් කාලයක් පිරිසිදු බව දන්නේ නම් එම කාලය අතහැර අපිරිසිදු කාලය සලකා දෙන පිරිවෙසයි.

» මහා සුද්ධන්තය

උපසම්පදා වූ දිනයේ සිට පිරිසිදු කාලයක් සිහිපත් කල නොහැකි නම් උපසම්පදා වූ කාලයම සලකා දෙන පිරිවෙසයි.

03). <u>**සමෝදාන පරිවාසය**</u>

» ඕදාන සමෝදාන පරිවාසය

පිරිවෙස් පුරමින් සිටින කාලය නැවතත් සංඝාදිසේස ඇවතකට පත්වී පටිච්ඡන්න කලේ නම් පිරිවෙස් විසූ කාලය මකාදමා මූලාය පටිකස්සනය කොට (මුලට ඇද) දෙන පිරිවෙසයි.

» අගඝ සමොදාන පරිවාසය

බොහෝ ඇවැත්වලට පත්වනවිට එම ඇවැත් පටිච්ඡන්න කලදින ගණන් විවිධ ලෙස වෙනස් වනවිට වැඩිම පටිච්ඡන්න කල දින ගණනට අනෙක් ඒවාත් ඇතුලත් කොට දෙන පිරිවෙසයි.

» මිසසක සමොදාන පරිවාසය

නා නා වස්තුක ඇවැත්වලට (විවිධ වර්ගයේ ආපත්ති) පත් වී ඇතිවිට ඒවා එකතු කර දෙන පිරිවෙවසයි.

<u>පිරිවෙස් පුරන ආකාරය</u>


සංඝාදිසේස ඇවතකට පත් වූ භික්ෂුව සංඝයාගෙන් (අවම සතර නමකගෙන්) සුදුසු පිරිවෙසක් ලබාගෙනඅඩුම තරමින් එක් භික්ෂුවක් හෝ සිටින සෙනසුනක 'පරිවාසං සමාදියාමි වතතං සමාදියාමි' යැයි තෙවරක් කියා පිරිවෙස සමාදන් වී එහි සිටින භික්ෂුන්ට ආරෝචනය කර අදාළ දින ගණන පිරිවෙස පිරිය යුතුය.

## පිරිවෙස් කැඩෙන ආකාරය

| | |
|---|---|
| සහවාසය | ප්‍රකෘති භික්ෂුන් සමග එක වහලක් යට නිදා ගැනීම |
| විපපවාසය | ප්‍රකෘති භික්ෂුන් නැති සෙනසුනක අරුනක් ඉක්මවීම |
| අනාරෝචනය | භික්ෂුවක් (ආගන්තුක)දැක ආරෝචනය නොකර සිටීම |

## මානත

සංඝදිසේස ඇවතකට පත්වී පටිච්ජනන කර පිරිවෙස් විසූ භික්ෂුවද පටිච්ජන්න නොකල භික්ෂුවද අනිවාර්‍යන්ම දින 06ක මානතක් පිරිය යුතුය.




»අපටිජන්න මානත

සංඝාදිසේස ඇවතකට පත්වී එදිනම ආරෝචනය කල භික්ෂුවට දෙන මානතයි.

» පටිජචජන්න මානත

සංඝාදිසේස ඇවතකට පත්වී එදිනම ආරෝචනය නොකර පටිච්ජන්න කල භික්ෂුවට පිරිවෙස පිරීමෙන් අනතුරුව දෙන මානතයි.

## මානත පූරන ආකාරය

සංඝාදිසේස ඇවතකට පත් වූ භික්ෂුව සංඝයාගෙන් (අවම සතර නමකගෙන්) මානත ලබාගෙනඅඩුම තරමින් සතර නමක් වත් සිටින ආවාසයකට ගොස් ‘මානතතං සමාදියාමි වතතං සමාදියාමි‘ යැයි තෙවරක් කියා මානත සමාදන් වී දින 06ක් වාසය කල යුතුය.

## මානත කැඩෙන ආකාරය

| | |
|---|---|
| සහවාසය | ප්‍රකෘති භික්ෂුන් සමග එක වහලක් යට නිදා ගැනීම |
| විපපවාසය | ප්‍රකෘති භික්ෂුන් නැති සෙනසුනක අරුනක් ඉක්මවීම |
| අනාරෝචනය | භික්ෂුවක් (ආගන්තුක)දැක ආරෝචනය නොකර සිටීම |

ඌන ගණෙ‍ෙ වරණං භික්ෂූන් වහන්සේලා හතර නමකට අඩු තැනක මානත පිරීම

## අබ්භාහන විනයකර්මය

සංඝාදිසේස ඇවතකට පත්වී පිරිවෙස් මානත් පිරූ භික්ෂුව එම ඇවතින් සම්පූර්ණයෙන්ම පිරිසිදුවීම සඳහා අඩුම තරමින් භික්ෂූන් වහන්සේලා 20 නමකගෙන් යුක්තව අබ්භාන නමැති විනය කර්මය කරවාගත යුතුය.

# අනියත (02)

## 18. පඨම අනියත ශික්ෂාපදය

**යෝ පන භික්ඛු මාතුගාමේන සද්ධිං ඒකෝ ඒකාය රහෝ පටිච්ඡන්නේ ආසනේ අලංකම්මනියේ නිසජ්ජං කප්පෙය්‍ය. තමේනං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා තිණ්ණං ධම්මානං අඤ්ඤතරේන වදෙය්‍ය, පාරාජිකේන වා සඞ්ඝාදිසේසේන වා පාචිත්තියේන වා. නිසජ්ජං භික්ඛු පටිජානමානෝ තිණ්ණං ධම්මානං අඤ්ඤතරේන කාරේතබ්බෝ පාරාජිකේන වා සඞ්ඝාදිසේසේන වා පාචිත්තියේන වා. යේන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තේන සෝ භික්ඛු කාරේතබ්බෝ. අයං ධම්මෝ අනියතෝ.**

*යම් භික්ෂුවක් මුවහවූ මෛථුන සේවනයට සුදුසුවූ රහසිගතවූ තැනක හුදකලාවූ ස්ත්‍රියක සමග හිඳ ඇදහියයුතු වදන් ඇති උවැසියක් එය දැක පරිජි, සඟවෙසෙස්, පචිති යන තුන් ආපත්තීන් අතුරෙන් යම් කිසි ඇවතකින් චෝදනා කරයි ද එසේ හිඳී භික්ෂුව යථෝක්ත ත්‍රිවිධ ආපත්තීන් අතුරින් ප්‍රතිඥා කරන්නේ යම් ඇවතකින්ද එයින් ආරෝපණය කටයුත්තේය. මේ ආපත්තිය භික්ෂුවගේ ප්‍රතිඥාවෙන් කළ යුතු බැවින් අනියත නම් වෙයි.*

### අර්ථ

| | |
|---|---|
| මාතුගාම | මනුෂ්‍ය ස්ත්‍රිය (එදවස උපන් දැරිය පටන්) |
| එකො එකාය රහො | |
| | භික්ෂුවක් මාගමක් සමග හුදකලාවේ ආවරණය වූ තැනක වාඩි වී සිටීම හෝ නිදාගෙන සිටීමෙන් ආපත්ති සිදුවන බව මෙයින් කියවේ. |
| අලංකමමනීයෙ | මෛථුන සේවනයට යෝග්‍ය වූ තැනක් |

### ආපත්ති

භික්ෂුවට එසේ චෝදනා කරන කල්හි එය භික්ෂුවගෙන් විමසූ විට භිකුෂුව පිළිගන්නා ඇවත සිදුවේ.

වෙනත් ස්ත්‍රීන් සියයක් සිටියද මෙම සිකපදයෙන් ඇවැත් සිදුවේ.

### අනාපත්ති

දෙදෙනාගෙන් එක් අයකු සිටගෙන සිටීමෙන්

ඇස් ඇති පුරුෂයකු ළඟ ඇතිවිට

එසේ සිටින්නට කැමැත්තක් නොමැතිව සිටින්නට සිදුවන අවස්ථාවල

## 19. දුතිය අනියත ශික්ෂාපදය

**න හේව ඛෝ පන පටිච්ඡන්නං ආසනං හෝති නාලංකම්මනියං. අලඤ්ච ඛෝ හෝති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඕභාසිතුං. යෝ පන භික්ඛු තථාරූපේ ආසනේ මාතුගාමේන සද්ධිං ඒකෝ ඒකාය රහෝ නිසජ්ජං කප්පෙය්‍ය. තමේනං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා ද්වින්නං ධම්මානං අඤ්ඤතරේන වදෙය්‍ය, සඞ්ඝාදිසේසේන වා පාචිත්තියේන වා. නිසජ්ජං භික්ඛු පටිජානමානෝ ද්වින්නං ධම්මානං අඤ්ඤතරේන කාරේතබ්බෝ සඞ්ඝාදිසේසේන වා පාචිත්තියේන වා. යේන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තේන සෝ භික්ඛු කාරේතබ්බෝ.අයම්පි ධම්මෝ අනියතෝ.**


*ආසනය මුවහ නොවූවක් වෙයි. මෛථුන සේවනයට ද නුසුදුසුය. එහෙත් ස්ත්‍රියක හා අසභ්‍ය ව්‍යවහාරයෙන් කථා කරන්නට ප්‍රමාණය. යම් භික්ෂුවක් හුදෙකලාව ස්ත්‍රියක සමඟ එබඳු ආසනයක හිඳ ඇදැහිය යුතු වචන ඇති උවැසියක් එය දැක සඟවෙසෙසින් හෝ පචිතියෙන් හෝ චෝදනා කරයි. එසේ හිඳි බව ප්‍රතිඥා කරන භික්ෂුව ඒ ද්විවිධ ආපත්තීන් අතුරින් ප්‍රතිඥා කරන්නේ යම් ඇවතකින්ද එයින් ආරෝපණය කළ යුතුවෙයි. මේ ආපත්තිය ද භික්ෂුවගේ ප්‍රතිඥාවෙන් කළ යුතු හෙයින් අනියත නම් වේ.*

### ආපත්ති

මෙම සිකපදයේදී එළිමහන් තැනක් අගවන බැවින් භික්ෂුව හා මාගම සිටින තැන දොලොස් පරියන් උපචාරයෙහි ඇස් ඇති කන් ඇසෙන පුරුෂයකු සිටීනම් ඇවැත් සිදු නොවේ.

තවත් ස්ත්‍රීන් සිටීමෙන්ද මෙම සිකපදයෙන් ඇවැත් සිදුනොවේ.

# නිසැගි පචිති (30)




## චීවර වර්ග

### 20. පඨම කඨින ශික්ෂාපදය

**නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනේ, දසාහපරමං අතිරේකචීවරං ධාරේතබ්බං. තං අතික්කාමයතෝ, නිස්සග්ගියං පාචිත්තියං.**

*භික්ෂුව තමාගේ සිවුර කොට නිමි කල්හි සහ කඨිනානිසංස උද්ධරණය වූ කල්හි භික්ෂුව විසින් දස දිනක් තුළ අතිරේක සිවුරක් දැරිය හැකිය. එය ඉක්මවන්නා හට නිසගි පචිති වේ.*

## අර්ථ

| | |
|---|---|
| නිටයීත චීවරසමිං උබහතසමිං කයීනෙ | කයීන ආනිසංස නැතිවිට |
| අතිරේක චීවරං | අධිෂ්ඨානය නොකල විකල්පනය නොකල කැප සිවුරුවලින් අඩුම තරමින් රියනක් දිග වියතක් පලල රෙදි කැබැල්ලක් |

<u>**නිසැගි වූ සිවුරක් නිස දෙසන ආකාරය**</u>

නිසැගි වූ සිවුර ගෙන තවත් භික්ෂුවක් ළගට ගොස් උත්කුටියෙන් හිද 'ඉදං මෙ භනෙත චීවරං දසාහතිකකනතං නිසසගගියං ඉමාහං සංඝසස නිසසජාමි' ලෙස තෙවරක් කියා සිවුර දී ආපත්තිය දේශනා කල යුතුය.

එවිට අනෙක් භික්ෂුව 'ඉමං චීවරංආයසමතො දමමි' ලෙස කියා නැවත සිවුර දිය යුතුය.

## කඨිනය ඇතිරීම

කඨින සිවුරක් පූජා කල යුත්තේ පස් නමකගෙන් යුත් සංඝයාටය.එම සංඝයා එය පසු දිනක නොව එදිනම සුදුසු භික්ෂුවකට දිය යුතුය. කඨිනය ලබන්නේ එම පස් නමෙන් එක්අයෙක් නම් ඉතිරිවන සතර නමක් වූ සංඝයා විසින් ඤත්ති දුතිය කර්ම වාකයෙයාන්එම වස්ත්‍රය දිය යුතුය.

සිවුර ලැබූ භික්ෂුව එදිනම ඒ සඳහා කල යුතු කැපීම, මැසීම, පඩු පෙවීම, කප් බිංදු තැබීම ආදී සියල්ල නිම කල ය්තුය.

තනිපට සිවුරක් මැසුවේ නම් පැරණි තනිපට සිවුරෙහි අධිෂ්ඨානය ඉවත් කල යුතුය.

'මේ තනිපට සිවුරෙහි අධිෂ්ඨානය ඉවත් කරමි'
'ඉමං උත්තරාසංගං පච්චුද්දරාමි'

ඉන්පසු අළුත් උත්තරාසංගය අධිෂ්ඨාන කල යුතුය.

'මේ තනිපට සිවුරෙහි අධිෂ්ඨානය කරමි'
'ඉමං උත්තරාසංගං අධිටඨාමි'

ඉන්පසු කඨින සිවුර ඇතිරිය යුතුය.

මේ තනිපට සිවුරෙන් කඨිනය අතුරමි
'ඉමිනා උතතරාසංගෙන කඨිනං අතථරාමි'

මේ සමග ඔහුට කඨිනානිසංස 05ක් ලැබේ.

## කඨිනය අනුමෝදන් වීම හා කිරීම

කඨිනය ඇතිරූ භික්ෂුව සංඝයා වෙත ගොස් වැදගෙන 'අතථතං භනෙත සංඝසස කඨිනං , ධමමිකො කඨිනතථාරො අනුමොදථ' ලෙස අනුමෝදන් කල හැකිය.

ස්වාමීනි සංඝයාගේ කඨිනය මවිසින් අතුරන ලදි.ඒ කඨිනය දැහැමිය. අනුමෝදන් වුව මැනවි.

අනුමෝදන් වන භික්ෂූන් විසින් වැදගෙන 'අතථතං ආවුසො සංඝසස කඨිනං , ධමමිකො කඨිනතථාරො අනුමොදාම' ලෙස කියා අනුමෝදන් විය හැකිය.

ඇවැත්නි සංඝයාගේ කඨිනය ඔබ විසින් අතුරන ලදි.ඒ කඨිනය ඇතිරීම දැහැමිය. එම ඇතිරීම අපි අනුමෝදන් වෙමු.

<u>කඨිනානිසංස</u>

අනාමන්තචාර

තම විහාරයෙහි දොලොස් රියනක් ඇතුලත භික්ෂුවක් සිටියත් ඔහුගෙන් නොවිමසා පෙරවරුවෙහි භික්ෂුවට ගමට යා හැකිය.

අසමාදානචාර

තුන් සිවුර අධිෂ්ඨාන කල භික්ෂුවට එයින් තමා කැමති සිවුරකින් වෙන්ව රාත්‍රිය ගත කලත් හෙවත් අරුණ උදාවන විම දෙරියන් හමාරක අත්පසින් වෙන්ව සිටියත් නිසැගි පචිති නොවේ.

ගණ භෝජන

අකැප ව්‍යවහාරයකින් ලද දානයක් භික්ෂූන් සතර දෙනෙක් හෝ ඊට වැඩි පිරිසක් සමග පිළිගන්නා භික්ෂුවට පචිති ඇවැත් නොවේ.

යාවදත්ථ චීවර

අධිෂ්ඨාන නොකල, විකප්පනය නොකල සිවුරු කැමති ප්‍රමාණයක් පාවිච්චි කල හැකිය.

යෝ ච තත්ථ චීවරුප්පාද

කඨිනය අතුරන ලද වස් සීමාව තුලදී ලැබෙන සඟ සතු සිවුරු සියල්ල කඨිනය ඇතිරූ භික්ෂුවට අයිති වෙයි.අනිත් පිරිකර අයත් නොවේ.

<u>කඨිනානිසංස අහිමි වීම (කඨිනය ඉදිරීම් අට)</u>

පක්කමනන්තිකා

භික්ෂුව මසා නිමකල සිවුරත් රැගෙන ‘කඨිනය ඇතිරූ විහාරයට ආපසු නොඑමි‘යි යන අදහසින් නික්ම යයි. විහාරයේ උපචාර සීමාව ඉක්මවා යනවිට අනුසස් අහිමිවෙයි.

නිට්ඨානන්තිකා

ආපසු එන අදහසින් ආනිසංස වස්ත්‍රය රැගෙන භික්ෂුව විහාරයෙන් නික්ම යයි. වෙනත් විහාරයක සිට සිවුරු මහන අතර ‘ආපසු නොයමි‘යි සිතයි. සිවුර මසා නිමවීමත් සමග අනුසස් අහිමිවෙයි.

සන්නිට්ඨානන්තිකා

ආපසු එන අදහසින් ආනිසංස වස්ත්‍රය රැගෙන භික්ෂුව විහාරයෙන් නික්ම යයි. වෙනත් විහාරයක සිට 'සිවුරත් නොමසමි, ආපසුත් නොයමි'යි සිතයි. සිතීමත් සමග අනුසස් අහිමිවෙයි.

නාසනන්තිකා

ආපසු එන අදහසින් ආනිසංස වස්ත්‍රය රැගෙන භික්ෂුව විහාරයෙන් නික්ම යයි. වෙනත් විහාරයක සිට 'මෙහිදී සිවුර මසමි, එහෙත් ආපසු නොයමි'යි සිතා සිවුර මසන අතර සොර සතුරු උවදුරකින් සිවුර නැතිවෙයි. ඒ සමගම අනුසස් එඅහිමිවෙයි.

සවණන්තිකා

ආපසු එන අදහසින් ආනිසංස වස්ත්‍රය රැගෙන භික්ෂුව වෙනත් විහාරයකට යයි. වෙනත් විහාරයක සිට 'මෙහි සිට සිවුර මසා ගෙන යමියි' සිතා සිවුර මසයි. එසේ මසන අතරතුර කඨිනය ඇතිරූ විහාරයෙහි කඨිනානිසංස , සංඝයා විසින් ඉවත්කරන ලදැයි අසයි. ඒ සමගම අනුසස් එඅහිමිවෙයි.

සීමාතික්කන්තිකා

ආපසු එන අදහසින් ආනිසංස වස්ත්‍රය රැගෙන භික්ෂුව වෙනත් විහාරයකට යයි. 'මෙහි සිට සිවුර මසා ගෙන යමියි' සිතා එය නිමකරයි. අද යමියි හෙට යමියි සිත සිතා සිටින විට පස් මාසය අවවසන් වෙයි. කාලය අවසන්වීමත් සමගම භික්ෂුව පිටත සිටියදීම අනුසස් අහිමිවී යයි.

සහුබ්භාරා

ආපසු එන අදහසින් ආනිසංස වස්ත්‍රය රැගෙන භික්ෂුව වෙනත් විහාරයකට ගොස් සිවුර මසයි. සිවුර මසමාගෙන ආපසු එනවිට සංඝයා කඨිනානිසංස ඉවත් කරයි. එහි සියළු භික්ෂූන්ගේ අනුසස් අහිමිවෙයි.

ආසාවච්ඡේදිකා

මේ භික්ෂුවට වස් විසූ තැනින් වස්ත්‍රයක් ලැබී නැත. එහෙයින් වස්ත්‍රයක් සොයාගන්නා අදහසින් වෙනත් විහාරයකට යන්නේ ආපසු එන අදහස ඇතිවයි. එම විහාරයේ සිටින භික්ෂුව 'මෙහිදීම වස්ත්‍ර සොයා ගන්නෙමියි ආපසු නොයන්නෙමියි' සිතයි. වස්ත්‍ර ලැබීමේ ආශාවද නැතිවී යයි. ඒ සමග ඒ අනුසස් අහිමිවෙයි.

## ආපත්ති

අතිරේක සිවුරක් දින 10කට වඩා තබා ගැනීමෙන් නිසැගි පචිති වේ.

නිසැගි වූ සිවුරක් නොදැන වුවද පරිභෝග කරන වාරයක් පාසා දුෂ්කට වේ.

## අනාපත්ති

දින 10 ක් ඇතුලත අධිෂ්ඨානය කිරීමෙන්
විකල්පනය කිරීමෙන්
අනුන්ට දීමෙන්
විනාශවීමෙන්
පැහැරගැනීමෙන්
විශ්වාසයෙන් ගැනීමෙන් ආදියෙන්

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ය/ ආදිකම්මික

## සිවුරු

**කැප සිවුරු වර්ග**

| | |
|---|---|
| ඛොම | කොමු පට්ටාවලින් සෑදූ රෙදි |
| කපපාසික | කපු රෙදි |
| කොසෙයා | පට පණු රෙදි |
| කම්බල | එළුලොම් රෙදි |
| සාණ | හණ නූල් රෙදි |
| භංග | ඉහත පහම හෝ කීපයක් මිශ්‍රව හදන රෙදි |

**අනුලෝම කැප සිවුරු වර්ග**

| | |
|---|---|
| දුකූල | හණ වැනි |
| පතතුනන | පට පණු රෙදි වැනි |
| චීන පට්ට, කෝමාර පට්ට | කපු රෙදි වැනි |
| ඉදධිමය | ඍදධියෙන් ලැබූ |
| දෙවදිනන | දෙවියන් විසින් දුන් |

**භික්ෂුවක් සතු චීවර වර්ග**

01). තුන් සිවුර (අන්තරාවාසකය, උතතරාසංගය, සංඝාටිය)

02). වස්සික සාටිකය වැසි සළුව

03). නිසීදනය පත්කඩය

04). පචචතතරණය ඇද ඇතිරිල්ල

| | |
|---|---|
| 05). කණ්ඩු පටිච්ඡාදනය | සැරව වැනි රෝග ඇතිවිට නාභියෙන් පහල දණහිසින් ඉහළ වැසීමට අදින සිවුර |
| 06). මුඛ පුඤ්ජනචෝලය | තුවාය |
| 07). පරික්ඛාරචෝල | අනෙකුත් පරිෂ්කාර |

- මීට අමතරව ගමනක් යෑමේදී පෙරහන්කඩය හා ඉදිකටු නූල් ගෙන යා යුතුය. නැතහොත් දුෂ්කට වේ.

## තුන් සිවුරේ ප්‍රමාණ

| | | |
|---|---|---|
| අඳනය | දිග | මුටයී පඤ්චකය |
| | පළල | දෙරියන |
| උත්තරාසංගය | දිග | මුටයී පඤ්චකය |
| | පළල | මුටයී ත්‍රිකය |
| සංඝාටිය | දිග | මුටයී පඤ්චකය |
| | පළල | මුටයී ත්‍රිකය |

- උපරිම වශයෙන් සුගත චීවරයට අඩුවිය යුතුය.

## තුන් සිවුරු අධිෂ්ඨානය

සිවුර ජංගෙයා, ග්‍රීවෙයය, සන්යී, පාස සම්පූර්ණ කොට පඩු පොවාගත යුතුය. ඉන්පසු නිල්,කළු හෝ මඩ පාටින් කප් බිංදුව නුවාවේ සිට සතරගුලක් පමණ ඇතුලට කොන් සතරේම,තුනක,දෙකක හෝ එකක 'ඉමං කපප බිංදුං කරොමි' කියා මොණර ඇසක් පමණ ප්‍රමාණයට තැබිය යුතුය. දැන් මෙම සිවුර අධිෂ්ඨානයට සුදුසු සිවුරකි.

## සිවුරු අධිෂ්ඨාන කරන ආකාරය

» තුන් සිවුර සමීපයේ ඇතිවිට

ඉමං අනතරවාසකං අධිටයාමි
ඉමං උතතරාසංසං අධිටයාමි
ඉමං සංඝාටිං අධිටයාමි

යනුවෙන් සිතින් සිතමින් අතින් ස්පර්ෂ කරමින් හෝ වචනයෙන් තුන්වතාව බැගින් කියනවිට අධිෂ්ඨානය සිදුවේ.

» තුන් සිවුර සමීපයේ නැතිවිට (තිබෙන තැන සලකා)

එතං අනතරවාසකං අධිටඨාමි
එතං උතතරාසංසං අධිටඨාමි
එතං සංඝාටිං අධිටඨාමි
ලෙස තුන්වර බැගින් වචනයෙන්ම කිව යුතුය.

**<u>තුන් සිවුර පච්චුද්ධරණය (අධිෂ්ඨානය අතහැරීම)</u>**

» තුන් සිවුර සමීපයේ ඇතිවිට

ඉමං අනතරවාසකං පච්චුද්ධරාමි
ඉමං උතතරාසංසං පච්චුද්ධරාමි
ඉමං සංඝාටිං පච්චුද්ධරාමි

» තුන් සිවුර සමීපයේ නැතිවිට (තිබෙන තැන සලකා)

එතං අනතරවාසකං පච්චුද්ධරාමි
එතං උතතරාසංසං පච්චුද්ධරාමි
එතං සංඝාටිං පච්චුද්ධරාමි

ලෙස තුන්වර බැගින් කිව යුතුය.

**<u>සිවුරුවල අධිෂ්ඨානය බිදෙන ආකාරය</u>**

අනුන්ට දීමෙන්
විශ්වාසයෙන් ගැනීමෙන්
උපසම්පදාව ප්‍රතික්ෂේප කිරීමෙන්
ලිංග පරිවර්තනය වීමෙන්
පැහැර ගැනීමෙන්
ගිහි බවට පත් වීමෙන්
කාලක්‍රියා කිරීමෙන්
පච්චුද්ධරණය කිරීමෙන්

තුන් සිවුරෙහි සුළැගිලි නියපිට ප්‍රමාණයේ සිදුරක් සෑදීමෙන් අධිෂ්ඨානය බිදේ.

## 21. පඨම කඨින ශික්ෂාපදය

**නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනේ, ඒකරත්තම්පි චේ භික්ඛු තිචීවරේන විප්පවසෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං.**

*භික්ෂුව තමාගේ සිවුර කොට නිමි කල්හි සහ කඨිනානිසංස උද්ධරණය වූ කල්හි සංඝයාගේ අනුමතියක් නොමැතිව තුන් සිවුරෙන් වෙන්ව එක රැයකුදු ගත කරන්නේ නම් ඔහු හට නිසැගි පචිති වේ.*

### ආපත්ති

තුන් සිවුරෙන් වෙන්ව නොදැන සිටියද පචිති වේ.
නිසැගි සිවුර පාවිච්චි කිරීමේදී දුෂ්කට වේ.

### අනාපත්ති

අරුණට පෙර පච්චුද්ධරණය කිරීමෙන්
භික්ෂු සම්මුතියක් ඇති ගිලන් භික්ෂුවට

## 22. තතිය කඨින ශික්ෂාපදය

**නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනේ, භික්ඛුනෝ පනේව අකාලචීවරං උප්පජ්ජෙය්‍ය, ආකංඛමානේන භික්ඛුනා පටිග්ගහේතබ්බං. පටිග්ගහෙත්වා ඛිප්පමේව කාරේතබ්බං. නෝ චස්ස පාරිපූරී, මාසපරමං තේන භික්ඛුනා තං චීවරං නික්ඛිපිතබ්බං ඌනස්ස පාරිපූරියා, සතියා පච්චාසාය. තතෝ චේ උත්තරිං නික්ඛිපෙය්‍ය සතියාපි පච්චාසාය, නිස්සග්ගියං පාචිත්තියං.**

*භික්ෂුව තමාගේ සිවුර කොට නිමි කල්හි සහ කඨිනානිසංස උද්ධරණය වූ කල්හි භික්ෂුවකට නොකල් චීවරයක් ලැබේ. ඉදින් කැමතිනම් භික්ෂුව විසින් පිළිගත හැකිය. පිළිගෙන එයින් වහා සිවුරක් (දස සිවුරෙන් එකක්) කරවිය යුතුයි. සිවුරකටද නොසෑහේ නම්, අඩුව සම්පූර්ණකර ගැනීම සඳහා බලාපොරොත්තු සහිතව, (නො ඉවා) මාසයක් තැම්පත් කරගත හැකිය. බලාපොරොත්තුව ඇතත් මාසයකින් මත්තෙහි තබාගන්නා හට නිසැගි පචිති වේ.*

<u>අකාල සිවුරු</u>
චීවර මාසය හැර (කඨින ආනිසංස ඇතිවිට එම මාස 04 හැර) ඉතිරි කාලයේ ලැබෙන සිවුරු

<u>චීවර මාසය</u>
වස් පවාරණයෙන් පසු එන මාසය

## 23. පුරාණ චීවර ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධෝවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා ආකෝටාපෙය්‍ය වා, නිස්සග්ගියං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් නොනෑ වූ භික්ෂුණියක් ලවා පරණ සිවුරක් සෝදා නම්, පඬු පොවා නම්, අපුල්ලා නම් (බහු හට) නිසැගි පචිති වේ.*

### අර්ථ

| | |
|---|---|
| පුරාණ චීවරං | වරක් හැදපු පොරවපු සිවුරු |
| අඤ්ඤාතිකාය | සත්මුදු පරම්පරාවක් යනතුරු ලේ ඥාතීන් නොවන |

### ආපත්ති

| | |
|---|---|
| සේදීමට අණ කිරීමේදී | දුෂ්කට |
| සෝදා අවසන් කිරීමේදී | නිසැගි පචිති |

### අනාපත්ති

ඥාති භික්ෂුණීන් ලවා සේදවීම

යමෙක් නොකියා රැගෙන ගොස් සේදීම

සික්ඛ මානාවක් හෝ සාමණේරියක් ලවා සේදවීම

## 24. චීවර පටිග්ගහණ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතෝ චීවරං පටිග්ගණ්හෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා, නිස්සග්ගියං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් නොනෑ වූ භික්ෂුණියක අතින් (සුළු දෙයකට) හෝ මාරුකර ගැනීමක් නැතිව සිවුරක් ගනී නම් (ඔහු හට) නිසඟි පචිති වේ.*

**අර්ථ**

අඤ්ඤත්‍ර පාරිවටටකා කිසිවක් නොදී

## 25. අඤ්ඤාතක විඤ්ඤත්ති ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙය්‍ය අඤ්ඤත්‍රසමයා, නිස්සග්ගියං පාචිත්තියං. තත්ථායං සමයෝ: අච්ඡින්නචීවරෝ වා හෝති භික්ඛු නට්ඨචීවරෝ වා අයං තත්ථ සමයෝ.**

*යම් භික්ෂුවක් නොනෑවූ ගෘහපතියෙකු හෝ ගෘහනියක අතින් සොරුන් විසින් පැහැරගත් කල්හි හෝ දිරාගොස් විනාශ වූ කල්හි හැර නොකල්හි සිවුරක් ඉල්වා ගනී ද ඔහු හට නිසඟි පචිති වේ.*

## 26. තතුත්තරි ශික්ෂාපදය

**තඤ්චේ අඤ්ඤාතකෝ ගහපති වා ගහපතානී වා බහූහි චීවරේහි අභිහට්ඨුං පවාරෙය්‍ය, සන්තරුත්තරපරමං තේන භික්ඛුනා තතෝ චීවරං සාදිතබ්බං, තතෝ චේ උත්තරිං සාදියෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*(කාලයෙහි උවදු) යථෝක්ත නොනෑ වූ ගෘහපතියා හෝ ගෘහනිය බොහෝ සිවුරුවලින් භික්ෂුව පවරා නම් ඒ භික්ෂුව විසින් අඳනය හා පොරෝනය පමණක් උපරිම කොට ඉවසිය යුතුය. ඉන් වැඩියත් සිවුරු පිළිගනීනම් ඔහු හට නිසඟි පචිති වෙයි.*

**අර්ථ**

සනතරුතතර පරමං අඳනය, තනිපට සිවුර දක්වා පමණක්

## 27. පඨම උපකඛට ශික්ෂාපදය

**භික්ඛුං පනේව උද්දිස්ස අඤ්ඤාතකස්ස ගහපතිස්ස වා ගහපතානියා වා චීවරචේතාපන්නං උපක්ඛටං හෝති: 'ඉමිනා චීවරචේතාපන්නේන චීවරං චේතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරේන අච්ඡාදෙස්සාමී'ති. තත්‍ර චේ සෝ**

**භික්ඛු පුබ්බේ අප්පවාරිතෝ උපසඞ්කමිත්වා චීවරේ විකප්පං ආපජ්ජෙය්‍ය: 'සාධු වත මං ආයස්මා ඉමිනා චීවරචේතාපන්නේන ඒවරූපං වා ඒවරූපං වා චීවරං චේතාපෙත්වා අච්ඡාදේහී'ති. කල්‍යාණකම්‍යතං උපාදාය, නිස්සග්ගියං පාචිත්තියං.**

*නො නැවූ ගෘහපතියෙක් විසින් හෝ ගෘහනියක විසින් මේ මුදලින් සිවුරක් මිළදී ගෙන අසවල් භික්ෂුවට දෙන්නෙමි'යි භික්ෂුවක් උදෙසා සිවුරු මුදලක් එකතු කරන ලද්දේ වෙයි. ඒ භික්ෂුව (දායක දායිකාවන් විසින්) සිවුරින් නොපවරනලද්දේ පළමුව ඔවුන් කරා ගොස් හොඳ සිවුරක් බලාපොරොත්තුවෙන් ඒ මුදලින් 'මෙබඳු සිවුරක් මිළට ගෙන පුදවයි' එහිලා විධාන කරයි ද එබඳු විධානයකින් සිවුරක් ලබන භික්ෂුවට නිසඟි පචිති වෙයි.*

**අර්ථ**

| | |
|---|---|
| චීවරේ විකපපං ආපජෙජය්‍ය | වටිනාකමට වැඩි වටිනාකමකින් යුත් චීවරයක් ඉල්ලීම |
| චීවර චෙතාපනනං | සිවුරක් සෑදීමට මුදලක් හෝ ඊට විනාකමට සරිලන දේවල් |

## 28. දුතිය උපකඛට ශික්ෂාපදය

**භික්ඛුං පනේව උද්දිස්ස උභින්නං අඤ්ඤාතකානං ගහපතීනං වා ගහපතානීනං වා පච්චේක චීවරචේතාපන්නානි උපක්ඛටානි හොන්ති: 'ඉමේහි මයං පච්චේක චීවරචේතාපන්නේහි පච්චේක චීවරානි චේතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරේහි අච්ඡාදෙස්සාමා'ති. තත්‍ර චේ සෝ භික්ඛු පුබ්බේ අප්පවාරිතෝ උපසඞ්කමිත්වා චීවරේ විකප්පං ආපජ්ජෙය්‍ය: සාධු වත මං ආයස්මන්තෝ ඉමේහි පච්චේක චීවරචේතාපන්නේහි ඒවරූපං වා ඒවරූපං වා චීවරං චේතාපෙත්වා අච්ඡාදේථ, උභෝ'ව සන්තා ඒකේනා'ති. කල්‍යාණකම්‍යතං උපාදාය, නිස්සග්ගියං පාචිත්තියං.**

*නො නැවූ ගෘහපතියන් දෙදෙනෙකු හෝ ගෘහනියන් දෙදෙනෙකු විසින් මේ වෙන වෙන මුදලින් වෙන වෙනම සිවුර මිළදී ගෙන අසවල් භික්ෂුවට දෙන්නෙමු'යි යම් භික්ෂුවක උදෙසා වෙන වෙන සිවුරු මුදල් එකතු කරන ලද්දේ වෙයි. ඒ භික්ෂුව ද (දායක දායිකාවන් විසින්) සිවුරින් නොපවරනලද්දේම පළමුව ඔවුන් කරා ගොස් හොඳ සිවුරක් බලාපොරොත්තුවෙන් ඒ වෙන වෙන එකතු කල මුදලින් 'මෙබඳු සිවුරක් මිළට ගෙන පුදව'යි එහිලා විධාන කරයි ද එබඳු විධානයකින් සිවුරක් ලබන භික්ෂුවට නිසඟි පචිති වෙයි.*

## 29. රාජ ශික්ෂාපදය


**භික්ඛුං පනේව උද්දිස්ස රාජා වා රාජභොග්ගෝ වා බ්‍රාහ්මණෝ වා ගහපතිකෝ වා දූතේන චීවරචේතාපන්නං පහිණෙය්‍ය: 'ඉමිනා චීවරචේතාපන්නේන චීවරං චේතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරේන අච්ඡාදේහී'ති. සෝ චේ දූතෝ තං භික්ඛුං උපසඞ්කමිත්වා ඒවං වදෙය්‍ය: 'ඉදං ඛෝ භන්තේ ආයස්මන්තං උද්දිස්ස චීවරචේතාපන්නං ආභතං, පතිගණ්හාතු ආයස්මා චීවරචේතාපන්නන්ති. තේන භික්ඛුනා සෝ දූතෝ ඒවමස්ස වචනීයෝ: 'න ඛෝ මයං ආවුසෝ චීවරචේතාපන්නං පතිගණ්හාම, චීවරඤ්ච ඛෝ මයං පතිගණ්හාම කාලේන කප්පියන්ති. සෝ චේ දූතෝ තං භික්ඛුං ඒවං වදෙය්‍ය: 'අත්ථි පනායස්මතෝකෝචි වෙය්‍යාවච්චකරෝ'ති: චීවරත්ථිකේන භික්ඛවේ භික්ඛුනා වෙය්‍යාවච්චකරෝ නිද්දිසිතබ්බෝ ආරාමිකෝ වා උපාසකෝ වා: 'ඒසෝ ඛෝ ආවුසෝ භික්ඛූනං වෙය්‍යාවච්චකරෝ'ති. සෝ චේ දූතෝ තං වෙය්‍යාවච්චකරං සඤ්ඤාපෙත්වා තං භික්ඛුං උපසඞ්කමිත්වා ඒවං වදෙය්‍ය: 'යං ඛෝ භන්තේ ආයස්මා වෙය්‍යාවච්චකරං නිද්දිසි, සඤ්ඤත්තෝ සෝ මයා, උපසඞ්කමතු ආයස්මා කාලේන, චීවරේනතං අච්ඡාදෙස්සතී'ති.චීවරත්ථිකේන භික්ඛවේ, භික්ඛුනා වෙය්‍යාවච්චකරෝ උපසඞ්කමිත්වා ද්වත්තික්ඛත්තුං චෝදේතබ්බෝ සාරේතබ්බෝ: 'අත්ථෝ මේ ආවුසෝ චීවරේනා'ති. ද්වත්තික්ඛත්තුං චෝදයමානෝ සාරයමානෝ තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඉච්චේතං කුසලං. නෝ චේ අභිනිප්ඵාදෙය්‍ය, චතුක්ඛත්තුං, පඤ්චක්ඛත්තුං, ඡක්ඛත්තුපරමං තුණ්හීභූතේන උද්දිස්ස ඨාතබ්බං. චතුක්ඛත්තුං, පඤ්චක්ඛත්තුං, ඡක්ඛත්තුපරමං තුණ්හීභූතෝ උද්දිස්ස තිට්ඨමානෝ තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඉච්චේතං කුසලං, තතෝ චේ උත්තරිං වායමමානෝ තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං. නෝ චේ අභිනිප්ඵාදෙය්‍ය යතස්ස චීවරචේතාපන්නං ආභතං තත්ථ සාමං වා ගන්තබ්බං දූතෝ වා පාහේතබ්බෝ: 'යං ඛෝ තුම්හේ ආයස්මන්තෝ භික්ඛුං උද්දිස්ස චීවරචේතාපන්නං පහිණිත්ථ, න තං තස්ස භික්ඛුනෝ කිඤ්චි අත්ථං අනුභෝති, යුඤ්ජන්තායස්මන්තෝ සකං මා වෝ සකං විනස්සා'ති. අයං තත්ථ සාමීචි.**

*රජ, රජ ඇමැති, බමුණු, ගොවි යනාදි මොවුන්ගෙන් කෙනෙක් මේ මුදලින් සිවුරක් මිලදී ගෙන අසවල් භික්ෂුවට දෙවයි කියා දූතයකු අත සිවුරු මිලක් එවයි. දූතයා ද භික්ෂුව වෙත අවුත් "වහන්ස ! ඔබ උදෙසා මේ සිවුරු මිළය ගෙනෙන ලදි මෙය පිළිගනු මැනවැ"යි කියයි. එවිට ඒ භික්ෂුව විසින් "මිත්‍රය අපි සිවුරු මිළ නොපිළිගනිමු. අවශ්‍යවූ විටක දී සිවුරක් පිළිගන්නෙමුයි" කිය යුතුවෙයි. ඉදින් ඒ දූතයා ඔබවහන්සේගේ කිසියම් කැපකරුවෙකු ඇත්දැයි විචාරණ ලද නම් ඉන් ප්‍රයෝජන ඇති භික්ෂුව ආරාමිකයෙකු හෝ උපාසකයෙකු මොහු අපගේ කැපකරු යැයි දැක්විය යුතුයි. දූතයා ද ඔහු සිවුරු ගෙන දෙන බවට ගිවිස්වා භික්ෂුව වෙත ද ගොස් "වහන්ස ! ඔබ*

*දැක්වූ කැපකරුවා සිවුරු ගෙනදෙන බවට ගිවිස ගන්නා ලදි. අවශ්‍යවූ විටක එහි යනු මැනව. ඔහු සිවුරු ගෙන දේවි" යැයි කියයි. ඉන් ප්‍රයෝජන ඇති භික්ෂුව කැපකරු කරා ගොස් (එක් වරකින් නොදේ නම්) දෙතුන් වරක් ඉල්විය යුතුය. එය සිහි කරවිය යුතුය. දෙතුන් වර ඉල්ලද්දී සිවුරු සැපයේ නම් මැනවි. නොඑසේනම් සවැනි වර දක්වා එහි ගොස් නිශ්ශබ්දව සිටිය යුතුය. මෙසේ සිවුරු උදෙසා සිටින කල්හිත් නොලැබේ නම් සත්වැනි වරද වෑයම් කරන්නාට ලැබෙන සිවුර නිසදිය යුත්තේය. (ඉල්වීමෙනුත් උදෙසාසිටීමෙනුත්) සිවුරු නොලැබූ භික්ෂුව සිවුරු මිළ එවූ අය වෙත ගොස් හෝ දූතයෙකු හෝ යවා 'ඔබ අප වෙත එවූ සිවුරු මිළයෙන් වැඩක් නොවීය. එය ගෙන්වා ගනිත්වා'යි (සිවුරු මිල හෝ ඔවුනගේ ශ්‍රද්ධාව හෝ විනාශවනු නොකැමති භික්ෂුව විසින්) දැන්විය යුත්තේය. මේ ඒ පිළිබඳ පිළිවෙතයි.*

දූතයා කැපකරුවකු විමසුවේ නම් කැපකරැවකු පෙන්විය හැකිය.('ඔහුට දෙන්න' යැයි කිව නොහැක) එවිට එම දූතයා කැපකරුවාට මුදල් දී භික්ෂුවට කැමති විටෙක කැපකරුගෙන් සිවුරක් ඉල්ලා ගන්න යැයි කියයි නම් භික්ෂුවට අවශ්‍ය වූ විටෙක තුන්වරක් දක්වා ගොස් මතක් කල හැකිය. එය එසේ නොලැබුණි නම් සය වරක් දක්වා ගොස් නිහඬව නිවස ඉදිරියේ සිටගෙන සිටිය හැකිය. ඊට වඩා වැයම් කොට සිවුරක් ලබා ගතහොත් නිසැගි පචිති වේ. එසේත් සිවුර නොලැබුනහොත් ඒ සිවුරු මිලය එවූ පුද්ගලයා වෙත ඒ බව දන්වා යැවිය යුතුය.

**<u>අකප්පිය වස්තු</u>**




- රන් රිදී
- මුදල්

- මුතු, මැණික්, වෙරළු
- සංක, සිලා
- පවාලං, ලොහිතංකො
- මසාර ගල්වා
- *සප්ත ධාන්‍ය*
- දාස දාසීන්
- කෙත්වතු
- එළුවන්, ගවයන්

සප්ත ධාන්‍ය

| | |
|---|---|
| සාලි | ඇල් වී |
| වීහි | වී |
| යව | බාර්ලි |
| ගෝධූම | තිරිඟු |
| කංගු | තණහාල් |
| වරක | වරක නම් ධාන්‍ය |
| කුද්‍රූසක | කුරක්කන් |

# කෝසිය වර්ග

## 30. පඨම ශික්ෂාපදය

**යෝ පන භික්ඛු කෝසියමිස්සකං සන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් කෝසෙය්‍ය නූල්( පටනූල් ) මිශ්‍ර කිරීමෙන් එළුලොම් ඇතිරියක් කරවන්නේ නම් (ඔහු හට) නිසඟි පචිති වෙයි.*

### ආපත්ති

එක් කොසොයය කෙන්දක් හෝ මිශ්‍ර කර හැදීමෙන් නිසැගි පචිති වේ.

අනුන් සෑදූ එකක් පාවිච්චි කිරීමේදී දුෂ්කට වේ.

## 31. සුද්ධකාලක ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සුද්ධකාළකානං ඒළකලෝමානං සන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් හුදු කළු එළුලොම් වලින් (පමණක්) ඇතිරියක් කරවන්නේ නම් (ඔහු හට) නිසඟි පචිති වෙයි.*

## 32. ද්වෙභාග ශික්ෂාපදය

**නවං පන භික්ඛුනා සන්ථතං කාරයමානේන ද්වේ භාගා සුද්ධකාළකානං ඒළකලෝමානං ආදාතබ්බා, තතියං ඕදාතානං, චතුත්ථං ගෝචරියානං. අනාදා චේ භික්ඛු ද්වේ භාගේ සුද්ධකාළකානං ඒළකලෝමානං තතියං ඕදාතානං, චතුත්ථං ගෝචරියානං නවං සන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*අළුත් ඇතිරියක් කරවන භික්ෂුව විසින් (ඊට අවශ්‍ය ප්‍රමාණයෙන්) දෙකොටසක් කළු එළුලොම් ද තුන් වෙනි කොටස සුදු එළුලොම් හා සිවු වැනි කොටස පඬුවන් එළුලොම් ද ගත යුතුය. මේ නියමය ඉක්මවා අළුත් ඇතිරියක් කරවන්නේ නම් (ඔහු හට) නිසඟි පචිති වෙයි.*

## 33. ඡබ්බස්ස ශික්ෂාපදය

**නවං පන භික්ඛුනා සන්ථතං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරේතබ්බං. ඕරේන චේ ඡන්නං වස්සානං තං සන්ථතං විස්සජ්ජෙත්වා වා අවිස්සජ්ජෙත්වා වා අඤ්ඤං නවං සන්ථතං කාරාපෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං.**

*අළුත් ඇතිරියක් කරවූ භික්ෂුව විසින් එය සය අවුරුද්දක් පාවිච්චි කළ යුතුය. ඉදින් ඒ ඇතිරිය කිසිවෙකුට දී හෝ නොදී හෝ සංඝයාගේ කැමැත්තක් නැතිව ඉන් මෙපිට නැවත අළුත් ඇතිරියක් කරවන භික්ෂුවට නිසඟි පචිති වෙයි.*

## 34. නිසීදන සන්ථත ශික්ෂාපදය

**නිසීදනසන්ථතං පන භික්ඛුනා කාරයමානේන පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථි ආදාතබ්බා දුබ්බණ්ණකරණාය, අනාදාචේ භික්ඛු පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං නවං නිසීදනසන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*නිසීදනසන්ථතයක් කරවන භික්ෂුව විසින් එය දුර්වර්ණ කිරීම පිණිස පරණ ඇතිරියෙන් සුගත් වියතක් පමණ කොටසක් හාත්පසින් ගත යුතුය (සෑම පැත්තෙහිම ඇල්විය යුතුය). මෙසේ පරණ ඇතිරියෙන් කොටසක් නොයොදා අළුත් ඇතිරියක් කරවන භික්ෂුවට නිසඟි පචිති වෙයි.*

## 35. එළකලොම ශික්ෂාපදය

**භික්ඛුනෝ පනේව අද්ධානමග්ගපටිපන්නස්ස ඒළකලෝමානි උප්පජ්ජේය්‍යුං, ආකඞ්ඛමානේන භික්ඛුනා පටිග්ගහේතබ්බානි, පටිග්ගහෙත්වා තියෝජනපරමං සහත්ථා හරිතබ්බානි, අසන්තේ හාරකේ, තතෝ චේ උත්තරිං හරෙය්‍ය අසන්තේපි හාරකේ, නිස්සග්ගියං පාචිත්තියං.**

*මගට පිළිපන් භික්ෂුවකට එළුලොම් ලැබ කැමති නම් එය පිළිගත හැකිය. ගෙන යෑමට කැපකරුවෙකු නැති නම් තුන් යොදුනක් සිය අතින්ම ගෙනගිය හැකිය. කැපකරුවෙකු නැතිව එය ඉක්මවා සියතින්ම එළුලොම් ගෙනයන භික්ෂුවට නිසගි පචිති වෙයි.*

## 36. එළකලොම ධොවාපන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා ඒළකලෝමානි ධෝවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා විජටාපෙය්‍ය වා, නිස්සග්ගියං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් නොනෑවූ භික්ෂුනියක ලවා එළුලොම් සෝදවා නම් සායම් කරවා නම් හෝ අවුල් හරවා නම් (ඔහු හට) නිසගි පචිති වෙයි.*

## 37. රූපිය ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ජාතරූපරජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් රන් රිදී ගනී ද අනෙකෙකු ලවා ගන්වා ද ගෙනැවිත් තබන ලද්දක් හෝ සිතින් ඉවසා ද (ඔහු හට) නිසගි පචිති වෙයි.*

### අර්ථ

| | | |
|---|---|---|
| උගගණෙහයා | තමාම ගැනීම | නිසැගි පචිති |
| උගගණහාපෙයා | අනුන් ලවා ගැනීම | |
| උපනිකඛිතතං වා සාදියෙයා | ළඟ තැබූවිට ඉවසීම | |

<u>නිසැගි වූ වස්තුව නිස දෙසන ආකාරය</u>

නිසැගි වූ වස්තුව සඝ මැදට ගෙනැවිත් සිවුර ඒකාංශ කොට වැඩිහිටි භික්ෂූන් වහන්සේගේ පා වැද උත්කුටියෙන් හිද ‘අහං භනෙත රූපියං පටිගගහෙසිං ඉදං මෙ නිසසගගියං, ඉමාහං සංඝසස නිසසජාමි‘ ලෙස කියා බැහැර කර ආපත්ති දේශනා කල යුතුය.

<u>නිසැගි වූ වස්තුවට කල යුතු දේ</u>

එය කැපකරුවකුට පෙන්විය හැකි නමුදු මෙයින් අසවල් දේ ගෙන එන්න යැයි නොකිව යුතුය. ‘ සංඝයාට මේ මේ දේ අවශ්‍යව ඇත‘ යැයි කිව හැකිය. ඉදින් කැපකරුවා ඒ මුදලින් ගිතෙල්, මී පැණි ආදී යමක් ගෙන ආවේ නම් මුදල් පිළිගත් භික්ෂුවට හැර අනෙක් අයට ඒවා පරිභෝග කල හැකිය.

කැප කරුවකු නොමැතිවිට සතර අගතියට නොයන අයකු රූපිය ඡඩ්ඩක (මුදල් විසි කරන්නා) ලෙස සම්මත කර එම භික්ෂුව එම මුදල නිමිත්තක් නොකොට විසි කල යුතුය.

**ආපත්ති**

මුදල් පිළිගත් භික්ෂුවක් එම මුදලින් ගෙනෙන යම් දෙයක් (නිස්සජ්ජනය නොකොට) සියළු භික්ෂූන්ට අකැපය

සංඝයා වෙනුවෙන් යම් භික්ෂුවක් මුදල් ඉවසීමෙන් භික්ෂුවට දුෂ්කට වන අතර මුදල සංඝයාටම අකැපය.

රන්, රිදී, මුදල් ආදිය දැන, නොදැන හෝ සැකෙන් (විමතියෙන්) පිළිගැනීමෙන් නිසැගි පචිති වේ.

## 38. රූපිය සංවොහාර ශික්ෂාපදය

**යෝ පන භික්ඛු නානප්පකාරකං රූපියසංවෝහාරං සමාපජ්ජෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් නොයෙක් අයුරෙන් මුදල් ගණුදෙනු කෙරේනම් (ඔහු හට) නිසැගි පචිති වෙයි.*

**අර්ථ**

රූපිය සංවොහාරං — රන් රිදී මුදල් වර්ග හුවමාරු කිරීම හෙවත් ඒවා දී වෙනත් භාණ්ඩ ගැනීම.

යම් භික්ෂුවක් මුදල් දී පාත්‍රයක් ආදී භාණ්ඩයක් ගත්විට එය සංඝයාටම අකැපය.

මුදල් ⟷ රත්රන්, මැණික්, සිවුරු = නිසැගි පචිති

## 39. කය විකකය ශික්ෂාපදය

**යෝ පන භික්ඛු නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් පාසිවුරු ආදි අනෙකුත් දැයෙන් නොයෙක් ගණුදෙනු කෙරේ නම් නිසැගි පචිති වෙයි.*

**අර්ථ**

කය විකකය — කැප භාණ්ඩ හුවමාරුව

### ආපත්ති

මෙහිදී මේවා අරගෙන ඕවා දෙන්න ආදී ලෙස භාණ්ඩ හුවමාරුව මෙයින් අගවයි. අඩුම තරමින් දැහැට්ටක් වුවද මෙයාකාරයෙන් හුවමාරු කිරීමේදී ඇවැත් වේ.
මව්පියන් සමග වුවද වුවද මෙයාකාරයෙන් හුවමාරු කිරීමේදී  ඇවැත් වේ.

දාසයෙකුට 'මේ බත්ටික කාලා අර වැඩේ කරන්න' යැයි කිවහොත් දුෂ්කට වේ.

### අනාපත්ති

පංච සහධාර්මික අය සමග හුවමාරුව කමක් නැත

යම් භාණ්ඩයක අගය විමසීම

කැපකරුවකු ලවා භාණ්ඩ හුවමාරු කරවා ගැනීම

## පත්ත වර්ග

### 40. පතත ශික්ෂාපදය

**දසාහපරමං අතිරේකපත්තෝ ධාරේතබ්බෝ, තං අතික්කාමයතෝ නිස්සග්ගියං පාචිත්තියං.**

*දස දිනක් උපරිම කොට අතිරේක පාත්‍රයක් දැරිය හැකිය. එය ඉක්මවන්නාවූ භික්ෂුවට නිසගි පචිති වෙයි.*

එය සංඝයා ඉදිරියේ නිස්සජ්ජනය කල යුතුය.එනම් සියළුම සවාමීන් වහන්සේලා වැඩිහිටි පිළිවෙලින් වඩා හිඳුවා එම අළුත් පාග්‍රය මහ තෙරුන් වහන් සේට දිය යුතුය. මහ තෙරුන් වහන්සේගේ පාත්‍රය ඊළග තෙරුන් වහන්සේට දිය යුතුය. මේ ආකාරයට අන්තිමට කෙලවරේම ඉතිරිවන දුබලම පාත්‍රයදී ' බිදෙන තෙක් මෙය පරිහරණය කරවයි' කියා වරද කල භික්ෂුවට දිය යුතුය.

<u>කැප පාත්‍ර වර්ග</u>

මැටි පාත්‍රය


යකඩ පාත්‍රය

**<u>කැප පාත්‍ර ප්‍රමාණය (09)</u>**

උක්කුට්ට උක්කුට්ට

උක්කුට්ට

උක්කුට්ට ඕමක




උක්කුට්ට - මගධ නැලි 02ක සහල් පිස එයට සරිලන ව්‍යංජන දැමූවිට මුවවිට තෙක් පිරෙන පාත්‍රය

මජ්ඣිම උක්කුට්ට

මජ්ඣිම

මජ්ඣිම ඕමක




මජ්ඣිම - මගධ නැලි 01ක සහල් පිස එයට සරිලන ව්‍යංජන දැමූවිට මුවවිට තෙක් පිරෙන පාත්‍රය

ඕමක උක්කුට්ට

ඕමක

ඕමක ඕමක



ඕමක - මගධ නැලි 1/2ක සහල් පිස එයට සරිලන ව්‍යංජන දැමූවිට මුවවිට තෙක් පිරෙන පාත්‍රය

» මෙයින් උක්කුට්ට උක්කුට්ට හා ඕමක ඕමක පාත්‍ර අකැපය.

» මගධ නැලිය යනු පලම් 12 ½ කි. එනම් මැදුම් පිරිමිනියක්හු අතින් අට පතකි. එයින් 1 **දී** සිංහල නැලියෙකි.

<u>පාත්‍ර අධිෂ්ඨානය</u>

යකඩ පාත්‍රයක් කම් 05 වාරයක් ද, මැටි පාත්‍රයක් නම් 02 වාරයක්ද තෙල් අල්වා

<u>පාත්‍රය ළඟ ඇතිවිට</u>

'ඉමං පතතං අධිටඨාමි' යනුවෙන් කයින් ස්පර්ෂ කරමින් වචනයෙන් තෙවරක් කිව යුතුය.

<u>පාත්‍රය ළඟ නැතිවිට</u>

'එතං පතතං අධිටඨාමි' යනුවෙන් වචනයෙන් තෙවරක් කිව යුතුය.

## පාත්‍ර විකල්පනය

'ඉමං පතතං තුයිහං/ තුමහං විකපෙපමි'
(බාල)/(වැඩිමහල්)

## නිසැගි වූ පාත්‍රයේ නිස දෙසන ආකාරය

නිසැගි වූ පාත්‍රය ගෙන තවත් භික්ෂුවක් වෙත ගොස් උත්කුටියෙන් හිඳ ' ඉදං මෙ භනෙත පතතං දසාහතිකකනතං නිසසගගියං ඉමාහං ආයස්මතො නිසසජාමි' යනුවෙන් කියා එම භික්ෂුව ආපත්ති දේශනා කරගත යුතුය.

අනෙක් භික්ෂුව ' ඉමං පතතං ආයස්මතො දමමි' යනුවෙන් කියා නැවත පාත්‍රය ලබා දිය යුතුය. මෙය නැවත නොදී ඉදීමෙන් දුෂ්කට වේ.

## පාත්‍රවල අධිෂ්ඨාන බිදෙන ආකාරය

පච්චුද්ධරණය කිරීමෙන්
අනුන්ට දීමෙන්
විශ්වාසයෙන් ගැනීමෙන්
උපසම්පදාව ප්‍රතික්ෂේප කිරීමෙන්
ලිංග පරිවර්තනය වීමෙන්
පැහැර ගැනීමෙන්
ගිහි බවට පත් වීමෙන්
කාලක්‍රියා කිරීමෙන්
විනාශවීමෙන්
තණහාල් ඇටයක් පමණට සිදුරක් සෑදීමෙන්

## 41. ඌන පඤ්ච ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ඌනපඤ්චබන්ධනේන පත්තේන අඤ්ඤං නවං පත්තං චේතාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං. තේන භික්ඛුනා සෝ පත්තෝ භික්ඛුපරිසාය නිස්සජ්ජිතබ්බෝ. යෝ ච තස්සා භික්ඛුපරිසාය පත්තපරියන්තෝ, සෝ තස්ස භික්ඛුනෝ පදාතබ්බෝ: 'අයං තේ භික්ඛු පත්තෝ, යාව භේදනාය ධාරේතබ්බෝ'ති. අයං තත්ථ සාමීචි.**

*යම් භික්ෂුවක් පිළියම් පහකට වඩා අඩු පාත්‍රයක් තිබිය දී අළුත් පාත්‍රයක් ඉල්වාගනී නම් ඔහු හට නිසගි පචිති වෙයි. ඒ භික්ෂුව විසින් ඉල්ලාගත් පාත්‍රය භික්ෂූන් හමුවෙහි නිසදිය යුත්තේය. භික්ෂූහු ද තම පිරිසෙන් (තෝරාගැනීමෙන් පසු) ඉතිරි වූ අන්තිම පාත්‍රය දෙමින් 'මෙය ඔබගේ පාත්‍රයයි බිඳෙන තුරු පාවිච්චි කළ මැනවැ'යි කිය යුත්තේය. මේ පාත්‍රය නිසඳීමේ පිළිවෙතයි.*

## 42. භෙසජ්ජ ශික්ෂාපදය

**යානි ඛෝ පන තානි ගිලානානං භික්ඛූනං පටිසායනීයානි භේසජ්ජානි සෙය්‍යථීදං: සප්පි, නවනීතං, තේලං, මධු, ඵාණිතං; තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි, තං අතික්කාමයතෝ, නිස්සග්ගියං පාචිත්තියං.**

*ගිලන් භික්ෂුවක් විසින් අනුභව කටයුතුවූ ගිතෙල්, වෙඬරු, තලතෙල්, මීපැණි, උක්හකුරු යන පස් බෙහෙත් පිළිගෙන සත්දිනක් තුළ සුරක්ෂිතව තබාගෙන අනුභව කළ හැකිය. සත් වැනි දින ඉක්මවන භික්ෂුවට නිසගි පචිති වෙයි.*

<u>පංච භේසජ්ජ</u>

| | |
|---|---|
| සප්පි | ගිතෙල් (මස් කැප සතුන්ගේ ගිතෙල් - එළ ගිතෙල්, එළු ගිතෙල්, මී ගිතෙල් ) |
| නවනීත | එම කැප සතුන්ගේ වෙඬරු (බටර්) |
| තේල | තලතෙල් (මස් කැප සතුන්ගේ තෙල්-අබතෙල්, වසාතෙල්, මී තෙල්, එරඬු තෙල්) |
| මධු | මී පැණි (මකඛිකා මධුමේව) |
| ඵාණිත | උක්පැණි (මාතිකා අටුවා 76 පිට) |

<u>අකැප මස් වර්ග</u>

මනුෂ්‍ය

සර්ප

සුනක

ව්‍යාඝ්‍ර

අලි

කොටි

වලස් ආදී දරුණු සතුන්

- නිසැගි වූ භේසජජ කිසිම භික්ෂුවකට වැලදිය නොහැක.
- නිසැගි වූ භික්ෂුවට හැර අනෙක් භික්ෂූන්ට ඇග ගැල්වීමට කැපය.

## අනාපත්ති

දින 07ක් ඇතුලත බැහැර කිරීම

අනුපසම්පන්නයෙකුට අපේක්ෂා රහිතව දී නැවත ලැබුනහොත් පරිභෝග කිරීමෙන්

## 43. වස්සික සාටික ශික්ෂාපදය

**මාසෝ සේසෝ ගිම්හානන්ති, භික්ඛුනා වස්සිකසාටිකචීවරං පරියේසිතබ්බං, අද්ධමාසෝ සේසෝ ගිම්හානන්ති, කත්වා නිවාසේතබ්බං. ඕරේන චේ මාසෝ සේසෝ ගිම්හානන්ති, වස්සිකසාටිකචීවරං පරියේසෙය්‍ය, ඕරේනද්ධමාසෝ සේසෝ ගිම්හානන්ති, කත්වා නිවාසෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*ග්‍රීෂ්ම ඍතුවේ අන්තිම මාසය තුළ වැසි සළුවක් සොයාගත යුතුය. එම ඍතුවේම අන්තිම අඩමස තුළ පටන් එය පාවිච්චි කළ හැකිය. ඉන් මෙපිට වැසි සළුවක් සොයන්නා හට ද පරිභෝග කරන්නා හට ද නිසගි පචිති වෙයි.*

<u>වැසි සළුව සෙවීම</u>

දායකයින්ගෙන් ඍජුව නැතිව පරියායෙන් ඉල්ලිය හැකිය.(වෙන මිනිසුන් නම් මේ කාලයට වැසි සළු පූජා කරනවා)

චීවර හා පිණ්ඩපාත පරියායෙන් ඉල්ලිය නොහැක.

<u>කුවජී සමය</u> (වැසි සළු සොයන කාලය)

වැසි සළු සෙවීමට පටන්ගත් දා සිට අවසානය දක්වා වූ අවසන් වන කාල සීමාවයි. මෙය පොසොන් අව පැලවිය සිට ඉල් පෝය (කතතික පෝය) දක්වා වූ කාල සීමාව.

<u>පිටයී සමය</u>(වැසි සළු සෙවිය නොහැකි කාලය)

කත්තික අව පැලවිය සිට පොසොන් පෝය තෙක් කාල සීමාව
පිටයී සමයෙදී මව්පියන්ගෙන් වුවද වැසි සළු ඉල්ලීමෙන් නිසැගි පචිති වේ.

## 44. චීවර අච්ඡිනදන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුස්ස සාමං චීවරං දත්වා කුපිතෝ අනත්තමනෝ අච්ඡින්දෙය්‍ය වා අච්ඡින්දාපෙය්‍ය වා, නිස්සග්ගියං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් වෙනත් භික්ෂුවකට තමාම සිවුරක් දී පසුව එය නොසතුටු සිත්ඇතිව කුපිතව පැහැරගනී ද අනෙකෙකු ලවා හෝ පැහැර ගන්වා ද නිසගි පචිති වෙයි.*

## ආපත්ති

භික්ෂුවකගෙන් පචිති

සාමණේරයකුගෙන් දුෂ්කට

මෙම සිකපදය සිවුරක් සඳහා පමණක් වන අතර වෙනත් පරිෂ්කාර සඳහා දුෂ්කට වේ.

## 45. සුතතවිඤ්ඤත්ති ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායේහි චීවරං වායාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් තමාම නූල් ඉල්වාගෙන නෑ නොපැවරූ රෙදි වියන්නන් ලවා සිවුරක් වියවා ද ඔහු හට නිසගි පචිති වෙයි.*

## 46. මහා පෙසකාර ශික්ෂාපදය

**භික්ඛුං පනේව උද්දිස්ස අඤ්ඤාතකෝ ගහපති වා ගහපතානී වා තන්තවායේහි චීවරං වායාපෙය්‍ය. තත්‍ර චේසෝ භික්ඛු, පුබ්බේ අප්පවාරිතෝ තන්තවායේ උපසඞ්කමිත්වා චීවරේ විකප්පං ආපජ්ජෙය්‍යඃ 'ඉදං ඛෝ ආවුසෝ චීවරං මං**

**උද්දිස්ස වීයති, ආයතඤ්ච කරෝථ, විත්ථතඤ්ච අප්පිතඤ්ච සුවීතඤ්ච සුප්පවායිතඤ්ච සුවිලේඛිතඤ්ච සුවිතච්ඡිතඤ්ච කරෝථ; අප්පේව නාම මයම්පි ආයස්මන්තානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමා'ති. ඒවඤ්ච සෝ භික්ඛු වත්වා කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍ය අන්තමසෝ පිණ්ඩපාතමත්තම්පි, නිස්සග්ගියං පාචිත්තියං.**

*තො නැවූ ගෘහපතියෙක් හෝ ගෘහනියක් යම් කිසි භික්ෂුවක් උදෙසා වියන්නන් ලවා සිවුරක් වියවයි. (දායකයන්) ඒ භික්ෂුව සිවුරින් නොපවරනලද්දේම වියන්නන් කරා ගොස් "මේ සිවුර වියන්නේ මා සඳහාය. එහෙයින් දිගු කරවු! පළල් කරවු! ඝනව නූල් එලාලවු! නූල් සමසේ එලාලවු! හොඳින් මැද වියවු! අප ද තොපට යමක් දෙන්නෙමු" යි එහිලා අධික විධානයට පැමිණියේ යටත් පිරිසෙයින් පිණ්ඩපාත පමණකුත් ඒ සඳහා දුන්නේ නම් නිසගි පචිති වෙයි.*

## 47. අචෙචක චීවර ශික්ෂාපදය

**දසාහානාගතං කත්තිකතේමාසිකපුණ්ණමං, භික්ඛුනෝ පනේව අච්චේකචීවරං උප්පජ්ජෙය්‍ය, අච්චේකං මඤ්ඤමානේන භික්ඛුනා පටිග්ගහේතබ්බං, පටිග්ගහෙත්වා යාව චීවරකාලසමයං නික්ඛිපිතබ්බං. තතෝ චේ උත්තරිං නික්ඛිපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**

*වස් පවාරණයට දස දිනක් තබා භික්ෂුවකට ඉක්මන් කටයුත්තක් සඳහා පුදන ලද සිවුරක් ලැබේ. ඒබව දත් භික්ෂුව විසින් පිළිගත යුත්තේය. එසේ පිළිගෙන (නොඉවා) සිවුරුකරන කාලය පැමිණෙන තෙක් උපරිම කොට තැබිය හැකිය. ඉන් මත්තෙහිත් තබා ගන්නා භික්ෂුවට නිසගි පචිති වෙයි.*

### අර්ථ

| | |
|---|---|
| අචෙචක චීවරං | යුධ සේනාවට යන අයෙක්, ගිලන් අයෙක්, ගර්භණී මාතාවක්, හදිසියේ ශ්‍රද්ධාව ලද අයකු විසින් වස් පවාරණයට කලින් දෙන වස් ආවාසික සිවුරුය. |
| කතතික තෙමාසික පුණණමං | වප් පොහොය හෙවත් පෙරවස් පවාරණය කරන පොහොයයි. |

## 48. සාසංක ශික්ෂාපදය

**උපවස්සං ඛෝ පන කත්තිකපුණ්ණමං යානි ඛෝ පන තානි ආරඤ්ඤකානි සේනාසනානි සාසඞ්කසම්මතානි සප්පටිභයානි, තථාරූපේසු භික්ඛු සේනාසනේසු**

**විහරන්තෝ ආකඞ්ඛමානෝ තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරේ නික්ඛිපෙය්‍ය. සියා ච තස්ස භික්ඛුනෝ කෝචිදේව පච්චයෝ තේන චීවරේන විප්පවාසාය, ඡාරත්තපරමං තේන භික්ඛුනා තේන චීවරේන විප්පවසිතබ්බං. තතෝ චේ උත්තරිං විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං.**

*සැක කටයුතු වූ ද භය සහිත වූ ද ආරණ්‍ය සේනාසනයක වාසය කරන භික්ෂුව සොරු ආදීන්ගෙන් භය සහිත නම් පෙර වස් වැස ඉල්මස මැදි පොහොය දක්වා කාලය තුළ තුන් සිවුරෙන් එකක් ඇතුළු ගමෙහි තැබිය හැකිය. මෙබඳු අවස්ථාවක තුන් සිවුරෙන් වෙන්ව සිටිනු කැමති භික්ෂුව විසින් එසේ විසිය යුත්තේ රෑ සයක් පමණි. සංඝයාගේ නියමයක් නැතිව ඉන් මත්තෙහින් තුන් සිවුරෙන් වෙන්ව වසන භික්ෂුවට නිසගි පචිති වෙයි.*

## 49. පරිණත ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනෝ පරිණාමෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.**


*යම් භික්ෂුවක් සංඝයාට පිරිනමන ලද්දක් දැන දැන තමාට පිරිනමාගනී නම් නිසගි පචිති වෙයි.*

### අර්ථ

අතතනො පරිනාමෙයා තමාට පවරා ගැනීම

වෙනත් දෙයකට හෝ වෙනත් අයෙකුට පූජා කරන දෙයක් තමාට පවරා ගතහොත් දුෂ්කට වේ.

# පාචිත්තිය වර්ගය (92)




## මුසාවාද වර්ගය

### 50. මුසාවාද ශික්ෂාපදය

**සම්පජාන මුසාවාදේ, පාචිත්තියං.**

***දැන දැන බොරු කීමෙහි පචිති වෙයි.***

චේතනාව අනුන් රැවටීමේ අදහස ඇතිකරගෙන කයින් හෝ වචනයෙන් අනුන්ට යමක් අවබෝධ කරවීම සම්පජාන මුසාවාදයයි.

<u>සමපජාන මුසාවාදයෙන් වියහැකි වෙනත් ඇවැත්</u>

» නැති උතුරු මිනිස් දම් ප්‍රකාශ කර අසන්නා දැනගත්තේ නම් පාරාජිකා වේ.

» අමූලක පාරාජිකාවකින් චෝදනා කිරීම සංඝාදිසේස වේ.

» උතුරු මිනිස් දම් ප්‍රකාශ කිරීමේදී අසන්නා තේරුම් නොගතහොත් ථුල්ලැසි වේ.

» අමූලක සංඝාදිසේසයකින් චෝදනා කලේ නම් පචිති වේ.

» දැන දැන බොරු කීමෙන් පචිති වේ.

» උපෝසථාගාරයේදී පිරිසිදු බව අසනවිට අපිරිසිදුව සිට නිහඬව සිටීම දුෂ්කට වේ.

**අනාපත්ති**

| | |
|---|---|
| දවා භණති | හදිස්සියේ කීම |
| රවා භණති | කියන්නට ගිය දෙය නොව වෙනකක් කියවීම |

## 51. ඕමසවාද ශික්ෂාපදය

**ඕමසවාදේ, පාචිත්තියං.**

*ජාතිය කුලය ආදිය ගටා බිණීමෙහි පචිති වේ.*

**අර්ථ**

ඕමසවාද යම් වචනයක් කන හා හදවත විදින්නාක් මෙන් දැනෙන ජාති, නාම, ගෝත්‍ර, කර්මාන්ත, කමම, ශිල්ප, ආභාධ, ලිංග, කිලේස, ආපත්ති, ආක්‍රෝස ආදී දසවිධ ආක්‍රෝස වස්තුවලින් ගටා වචනයෙන් හෝ ඉගියෙන් භික්ෂුවක් භික්ෂුවකට ගැරහීමෙන් පචිති වේ.

**ආපත්ති**

| | |
|---|---|
| භික්ෂුවක් භික්ෂුවකට ගැරහීමෙන් | පචිති |
| භික්ෂුවක් අනුපසම්පන්නයෙකුට ගැරහීමෙන් | දුෂ්කට |
| අනුපසම්පන්නයෙක් භික්ෂුවකට ගැරහීමෙන් | නාසනායකයකු වේ |

**අනාපත්ති**

අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නන් හට

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ට/ ආදිකම්මික

## 52. භිකඛුපෙසුඤ්ඤ ශික්ෂාපදය

**භික්ඛු පේසුඤ්ඤේ, පාචිත්තියං.**

*භික්ෂූන් අතර සමගිය බිඳෙන අයුරු කේලාම් කීමෙහි පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| පෙසුඤ්ඤ | සමගි අය භින්න කිරීමට |

**ආපත්ති**

| | |
|---|---|
| භික්ෂුවක් භික්ෂුවකගෙන් අසා භික්ෂුවකට කීම | පචිති |
| භික්ෂුවක් භික්ෂුවකගෙන් අසා අනුපසම්පන්නයෙකුට කීම | දුෂ්කට |

<u>කේලාම් කීමේ අවශ්‍යතාවය</u>

» කෙනෙකු සමග මිත්‍රවීමේ කැමැත්ත

» දෙදෙනකු බිඳුවීමේ අදහස

## 53. පදසොධම්ම ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අනුපසම්පන්නං පදසෝ ධම්මං වාචෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් අනුපසම්පන්නයෙකු හා පාළි ධමය පදයෙන් පදය උසුරුවා (කියවා ද) පචිති වේ.*

| | |
|---|---|
| පාළි ධර්මය | බුද්ධ භාෂිත, ශ්‍රාවක භාෂිත, ඉසි භාෂිත, දේව භාෂිත |

මෙම පාළි ධර්මයේ පදයක්(ගාථාවක මුල් පදය), අනුපදයක්(ගාථාවක දෙවන පදය), අනු අක්ෂරයක්(එක අකුරක්), අනු ව්‍යංජනයක්(එක වචනයක්) එකට කීමෙන් පචිති වේ.

## 54. සහසෙය්‍ය ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අනුපසම්පන්නේන උත්තරිං දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් අනුපසම්පන්නයෙකු හා දෙතුන් රැයකට වඩා එක සෙනසුනක වෙසේ ද පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| සෙය්‍යාව | රාත්‍රී කාලයේ ඒකඋපචාර කුටියක දෙදෙනාම සයන ඉරියව්වට පත්වීම |
| ඒක උපචාර | එක් දොරකින් ඇතුළු වී යම්තාක් දුර යා හැකි ප්‍රමාණය |

**ආපත්ති**

බිත්ති නැති ශාලාවල අනුපසම්පන්නයකු සමග සිටීනම් දුෂ්කට වේ.

**ආපත්ති**

අනුපසම්පන්නයකු සමග රාත්‍රී 03ක් දක්වා

අරුණට කලින් නැගිටීමෙන්

දවල් වරුව සිටීමෙන්

### 55. දුතිය සහසෙය්‍ය ශික්ෂාපදය

**යෝ පන භික්ඛු මාතුගාමේන සහසෙය්‍යං කප්පෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් ස්ත්‍රියක සමග එක සෙනසුනක වෙසේ නම් පචිති වේ.*

**ආපත්ති**

මාගම සමග රාත්‍රී කාලයේ එක වහලක් යට එකට නිදාගත් සැනින් ඇවත සිදුවේ.

යක්ෂනිය/ ප්‍රේතිය/ තිරිසන් මාගමුන් සමග සයනය කිරීමෙන් දුෂ්කට වේ.

කීපවාරයක් නැගිට නැගිට නිදාගැනීමෙන් එක එක වාරයක් පාසා ඇවැත් වේ.

සිටින ස්ත්‍රීන් ගණනට ඇවැත් වේ.

### 56. ධම්මදෙශනා ශික්ෂාපදය

**යෝ පන භික්ඛු මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දේසෙය්‍ය අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහේන, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් නුවණැති මිනිසෙකු නැතිව හුදෙකලාව සිටි ස්ත්‍රියකට වචන හතර පහකට වඩා බණ කියා නම් පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| ඡපපඤ්ඤ වාචාහි | නුවණැති පුරුෂයකු ළග නැතිවිට මාගමකට වචන 5-6 කට වඩා ධර්මය නොකිව යුතුය. |

**අනාපත්ති**

වචන 6ක් දේශනා කර නැගිට වාඩිවී නැවත වචන 6ක් දේශනා කල හැකිය

මාගමුන් පිරිසක් සිටිනවිට එක් අයකුට වචන 06 බැගින් දේශනා කල හැකිය.

මාගමක් විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් බොහෝ වචන දේශනා කල හැකිය.

## 57. භූතාරොචන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අනුපසම්පන්නස්ස උත්තරිමනුස්සධම්මං ආරෝචෙය්‍ය භූතස්මිං, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් අනුපසම්පන්නයෙකුට තමා කෙරෙහි වූ උතුරු මිනිස්දම් කියා ද පචිති වේ.*

### අර්ථ

භූතසමිං තමා තුල ඇති ධ්‍යාන මාර්ගඵලාදිය අනුපසම්පන්නයෙකුට කීම

### අනාපත්ති

පරිනිර්වාණයට ප්‍රථමයෙන්

කෙනෙක් ආයෝපවාදයෙන් ගැලවීමට

උපසම්පන්නයෙකුට කීමෙන්(ආයෝපවාදයෙන් ගැලවීමට පමණක්)

උම්මත්තක/ ඛිත්තචිත්ත/ වේදනට්ට/ ආදිකම්මික

## 58. දුට්ඨුල්ලාරොචන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නස්ස ආරෝචෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, පාචිත්තියං.**


*යම් භික්ෂුවක් වෙනත් භික්ෂුවක් පිළිබඳ වූ සඟවෙසෙස් ඇවතක් සඞ්ඝයාගේ නියමයක් නැතිව අනුපසම්පන්නයෙකුට කියා නම් පචිති වේ.*

පචිති ඇවතක් හෙළි කලහොත් දුෂ්කට වේ.

## 59. පඨවිඛණන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු පඨවිං ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් නොකැප පොළව සාරා ද අනෙකෙකු ලවා හෝ සාරවා ද පචිති වේ.*




<u>අජාත පඨවි</u>

තනිකර ගල් බොරළු වැලි සහිත පොලොව
වැඩිපුර තනිකර ගල් බොරළු වැලි සහිත පොලොව
පොලොව පිළිස්සීමෙන් පසු පොලොව
කැපූ පස් හෝ මැටි ගොඩක් තෙමී සාර මසක් ගතවන්නට පෙර පොලොව

**ආපත්ති**

ජාත පඨවි හෑරීමෙන් හැරවීමෙන් බිඳීමෙන් ඇගිල්ලෙන් සීරීමෙන් ගිනි ගොඩ ගසා පිච්චීමෙන් හෝ ඒ සඳහා අණ කිරීමෙන් පචිති වේ.

**අනාපත්ති**

වෙන් වූ කැඩුණු බිඳුණු පස් ගත හැකිය
අසිහියෙන් පොලොව සෑරීම, කොල කැඩීම අනාපත්ති වේ.

# භූතගාම වර්ගය

## 60. භූතගාම ශික්ෂාපදය

**භූතගාමපාතව්‍යතාය, පාචිත්තියං.**

*වැඩෙන ගහ කොල සිදීමෙන් විනාශ කිරීමෙන් පචිති වේ.*

භූතගාම ගස්, වැල්, මුල්

පුංචි දිය සෙවල වර්ග (තාප්පවල,වැව්වල, ගල්වල)

මූල බීජ (මුල්වලින් පැලවෙන- කහ, ඉගුරු)
ඛනධ බීජ (අතුවලින් පැලවෙන- මඤ්ඤොක්කා)
එළු බීජ (පුරුක්වලින් පැලවෙන- උණ, උක්)
අගග බීජ (ගසේ අගින් පැලවන- ලුණුවිල, ඉරිවේරිය,කදු තලා)
බීජ බීජ (වී ඇට, මුං, කව්පි)

මේවා සැදුණු පසු භූතගාම වේ.
ඉගුරු, සුදුළූණු වැනි(පැලවීමට පෙර) අලවර්ගද මුං, කව්පි වැනි ඇට වර්ගද කපා දමා ඇති අතු ආදියද විකොපනයෙන් දුක්කට වේ.

## අනාපත්ති

ගහක් කපන්න
මල් කඩන්න

කප්පියං කර පරිභෝජනය

- ගින්නෙන්, නියපොත්තෙන් හෝ සැතකින් හෝ ඉදිකටු ආදියකින් කැප කල හැකිය.
- ඇට වර්ග ගොඩක් ඇතිවිට සියල්ල එකට එකතු කොට ‘කප්පියං භනෙත‘ යයි තුන්වරක් කිව යුතුය.

අබීජං ලා බීජ(පැලවෙන තත්වයේ නැති)
නිබබටට බීජං ඇට ඉවත් කරන ලද පළතුරු

## 61. අඤ්ඤවාදක ශික්ෂාපදය

**අඤ්ඤවාදකේ විහේසකේ, පාචිත්තියං.**

*සංඝයා අතර විවාල දෙය හැර අනෙකක් කීමෙහි ද නිශ්ශබ්දව හිඳීමෙන් සංඝයා වෙහෙස කිරීමෙහි ද පචිති වේ.*

## අර්ථ

අඤ්ඤවාදක අනෙකක් කීම(සඝ මැද විචාල කල්හි)

විශේෂක නිහඬව සිටීම (සඝ මැද විචාල කල්හි)

## අනාපත්ති

ගිලන් නිසා

සැබැවින්ම නොදන්නා නිසා

කිවහොත් සංඝයා භේදවේය කියා

## 62. උජ්ඣාපනකෙ ශික්ෂාපදය

**උජ්ඣාපනකේ, ඛීයනකේ, පාචිත්තියං.**

*ගැරහීමෙහි, අගුණ කීමෙහි පචිති වේ.*

## අර්ථ

උජ්ඣාපනකෙ ලඝුකොට කීම

ඛීයජනක නුගුණ පැතිරවීම

## 63. පඨම සේනාසන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සඞ්ඝිකං මඤ්චං වා පීඨං වා භිසිං වා කොච්ඡං වා අජ්ඣෝකාසේ සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා, තං පක්කමන්තෝ නේව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය, අනාපුච්ඡා වා ගච්ඡෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් එළිමහනෙහි තැබූ ඇඳ පුටු බිසි ආදි සඟසතු බඩු නිසි පරිදි තැන්පත් නොකර අනෙකෙකු ලවා හෝ තැන්පත් නොකරවා ආරාමිකයෙකුට ද නොදන්වා බැහැර ගියේ ද පචිතිවේ.*

මීට අමතරව සංඝික දේ(කොට්ට, බුමුතුරුණු, පාපිසි) දමා ගියහොත් දුෂ්කට වේ

## අනාපත්ති

පැවරූ විට

ආපදා අවස්ථාවකදී

## 64. දුතිය සේනාසන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සඞ්ඝිකේ විහාරේ සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා, තං පක්කමන්තෝ නේව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් සඟසතු අරමක සයනයක් අතුරා හෝ අතුරවා සිට නිසි පිළිදි තැන්පත් නොකර අනෙකෙකු ලවා හෝ තැන්පත් නොකරවා ආරාමිකයෙකුට නොදන්වා බැහැර ගියේ ද පචිති වේ.*

මෙහි සයනයක් යනුමෙට්ටයක්,පැදුරක්, බුමුතුරුණු, නිසීදන ආදී දේය.

මෙහිදී ආරාම පරික්ෂේපයෙන්(භූමියෙන්) යෑමේදී පචිති වේ.

### අනාපත්ති


පැවරූ විට

පිණ්ඩපාතය යා හැකිය

## 65. අනුපඛජ්ජ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සඞ්ඝිකේ විහාරේ ජානං පුබ්බුපගතං භික්ඛුං අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙය්‍යඃ 'යස්ස සම්බාධෝ භවිස්සති, සෝ පක්කමිස්සතී'ති. ඒතදේව පච්චයං කරිත්වා අනඤ්ඤං, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් සඟ සතු අරමකට ගියේ එහි තමාට පළමුව පැමිණි භික්ෂුවකගේ (මහළු බව, ගිලන් බව ආදි දුර්වල බව දැන දැනත්) මෙයින් මොහුට කරදර වෙයි නම් ඉවත් ව යන්නේ යැයි සලකමින් ඔහු හා ගැටේ ද තල්ලුකර දමා ද එබඳු ගිලන් කමෙකින් තොරව සයනය පැහැරගත් ඔහු හට පචිති වේ.*



බැහැර නොකල යුතු වැඩිහිටියෙක්, ගිලනෙක්, සඝ සම්මත කල විශේෂ සඝ නමක් නිදන ඇඳ වටේට රියන් 1 ½ ක උපචාරයක් තැබිය යුතුය. එම උපචාරයේ සයනයක් දමා නිදාගන්නේ නම් පචිති වේ.

## අනාපත්ති

ගිලන් අවස්ථාවක
ආපදා අවස්ථාවක
සීතල උණුසුම දරාගත නොහැකි අවස්ථාවක

## 66. නික්කඩ්ඨන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුං කුපිතෝ අනත්තමනෝ සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍ය වා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් තවත් භික්ෂුවක් සමඟ කිපියේ නොසතුටු සිත් ඇත්තේ සඟසතු අරමකින් බැහැර කරයි ද කරවයි ද පචිති වේ.*

## ආපත්ති

ද්වේෂයෙන් භික්ෂුවක් කුටියකින් ස්තෝප්පුවට දැමීමේදී දුෂ්කට

ද්වේෂයෙන් භික්ෂුවක් කුටියකින් එළියට දැමීමේදී පචිති

ද්වේෂයෙන් අනුපසම්පන්නයකු කුටියකින් එළියට දැමීමේදී දුෂ්කට

අලජ්ජි භික්ෂුවක් කුටියකින් එළියට දැමීම කමක් නැත

උම්මත්තක කමක් නැත

## 67. වෙහාස ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සඞ්ඝිකේ විහාරේ උපරිවේහාසකුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් සඟ සතු අරමක මතු මහල් තලයෙහි විට්ටමකට (යන්තමට) සවිකළ පා ඇති ඇඳක හෝ පුටුවක පරීක්ෂාවක් නැතිව නිදා ගනීනම් හෝ හිඳගනී නම් ඔහු හට පචිති වේ.*

## අර්ථ

ආහවපපාදක ප්‍රධාන ලීය අට නිය විද සවිකල පා ඇති (ඇණ නොගසා) ඇදක් හෝ පුටුවක්

## 68. මහල්ලකවිහාර ශික්ෂාපදය

**මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානේන, යාව ද්වාරකෝසා අග්ගලට්ඨපනාය, ආලෝකසන්ධිපරිකම්මාය,ද්වත්තිච්ඡදනස්ස පරියායං, අප්පහරිතේ ඨිතේන අධිට්ඨාතබ්බං. තතෝ චේ උත්තරිං අප්පහරිතේ'පි ඨිතෝ අධිට්ඨහෙය්‍ය, පාචිත්තියං.**

*ලොකු විහාරයක් කරවන භික්ෂුව විසින් උළුවස්ස ශක්තිමත්වීම සඳහාත් ආලෝක සිදුරු වැසී යාම සඳහාත් (නැවත නැවත මැටි) ආලේප කළ යුතු වෙයි. වහල ද තණ කැරළි එක පිට එක සිටින පරිදි සෙවිලි කළ යුතුය. තණ ගැට නැති බිමක පිහිටා එය දෙතුන් වරක් විධාන කළ යුතු වෙයි. තෘණාදිය නැති තන්හිද සිටියේ දෙතුන් වරකට වඩා විධාන කළේ නම් පචිති වේ.*

### ආපත්ති

දෙතුන් වරකට වඩා වහල සෙවිලි කිරීමෙන් පචිති වේ

වගා බිමක සිට වහල සෙවිලි කරවීමට අණ කිරීමෙන් දුෂ්කට වේ

## 69. සප්පාණක ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ජානං සප්පාණකං උදකං තිණං වා මත්තිකං වා සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් දැන දැන ප්‍රාණීන් සහිත ජලය තණ හා මැටි මතුයෙහි ඉසී ද අනුන් ලවා හෝ ඉස්වා ද පචිති වේ.*

### ආපත්ති

ප්‍රාණීන් මැරෙන බව දැන දැන යමක් කිරීමෙන් පචිති වේ.

ප්‍රාණීන් නැති ජලය වුවද සැකයෙන් විමතියෙන් විසි කලහොත් දුෂ්කට වේ.

### අනාපත්ති

නොදැන අසිහියෙන්

ප්‍රාණීන් සිටින ජලය වුවද නොදැන විසිකිරීමෙන්

# භික්ඛුනෝවාද වර්ගය

## 70. ඕවාද ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අසම්මතෝ භික්ඛුනියෝ ඕවදෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් (භික්ෂූන් විසින්) සම්මත නොකරන ලදුව භික්ෂුණීන්ට අවවාද කෙරේ නම් පචිති වේ.*

භික්ඛුනොවාද ලැබීමට සුදුසුකම්

අනුමාත්‍ර වරදෙහි බියදකින සිල්වතෙකු වීම
බහුශ්‍රැත වීම
උභය ප්‍රාතිමෝක්ෂයෙහි මනා අවබෝධය
යහපත් ප්‍රියශීලි වචන කතා කරන්නෙක් වීම
භික්ෂුනීන්ට බොහෝ සෙයින් ප්‍රිය මනාප කෙනෙක් වීම
භික්ෂුනීන්ට අවවාද දීමට සමත් ප්‍රතිබල අයකු වීම
භික්ෂුනීන් සමග කලින් ගරු ඇවතකට පත් නොවූ අයකු වීම
විසි වස් හෝ අතිරේක විසිවස් සම්පූර්ණ වූ අයකු වීම

අෂ්ඨ ගරු ධර්ම

එදවස උපසපන් වූ භික්ෂුවට වස් 100ක් ගියද භික්ෂුනිය වැද ගරු බුහුමන් කල යුතු.
භික්ෂුනිය භික්ෂූන් නැති ගමෙක ආරාමයක නොවිසිය යුතු.
භික්ෂූන්ගෙන් අඩමසකට වරක් පොහෝ විචාරීම ඕවාද ලබා ගැනීම කල යුතු.
වස් විසීමෙන් අනතුරුව උභය සංඝයා ඉදිරියේ පවාරණය කල යුතු.
උභතෝ සංඝයා කෙරෙහි වත් මානත් පිළිපැදිය යුතුය
සිකඛමානාවක් ලෙස අවුරුදු 02ක් උපසපන් වීමට ප්‍රථම විසිය යුතු.
භික්ෂුනිය විසින් කිසිසේත් මහණ තෙම හට ආක්‍රෝශ නොකල යුතු.
භික්ෂූන්ට අවවාද අණකිරීම් නොකල යුතු.

## 71. අතථංගත ශික්ෂාපදය

**සම්මතෝ'පි චේ භික්ඛු අත්ථඞ්ගතේ සුරියේ භික්ඛුනියෝ ඕවදෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් (භික්ෂූන් විසින්) සම්මත කරන ලද වුවත් හිරු බට කල්හි භික්ෂුණීන්ට අවවාද කෙරේ නම් පචිති වේ.*

## 72. භිකඛුනූපසසය ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුනූපස්සයං උපසංකමිත්වා භික්ඛුනියෝ ඕවදෙය්‍ය, අඤ්ඤත්‍ර සමයා, පාචිත්තියං. තත්ථායං සමයෝ, ගිලානා හෝති භික්ඛුනී, අයං තත්ථ සමයෝ.**

*යම් භික්ෂුවක් මෙහෙණවරකට අවුත් නොකල්හි භික්ෂුණීන්ට අවවාද කෙරේ නම් පචිති වේ. භික්ෂුණියක් ගිලන් වූවානම් එය කාලයයි.*

## 73. ආමිස ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ඒවං වදෙය්‍යඃ 'ආමිස හේතු භික්ඛූ භික්ඛුනියෝ ඕවදන්තී' ති, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් "මේ භික්ෂූහු චීවර ආදී ආමිෂ ලාභය කැමැත්තෙන් භික්ෂුණීන්ට අවවාද කරන්නාහු යයි" කියා නම් ඔහු හට පචිති වේ.*

## 74. චීවරදාන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දදෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් නො නෑවූ භික්ෂුණියකට සුළු දෙයකින් හෝ මාරුකර ගැනීමක් නැතිව සිවුරක් දෙයි නම් පචිති වේ.*

## 75. චීවරසිබ්බන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බෙය්‍ය වා සිබ්බාපෙය්‍ය වා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් නො නෑවූ භික්ෂුණියකගේ සිවුරක් ගෙත්තම් කෙරේනම් හෝ කරවා නම් පචිති වේ.*

## 76. සංවිධාය ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය ඒකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය, අන්තමසෝ ගාමන්තරම්පි අඤ්ඤත්‍ර සමයා, පාචිත්තියං. තත්ථායං සමයෝ, සත්ථගමනීයෝ හෝති මග්ගෝ සාසඞ්කසම්මතෝ සප්පටිභයෝ. අයං තත්ථ සමයෝ.**

*යම් භික්ෂුවක් භික්ෂුණියක් සමඟ සංවිධානය කොටගෙන නොකල්හි දීඝී මාගයකට පැමිණියේ යටත් පිරිසෙයින් තමා හුන් ගමින් අනෙක් ගමකට හෝ යේ ද පචිති වේ. ඉදින් වාහනයකින් යායුතු තරම් මග සැක සහිත වූයේ ද භය සහිත වූයේ ද මේ ඊට කාලයයි.*

### අර්ථ

| | |
|---|---|
| සුදුසු සමය | මාර්ගය සැක සහිත නම්ද බිය සහිත නම්ද ගැල්කරුවන් යන මාර්ගයක්ද නම් ඇවැත් නොවේ. |
| සංවිධාය | 'අසුවල් වේලාවට අසුවල් ගමන යමු' යි කීවිට පිළිගැනීම |
| කුකකුට සමපාත ගාම | ඉතා ළඟින් ගෙවල් පිහිටි ගම්(කුකුලෙකුට එක් වහලයකින් නැග අවසන් වහලයෙන් බැසිය හැකි) |

### ආපත්ති

| | |
|---|---|
| සංවිධානයේදී | දුෂ්කට |
| ගමකින් ගමකට යෑමේදී | පචිති |
| කැලෑ මාර්ගයක් නම් අඩ යොදුනෙන් අඩ යොදුන | පචිති |

ගම තුලදී, පිටියකදී, නගරයකදී සංවිධානය වී යෑමේදී ඇවැත් වේ

### අනාපත්ති

භික්ෂුනිය කීවිට භික්ෂුව පිළි නොගැනීම

ආපදා අවස්ථාවකදී

ආරාමය තුලදී ආසන ශාලා තුලදී තීර්ථක ආරාම වලදී සංවිධානය වී යෑමේදී

## 77. නවාභිරූපන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය ඒකං නාවං අභිරූහෙය්‍ය උද්ධගාමිනිං වා අධෝගාමිනිං වා අඤ්ඤත්‍ර තිරියංතරණාය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් භික්ෂුණියක් සමග සංවිධානය කොටගෙන ගඟකින් එතෙරවීම පිණිස හැර උඩුගං බලා හෝ යටිගං බලා යන නැවකට භික්ෂුණියක හා එක්ව නගී නම් පචිති වේ.*

### ආපත්ති

| | |
|---|---|
| සංවිධානය වීමේදී | දුෂ්කට |
| ගමකින් ගමක් පසුකිරීමේදී | පචිති |
| ගම් නැතිනම් අඩ යොදුනෙන් අඩ යොදුන | පචිති |
| නැවට නගින විටද | පචිති |

### 78. පරිපාචිත ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ජානං භික්ඛුනීපරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජෙය්‍ය අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහිසමාරම්භා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් මුලදී ගිහියන් විසින් පිළියෙල කිරීමක් නැතිව හුදෙක් භික්ෂුණියක විසින් පිසන ලද පිණ්ඩපාතය දැන දැන අනුභව කෙරේනම් පචිති වේ.*

**ආපත්ති**

කලින් ගිහියෙක් සකස්කරන ලද්දක් භික්ෂුනිය බෙදීමේදී ඇවැත් නැත

| | |
|---|---|
| පිළිගැනීමේදී | දුෂ්කට |
| වැලදීමේදී | පචිති |

### 79. රහො නිසජ්ජ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුනියා සද්ධිං ඒකෝ ඒකාය රහෝ නිසජ්ජං කප්පෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් භික්ෂුණියක සමග හුදෙකලාව රහසි ගතව හිඳී නම් පචිති වේ.*

## භෝජන වර්ගය

### 80. ආවාසක පිණ්ඩ ශික්ෂාපදය

**අගිලානේන භික්ඛුනා ඒකෝ ආවසථපිණ්ඩෝ භුඤ්ජිතබ්බෝ, තතෝ චේ උත්තරිං භුඤ්ජෙය්‍ය, පාචිත්තියං.**

*නො ගිලන් භික්ෂුව විසින් ආගන්තුකාදීන් සඳහා පොදු ශාලාවක එළවූ ආවසථ දානය එක් දිනක් පමණක් අනුභව කළ යුතුය. ඉන් මත්තෙහි අනුභව කරන්නාහට පචිති වේ.*

භික්ෂූන් උදෙසා කරන දන්සැලකින් දිනපතාම ගත හැකිය

## 81. ගණභොජන ශික්ෂාපදය

**ගණභෝජනේ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයෝ: ගිලානසමයෝ, චීවරදානසමයෝ, චීවරකාර සමයෝ, අද්ධානගමනසමයෝ, නාවාභිරූහනසමයෝ, මහාසමයෝ, සමණභත්තසමයෝ, අයං තත්ථ සමයෝ.**

*නුසුදුසු කාලයෙහි ගණ (සාමූහික ) භෝජනය පිළිගන්නාවූ භික්ෂුවට පචිති වේ. ගිලන් කාලය, සිවුරු දෙන කාලය, සිවුරු කරන/කරවන කාලය, දීර්ඝ ගමනකට පිළිපන් කාලය, නැව් නගින කාලය, බොහෝ භික්ෂූන් රැස්වන කාලය හා භික්ෂූන්ට දන්දෙන කාලය ද ගණ භෝජනයෙහිලා සුදුසුය.*

### ආපත්ති

| | |
|---|---|
| ගණ භොජන | අකැප ආරාධනයකින් (බත් දානය, මුං ඇට දානය, කිරිබත් දානය) හෝ අකැප විඤ්ඤප්තියකින් භික්ෂූන් වහන්සේලා 04 නමක් එකටම ලබාගත් පංච භෝජන අතරින් යමක් |
| සුදුසු සමය | ගිලන් බව, චීවරදාන, චීවරකාර සමය, අද්දානගමන සමය(දුර ගමන් යන), නවාභිරූපන සමය(නැව් නගින සමය), මහා සමය(භික්ෂූන් විශාල පිරිසක් රැස්වූ තැන පිණ්ඩපාතය මදි නම්), සමාන භතත සමය(අන්‍ය තීර්ථකයන් විසින් සකස් කල) |

### අනාපත්ති

දෙතුන් දෙනකු ගණ භෝජනය පිළිගෙන වැලදීම

## 82. පරමපරභොජන ශික්ෂාපදය

**පරම්පරභෝජනේ අඤ්ඤත්‍ර සමයා, පාචිත්තියං. තත්ථායං සමයෝ: ගිලානසමයෝ, චීවරදානසමයෝ, චීවරකාරසමයෝ අයං තත්ථ සමයෝ.**

*ගිලන් කාලය, සිවුරු දෙන කාලය හා සිවුරු කරන/කරවන කාලය හැර පරම්පර භෝජනය(පැවරූ දානය හැර අන්නැනෙක දන්වැළඳීම) පචිතිය.*

**අර්ථ**

පරමපර භොජනය  භික්ෂුවකට දාන ආරාධනා කීපයක් ලද විට ලැබූ පිලිවෙලින් ගොස් දානය  වැලදිය යුතුය.එසේ නොමැතිනම් පංච සහධාර්මිකයන් අතුරින් අයකු යොමු  කල යුතුය. එසේ නොකොට පිළිවෙල කඩා වෙනස්කොට ගොස් බත් හුලක් නමුදු වැලදීම

සුදුසු සමය   ගිලන් බව, චීවරදාන, චීවරකාර සමය

**ආපත්ති**

පිළිගැනීමෙන්   දුෂ්කට

වැළදීමෙන්   පචිති

## 83. කාණමාතු ශික්ෂාපදය

**භික්ඛුං පනේව කුලං උපගතං පූවේහි වා මන්ථේහි වා අභිහට්ඨුං පවාරෙය්‍ය, ආකඩ්ඛමානේන භික්ඛුනා ද්වත්තිපත්තපූරා පටිග්ගහේතබ්බා. තතෝ චේ උත්තරිං පටිග්ගණ්හෙය්‍ය, පාචිත්තියං. ද්වත්තිපත්තපූරේ පටිග්ගහෙත්වා තතෝ නීහරිත්වා භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බං. අයං තත්ථ සාමීචි.**

*ගෙදරකට පැමිණි භික්ෂුවකට (ගෙහිමියන් විසින්) කැවුම් හෝ අග්ගලා වලින් හෝ පවරණ ලද නම් කැමති වන භික්ෂුව විසින් දෙතුන් පාත්‍රයක් පුරා  පිළිගත හැකිය. ඊට වඩා පිළිගන්නාහට පචිති වේ. දෙතුන් පාත්‍රයක් පුරා ගත් භික්ෂුව එය ගෙන ගොස් භික්ෂූන් අතර බෙදාගෙන වැළඳිය යුතුය. මේ ඒ පිළිබඳ පිළිවෙතයි.*

පාත්‍රා 03ක් පිරෙන්නට ගත්තේ නම් සෙනසුනේ අනෙක් භික්ෂූන්ට ඒ ගෙදරින් නැවත පිළිගත නොහැකි අතර ලබාගත් පාත්‍ර පුමාණය අනෙක් භික්ෂූන්ට දැන්විය යුතුය.

## 84. පඨම පවාරණ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භුත්තාවී පවාරිතෝ අනතිරිත්තං, ඛාදනීයං වා භෝජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් වැළඳුයේ අමතරව ලද භෝජනය ප්‍රතික්ෂේප කරන ලද්දේ (පවාරණයවූයේ) අතිරික්ත භෝජනයක් හැර කෑ යුතු හෝ බුදිය යුතු දෙයක් අනුභව කෙරේ නම් පචිති වේ.*

**අර්ථ**

<u>පංච භෝජනය</u>

| | |
|---|---|
| ඕදන | (බත් කැද වැනි සප්ත ධාන්‍යයෙන් කල) |
| කුම්මාස | (තලප පිට්ටු වැනි යව හෙවත් බාර්ලි වලින් කල) |
| සතතු | (අග්ගලා, අලුවා ආදී සප්ත ධාන්‍ය බැද සකස් කරගත් ආහාර) |
| මච්ජ | (කැප සතුන්ගේ මස්) |
| මංසං | (මාළු) |

භුතතාවි පවාරිතො වළඳා පවාරණය කරන ලද්දේ

<u>පවාරණය වීමට හේතුවන කරුණු</u>

| | |
|---|---|
| අසනං පඤ්ඤායති | පඤ්ච භෝජනයෙන් ස්වල්පයක් හෝ වලදා තිබෙන අවස්ථාවක් |
| භොජනං පඤ්ඤායති | පඤ්ච භෝජනයෙන් ස්වල්පයක් හෝ පාත්‍රෙය් ඇතිවිට |
| හතථපාසෙ ඨිතො | පඤ්ච භෝජනය රැගෙන කෙනකු අත්පසට පැමිණ ඇති බව |
| අභිහරති | බෙදන්නට එළඹීම |
| පටිකෙඛපො | කයින් හෝ වචනයෙන් ප්‍රතික්ෂේප කිරීම |

අසනං භොජනංචෙව - අභිහාරො සමීපතා

කාය වාචා පටිකෙඛපො - පඤ්ච අංගා පවාරණා

මෙම අංග සම්පූර්ණ වීමෙන් පවාරණය සිදුවන අතර එවිට එම ආසනයේ සිට කැමති තාක් වැලදිය හැකි අතර ඉරියව්ව වෙනස් කොට අතිරික්ත භෝජනය හා ගිලාන අතිරික්තය හැර වෙන කිසිම භෝජනයක් වැලදිය නොහැක.

අතිරික්ත භෝජනය පවාරණය වූ භික්ෂුව ඊටපසු වැලදීමට අවශ්‍ය නම් සියළු ආහාර පාත්‍රෙය් බහා වෙනත් භික්ෂුවක් වෙත ගොස් ' භනෙත අතිරිකතං කරොථ' යැයි කියා පාත්‍රය දිය යුතුය. එම භික්ෂුව එයින් කොටසක් වලදා

අළමෙතං සබබං‘ කියා නැවත පාත්‍රය දෙයි නම් මෙය අතිරික්ත භෝජනයයි.

ගිලාන අතිරික්තය ගිලන් භික්ෂුවක් වළඳා ඉතුරු වූ දේ

**ආපත්ති**

| | |
|---|---|
| වැලඳීමට ගැනීමේදී | දුෂ්කට |
| අනතිරික්ත භෝජනය වැලඳීමේදී පිඩක් පිඩක් පාසා | පචිති |

## 85. දුතිය පවාරණ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තේන ඛාදනීයේන වා භෝජනීයේන වා අභිහට්ඨුං පවාරෙය්‍යඃ ‘හන්ද භික්ඛු! ඛාද වා භුඤ්ජ වා’ති. ජානං ආසාදනාපෙක්ඛෝ, භුත්තස්මිං, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් චෝදනා කරන අදහස ඇතිව වැළඳු භෝජනය ද අමතරව පවරණ ලද භෝජනය ප්‍රතික්ෂේප කළ භික්ෂුවකට කෑයුතු බුදිය යුතු දෙයින් පවරා ද මෙය අනුභව කරවයි කියා ද (එය ඇදහූ) භික්ෂුව වැළඳු කෙනෙහි පචිති වේ.*

**ආපත්ති**

| | | |
|---|---|---|
| චෝදනා කිරීමේ අදහසින් ආහාරයක් ගෙනඒම | | දුෂ්කට |
| එළවූ භික්ෂුවගේ වචනයෙන් පිළිගන්නා විට වලදන භික්ෂුවට | | දුෂ්කට |
| වලදන භික්ෂුව වලදන පිඩක් පිඩක් පාසා එළවූ භික්ෂුවට | | දුෂ්කට |
| පවාරණය වූ භික්ෂුව වලදා අවසන් වීමේදී එළවූ භික්ෂුවට | | පචිති |
| වලදන භික්ෂුවට පිඩක් පිඩක් පාසා | (පෙර ශික්ෂාව) | පචිති |

## 86. විකාලභොජන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු විකාලේ ඛාදනීයං වා භෝජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් කෑ යුතු බුදිය යුතු දෙයක් විකාලයෙහි අනුභව කරන්නේ ද පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| විකාල භොජන | මධ්‍යහනයේ සිට පසුදා අරුණ නැගෙන තෙක් |
| ඛාදනීයං | පඤ්ච භෝජනය හැර අනෙකුත් යාවකාලික ආහාර වර්ග |
| භොජනීයං | පඤ්ච භොජනයන් |
| සතිපච්චයෙ | හේතුවක් ඇති කල්හි |

**ආපත්ති**

මෙම විකාලයෙහි ආහාර ගතික දෙයක් වැලදීම පිණිස පිළිගැනීමේදී දුෂ්කට

වලදන විට ගිලින වාරයක් පාසා පචිති

නොදැන විමතියෙන් වුවද වලදන භික්ෂුවට පචිති

(යාමකාලික පාන වර්ග, සතථාකාලික, යාවජීවික වුවද විකාලයෙහි ආහාර පිණිස ගෙන වලදන විට ගිලින වාරයක් පාසා දුෂ්කට.)

**අනාපත්ති**

යාමකාලික පාන වර්ග

සතථාකාලික

යාවජීවික ;

## 87. සනනිධිකාරක ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සන්නිධිකාරකං ඛාදනීයං වා භෝජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් සන්නිධිකොට කෑ යුතු බුදිය යුතු දෙයක් අනුභව කෙරේ නම් පචිති වේ.*

<u>කාලික සතර</u>

| | |
|---|---|
| යාවකාලික | අරුණ නැගිතැන් පටන් හිරු මුදුන් වනතෙක් ගතයුතු ආහාර |
| යාම කාලික | ඉර මුදුන් වී බැසීම පටන්ගත් තැන පටන් පසුදා අරුණෝදය තෙක් තබාගෙන වැලදිය හැකි පාන වර්ග |

<u>අෂ්ඨ පාන වර්ග</u>

| | |
|---|---|
| අඹ | අම්බපාන |
| දඹ | ජම්බුපාන |

| | |
|---|---|
| ඇටිකෙසෙල් | චෝචපාන |
| මස් කෙසෙල් | මෝචපාන |
| මී පැණි | මධු පාන |
| මිදි | මුද්දික පාන |
| මානෙල්-අල | උපුල්- සාලුක |
| උගුරැස්ස | ඵාරුසක |

<u>අනුලෝම</u>

සියඹලා(තින්තිණි)
දිවුල්(කපිත්ථ)
බෙලි
නාරං(මාතුලුංග) ආදිය සිසිල් පැනින් පෙරා ගන්නා ලද පාන වර්ග

| | |
|---|---|
| සත්තාහකාලික | ගිතෙල්, වෙඩරු, තලතෙල්, මී පැණි, උක් පැණි වැනි දින 07ක් තබාගෙන වැලඳිය හැකි දේවල් |
| යාවජීව | දිවි ඇති තෙක් තබාගෙන වැලඳිය හැකි මුල් කාලික තුනට අයත් නොවන පැන් බෙහෙත් වර්ග |

**ආපත්ති**

| | |
|---|---|
| යාවකාලික හා යාමකාලික සන්නිධි වේ. | |
| සත්තාහකාලික සත් අරුණෝදයෙන් පසු | නිසැගි |
| සන්නිධි වූ දෙයක් වැලඳීමට ගැනීමේදී | දුක්කට |
| සන්නිධි වූ දෙය දැන හෝ නොදැන ගිලින වාරයක් පාසා | පචිති |

## 88. පණීතභොජන ශික්ෂාපදය

**යානි ඛෝ පන තානි පණීතභෝජනානි සෙය්‍යථීදං: සප්පි, නවනීතං, තේලං, මධු, ඵාණිතං, මච්ඡෝ, මංසං, ඛීරං, දධි. යෝ පන භික්ඛු ඒවරූපානි පණීතභෝජනානි අගිලානෝ අත්තනෝ අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය, පාචිත්තියං.**

*නොගිලන් භික්ෂුවක් ගිතෙල්, මී, වෙඬරු, උක්, සකුරු, තල තෙල්,දියමස්, ගොඩමස්, කිරි, හා මිදුණු කිරි යන ප්‍රණීත ආහාර තමන් සඳහා ඉල්ලාගෙන වළඳා නම් පචිති වේ.*

ගිතෙල්, වෙඬරු, තලතෙල්, මී පැණි, උක් හකුරු, මාළු, මස්, කිරි, දීකිරි ආදිය නොගිලන් භික්ෂුවක් විසින් තම ප්‍රයෝජනය පිණිස ඉල්ලා පාවිච්චි කරයි නම් පචිති වේ.

**ආපත්ති**

| | |
|---|---|
| ඉල්ලීමේදී ප්‍රෙයෝගයක් පාසා | දුෂ්කට |
| වැලදීමට ගන්නාවිට | දුෂ්කට |
| වලදන වාරයක් පාසා | පචිති |

ගිතෙල් වෙඬරු ආදිය ඉල්ලාගෙන 09 යම යොදා එක ආහාරයක් සාදා ස්වල්පයක් නමුදු වැලදූවිට <u>එකවර පචිති නමයක්</u> සිදුවේ.

**අනාපත්ති**

පැවරූ අයගෙන් ඉල්ලීමෙන්

ඥාතීන්ගෙන් ඉල්ලීමෙන්

## 89. දනතපොනා ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය අඤ්ඤත්‍ර උදකදන්තපෝනා, පාචිත්තියං**

***යම් භික්ෂුවක් දැහැටි හා පැන් හැර (කිසිවෙකු විසින්) නොපිළිගැන්වූ ආහරක් මුව තුළට ගනී නම් පචිති වේ.***

**අර්ථ**

| | |
|---|---|
| ආහාර | ගිලින සියල්ල |
| අදිනනං | කිසිවකු විසින් නොපිළිගන්වන ලද දෙයක් |

පිළිගැනීම යම්කිසි අනුපසම්පන්නයෙක් කයින්, කායපටිබද්ධයෙන් හෝ නිස්සග්ගියෙන් භික්ෂුවගේ අත්පස(පච්චිම භාගයේ සිට රියන් 2 1/2) සිට යමක් දෙනවිට භික්ෂුව අතින් හෝ වෙනත් ශරීර අවයවයකින් ස්පර්ෂ කිරීමෙන් පිළිගැනීම සිද්ධ වේ. මැදුම් පුරුෂයකුට එසවිය හැකි බරක් සාමණේරයිනු 2-3 දෙනකු ඔසවා

පිළිගැන්වුවද සුදුසුය. නමුත් මැදුම් පුරුෂයන් 2-3 දෙනකු ඔසවන දෙයක් එසේ පිළිගැනීම නුසුදුසුය.

| | |
|---|---|
| විනය දුෂ්කට | පිණ්ඩපාතයේ යනවිට දූවිලි රොඩු කැබලි ආදිය වැටුනහොත් නැවත පාත්‍රය පිළිගන්වාගෙන පිණ්ඩපාතය යා යුතුය. නැතහොත් විනය දුෂ්කට වේ. එසේ නොමැතිනම් 'අනුපසම්පන්නයෙකුට දෙන්නෙමි' යි සිතා යා හැකිය.<br><br>කඳුළු, කෙල වැනි කුණපප කොටස් ගෑවී පාත්‍රයට වැටුණහොත් නැවත පාත්‍රය පිළිගන්වා ගත යුතුය.<br><br>නාසයට දාන තෙල්ද පිළිගත යුතුය<br><br>දැහැටි පිළිනොගන්නා වුවද දැහැටි රසය ගිලෙන්නේ නම් පිළිගැනීම වටනේය. |
| දුරුපචින්න දුෂ්කටය | ගෙඩි සැදුණ ගස්වල අතු ඇල්ලීමෙන් දුරුපචින්න දුෂ්කටය වේ. |

## අනාපත්ති

කැපකරුවකු නොමැතිවිට සර්පයකු දෂ්ඨ කල කල්හි මහවිකටය පිළිනොගෙන වැළඳිය හැකිය.
දැහැටි සහ පැන්

<u>මහවිකටය</u>

මල,මුත්‍ර,අළු,මැටි දියකර සාදා පෙරාගන්නා ලද ඖෂධයකි.

<u>අෂ්ඨ දුකකට</u>

| | |
|---|---|
| පුබ්බපයොග දුකකට | හොරකමක් කිරීමට කරන පූර්ව ප්‍රෙයෝග |
| සහපයොග දුකකට | නිධානයක් වැනි දෙයක් ගැනීමට එය ඇති තැන ගස් කැපීමේදී, පොලොව හෑරීමේදී |
| අනාවාස දුකකට | රන් රිදී මුතු මැණික් ආදියද, සප්ත ධාන්‍යයද, අවි ආයුධද, ස්ත්‍රී රූප හා ස්ත්‍රී ආභරණද ඇල්ලීමේදී |
| දුරුපචින්න දුකකට | කෙසෙල් පොල් වැනි ගෙඩි වර්ග ගසේ තිබියදී ඇල්ලීම |

| | |
|---|---|
| විනය දුක්කට | පිණ්ඩපාතයේ යනවිට දූවිලි රොඩු කැබලි ආදිය වැටී තිබියදී නැවත පාත්‍රය පිළිගන්වාගෙන නොගෙන පිණ්ඩපාතය යෑම. |
| ඤාත දුක්කට | |
| ඤත්ති දුක්කට | සමනුභාෂන වැනි විනයකර්මවලදී ඤත්තිය තබනවිට වන දුක්කට |

## අචේලක වර්ගය

### 90. අචේලක ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අචේලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භෝජනීයං වා දදෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් නග්නයෙකුට හෝ පිරිවැජියෙකුට හෝ පිරිවැජියකට සිය අතින් කෑ යුතු බුදිය යුතු දෙයක් දේ නම් පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| අචෙලක | නග්න වූ පිරිවැජියන්. |
| පරිබ්‍රාජක | භික්ෂුව සාමණේර හැර වෙනත් පැවිදි |
| පරිබ්‍රාජිකා | භික්ෂුණිය සික්ඛමානා සාමණේරිය හැර වෙනත් පැවිදි |

### 91. උය්‍යොජනක ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුං ඒවං වදෙය්‍යඃ ඒහාවුසෝ ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමාතිඃ තස්ස දාපෙත්වා වා අදාපෙත්වා වා උය්‍යෝජෙය්‍යඃ 'ගච්ඡාවුසෝ න මේ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හෝති, ඒකකස්ස මේ කථා වා නිසජ්ජා වා ඵාසු හෝතී' ති. ඒතදේව පච්චයං කරිත්වා අනඤ්ඤං, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් වෙනත් භික්ෂුවකට 'එව ඇවැත්නි! ගමෙහි පිඬු පිණිස හැසිරෙමු'යි කියයි. පිඬු හැසිරීමෙන් පසුව යම් පිණ්ඩාහාරයක් දෙවා හෝ නොදෙවා හෝ (තමන් අනාචාරයක හැසිරෙනු පිණිස) 'ඇවැත්නි! ඔබ සමඟ විසීම, කථා කිරීම හෝ කරදරය. හුදෙකලාවූ මට සැපයැ'යි කියා ඒ භික්ෂුව පලවාහරින්නේ ද ඔහු හට පචිති වේ.*

දර්ශන උපචාරයෙන් හා සවන උපචාරයෙන් ඇත්වීමේදී පචිති වේ.

| | |
|---|---|
| එතදවෙ පච්චයං කරිතවා අනඤ්ඤනති | අනාචාර කටයුත්තක් සඳහාම හුදෙකලාවීමට අවශ්‍ය අනෙක් භික්ෂුව පිටත් කර යැවීමෙන් පචිති වන බව මෙයින් හගවයි. |

## 92. සභොජන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සභෝජනේ කුලේ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් අඹු සැමියන් දෙදෙනෙකු ඇති ගෙයක ඇතුළත වැදී හිඳී ද පචිති වේ.*

| | |
|---|---|
| සභොජන කුලය | අඹුසැමි යුවලක් ඔවුනොවුන් කෙරෙහි රාගයෙන් බැඳී සිටින දෙදෙනාම නිවසේ සිටින අවස්ථාවයි.(සයනගරයට ගොස් හිදීමෙන් පමණි) |

## 93. පඨම රහො ශික්ෂාපදය

**යෝ පන භික්ඛු මාතුගාමේන සද්ධිං රහෝ පටිච්ඡන්නේ ආසනේ නිසජ්ජං කප්පෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් ස්ත්‍රියක සමග පිළිසන් අසුනෙක රහසිගතව හිඳී නම් පචිති වේ.*

### අර්ථ

| | |
|---|---|
| මාතුගාම | එදවස උපන් දැරියගේ පටන් මනුෂ්‍ය ස්ත්‍රිය |
| රහො | භික්ෂුවද මාගමද හුදකලාවේ සිටීම(මෙහිදී ආවරණය වූ තැනක කියවෙන බැවින් කෙනෙකුට දැකීමට නොහැකි තැනක් අදහස් කරයි) |

### අනාපත්ති

රාගික හැගීමක් නැතිව හිදීමෙන්

## 94. දුතිය රහො නිසජ්ජ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු මාතුගාමේන සද්ධිං ඒකෝ ඒකාය රහෝ නිසජ්ජං කප්පෙයය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් ස්ත්‍රියක සමඟ හුදෙකලාව රහසිගතව හිඳී නම් පචිති වේ.*

### අර්ථ

එකො එකාය රහො　　　මාගමක් සමග හුදකලාවේ එළිමහන් තැනක හිදීම

### අනාපත්ති

ඇස් ඇති කන් ඇසෙන විඥඥු පුරුෂයකු දොලොස් රියනක් ඇතුලත සිටීම

තවත් ස්ත්‍රියක් ඇති නම් දෙවැන්නකු සේ සැලකිය හැකිය

රාගික හැඟීමක් නැතිව හිදීමෙන්

## 95. චාරිතත ශික්ෂාපදය

**යෝ පන භික්ඛු නිමන්තිතෝ සභත්තෝ සමානෝ සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරේභත්තං වා පච්ඡාභත්තං වා කුලේසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා, පාචිත්තියං. තත්ථායං සමයෝ: චීවරදානසමයෝ, චීවරකාරසමයෝ, අයං තත්ථ සමයෝ.**

*යම් භික්ෂුවක් (දායිකාදීන් විසින්) නිමන්ත්‍රණය කරන ලදුව හෝ පැවරූ භෝජන ඇතිවද ආරාමස්ථ භික්ෂුවකට නොදන්වා සිවුරු දෙන කාලයෙහි හා සිවුරු කරන කාලයෙහි හැර අනෙක් කාලයෙහි (පෙරබත හෝ පසුබත් හෝ) ගමට වැද ගෙවල ඇවිදී ද ඔහු හට පචිති වේ.*

### අර්ථ

සනතං භිකඛුං අනාපුචචා　　　දකින්නට ඇති භික්ෂුවකට නොදන්වා යාම

### අනාපත්ති

චීවරදාන සමය, චීවරකාර සමය

## 96. මහානාම ශික්ෂාපදය

**අගිලානේන භික්ඛුනා චාතුමාසප්පච්චයපවාරණා සාදිතබ්බා අඤ්ඤත්‍ර පුනපවාරණාය අඤ්ඤත්‍ර නිච්චපවාරණාය. තතෝ චේ උත්තරිං සාදියෙය්‍ය, පාචිත්තියං.**

*නොගිලන් භික්ෂුව විසින් හාර මාසයක් බෙහෙතින් කරන පැවරීම ඉවසිය හැකිය. හාර මාසයකින් පසුව නැවත කරන පැවරීම හෝ නිත්‍ය පැවරීම හෝ හැර මේ නියමය (හාරමාසය) ඉක්මවා බෙහෙත් ඉවසන නොගිලන් භික්ෂුවට පචිති වේ.*

යම් අයකු පැවරීමක් කරන්නේ නම් පැවරූ දෙය ඉල්ලිය හැකි අතර ඉන් ඔබ්බෙහි ඉල්ලීමෙන් අවැත් වේ.

යම් අයකු යම් කාලයකින් පැවරීමක් කරන්නේ නම් පැවරූ කාලය තුල ඉල්ලිය හැකි අතර ඉන් ඔබ්බෙහි ඉල්ලීමෙන් අවැත් වේ.

## 97. උය්‍යුතත ශික්ෂාපදය

**යෝ පන භික්ඛු උය්‍යුත්තං සේනං දස්සනාය ගච්ඡෙය්‍ය, අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් සුදුසු කරුණක දී හැර යුද පිණිස නික්මුණු සිවුරඟ සෙනඟ බැලීමට ගියේ ද ඔහු හට පචිති වේ.*

<u>චතුරංගනී සේනාව</u>

| | |
|---|---|
| හස්ති සේනා | එක් ඇතෙක් සමග පුරුෂයන් 12 දෙනෙක් |
| අශ්ව සේනා | එක් අශ්වයෙක් සමග පුරුෂයන් 03 දෙනෙක් |
| රථ සේනා | එක් රථයක් සමග පුරුෂයන් 04 දෙනෙක් |
| පාබල සේනා | කඩුගත් පුරුෂයන් 04 දෙනෙක් |

### ආපත්ති

| | |
|---|---|
| බැලීමට යාමේදී | දුක්කට |
| බැලීමේදී | පචිති |

### අනාපත්ති

සුදුසු කරුණක් ඇති කල්හි

මාර්ගයක යද්දී ඉදිරියට එන සේනාවක්

ආරාමයේ සිට බැලීමේදී

භික්ෂුව සිටින තැනට යුධ සේනාවක් එනවිට බැලීමේදී

### 98. සේනාවාස ශික්ෂාපදය

**සියා ච තස්ස භික්ඛුනෝ කෝචිදේව පච්චයෝ සේනං ගමනාය, දිරත්තතිරත්තං තේන භික්ඛුනා සේනාය වසිතබ්බං. තතෝ චේ උත්තරිං වසෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවකට යුද පිණිස නික්මුණු සිවුරඟ සෙනඟ තුළ කිසියම් කටයුත්තක් ඇත්නම් දෙතුන් රැයක් සේනාව සමඟ කඳවුරෙහි විසිය හැකිය. ඉන් මත්තෙහිත් වසන භික්ෂුවට පචිති වේ.*

### 99. උයෝධික ශික්ෂාපදය

**දිරත්තතිරත්තං චේ භික්ඛු සේනාය වසමානෝ උයෝ්‍යාධිකං වා බලග්ගං වා සේනාබ්‍යූහං වා අනීකදස්සනං වා ගච්ඡෙය්‍ය, පාචිත්තියං.**

*ඉදින් භික්ෂුව යුද කඳවුරෙහි දෙතුන් දිනක් වසන්නේ එතෙකුදුවත් යුද්ධ කරන තැන, භටයින්ගේ පෙරට්ටු, බළසෙන් නවත්වන තැන්, බළ ඇණි ආදිය බැලීම සඳහා නොයා යුතුය. යන්නාහට පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| උයොයාධික | ප්‍රහාර දියත් කරන තැන |
| බලගග | බල සේනාව ගණින තැන |
| සෙනාබ්‍යුහං | කඳවුරු බැඳි තැන |
| අනීක දසසනං | බලඇණි |

## සුරාපාන වර්ගය

### 100. සුරාපාන ශික්ෂාපදය

**සුරාමේරයපානේ, පාචිත්තියං.**

*රහමෙර පීමෙහි පචිති වේ.*

<u>සුරා</u>

| | |
|---|---|
| පිටයී සුරා | පිටිවලින් කරනලද |
| පූව සුරා | ධාන්‍යවලින් කැවුම් සේ කරනලද |
| ඔදනීය සුරා | බත් ආදියෙන් සාදන ලද |
| කිණ්ණ පකඛිතතා | සුරා මණ්ඩිවලින් සාදන ලද |
| සමභාර සංයුකත | සියල්ල හෝ කීපයක් කලවම් කර |

<u>මෙරය</u>

| | |
|---|---|
| පුපඵාසව | මල්වලින් |
| ඵලාසව | පලතුරුවලින් |
| මධවාසව | මිදිවලින් |
| ගුලාසව | උක්පැණිවලින් |
| සමභාර සංයුකත | සියල්ල හෝ කීපයක් කලවම් කර |

**ආපත්ති**

මධ්‍යසාර නොවන දෙයක් සැකයෙන් වැලදීම දුෂ්කට

සුරාමෙරය ඉතා ස්වල්පයක් දැන හෝ නොදැන ගත්තද පචිති

**අනාපත්ති**

මධ්‍යයසාර ස්වභාවය ඇති (අරිෂ්ඨ වැනි)මධ්‍යයසාර නොවන දෙයක් වැලදීමෙන්

ආහාර ද්‍රව්‍ය පිළියෙල කිරීමේදී සැකසුමක් ලෙස (මස් බුරුල්වීමට) මධ්‍යයසාර ස්වල්පයක් එක් කරන ලද ආහාර

## 101. අංගුලිපතොදක ශික්ෂාපදය

**අඞ්ගුලිපතෝදකේ, පාචිත්තියං.**

*ඇඟිලිවලින් කිති කැවීමෙහි පචිති වේ.*

**ආපත්ති**

කායපටිබද්ධයෙන් දුෂ්කට

නිස්සග්ගියෙන් දුෂ්කට

අනුපසම්පන්නයකු කිතිකැවීමෙන් දුෂ්කට

**අනාපත්ති**

හේතුවක් ඇති කල්හි

## 102. හසසධමම ශික්ෂාපදය

**උදකේ හස්සධම්මේ, පාචිත්තියං.**

*දිය කෙළියෙහි පචිති වේ.*

**ආපත්ති**

| | |
|---|---|
| ගොබ් ඇටයට පහළ ජලයේ | දුෂ්කට |
| ජලයට නොබැස ගල් විසිකිරීම ආදිය | දුෂ්කට |
| භාජනවල ඇති ජලයේ | දුෂ්කට |
| කැද කිරි ආදියේද | දුෂ්කට |
| විනෝද වන ලෙස කැසිකිලි කිරීමේදී | දුෂ්කට |

**අනාපත්ති**

සතුන් එලවීමට වතුර ගැසීම

යමක් ගැනීමට දියේ ගිලීම

ගඟ හරහා යෑමට පිහිනීම

ආපදාවකදී

## 103. අනාදරියෙ ශික්ෂාපදය

**අනාදරියේ, පාචිත්තියං.**

*ශික්ෂාවන්ට හෝ අවවාද කලවුන්ට ගැරහීමෙහි පචිති වේ.*

| | |
|---|---|
| පුද්ගල අනාදරිය | භික්ෂුවක් බුදුරජාණන් වහන්සේ පනවන ලද දෙයකින් අවවාද කරන කල්හි ඔහුට අවමන් වන සේ දොස් කීම සහ ඔහුගේ වචන නොපිළිගැනීම. |
| ධම්ම අනාදරිය | පනවන ලද ශික්ෂාපදවලට දොස් කීම |

## 104. භිංසාපනක ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුං භිංසාපෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් වෙනත් භික්ෂුවක බියගන්වා නම් පචිති වේ.*

### ආපත්ති

අනුපසම්පන්නයකු බය කලවිට දුෂ්කට

මේ සඳහා භයානක රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ෂ ආදිය දැක්වීමෙන් එම භික්ෂුව බිය වුවද නොවූවද බය කල භික්ෂුවට පචිති

## 105. ජෝති ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අගිලානෝ විසිබ්බනාපෙක්ඛෝ, ජෝතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා, පාචිත්තියං.**

*නොගිලන් භික්ෂුවක් ගිනි තපිනු කැමතිව පහන් දැල්වීම් ආදී හේතුවක් නැතිව ගිනි දල්වා ද , අනිකකු ලවා දල්වා ද පචිති වේ.*

### අර්ථ

විසිබ්බනා පෙකෙඛා ගිනිතැපීමේ අදහසින්

### අනාපත්ති

පහන් දැල්වීම

ලිපගිනි මෙලවීම

ජනතාසර ලිප දැල්වීමෙන්

වෙන අයකු දල්වන ලද තැනක සිටීමෙන්

ගිලන් බව නිසා

## 106. නහාන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ඕරේනද්ධමාසං නහායෙය්‍ය, අඤ්ඤත්‍ර සමයා, පාචිත්තියං. තත්ථායං සමයෝ: දියඩ්ඪෝ මාසෝ සේසෝ ගිම්හානන්ති, වස්සානස්ස පඨමෝ මාසෝ ඉච්චේතේ අඩ්ඪතෙය්‍යමාසා, උණ්හසමයෝ, පරිළාහසමයෝ, ගිලානසමයෝ, කම්මසමයෝ, අද්ධානගමනසමයෝ, වාතවුට්ඨිසමයෝ. අයං තත්ථ සමයෝ.**

*යම් භික්ෂුවක් කාලයෙහි හැර අඩ මසක් ඇතුළත නහා නම් පචිති වේ. ග්‍රීස්ම ඍතුවේ අන්තිම මාස එක හමාර හා වස්සාන ඍතුවේ පළමුවෙනි මාසය වශයෙන් පැවති දෙමස් පසළොස් දවස ද, දාහගතිය ඇති කාලය, ගිලන් කාලය, කමාන්ත කාලය, දිග් මගකට යා යුතු කාලය හා දූවිලි සහිත වාතය ඇති කාලය ද (අඩ මසක් ඇතුළත )ස්නානය කළ යුතු කාලයෝයි.*

| | | |
|---|---|---|
| සුදුසු සමය | ගිම්හාන ඍතුවේ අවසාන මාස 1 ½ | (උෂ්න සමය) |
| | වස්සාන ඍතුවේ පලමු මාසය | (පරිලාහ සමය) |
| | ගිලන්වූ කලට | (ගිලන් සමය) |
| | කර්මාන්ත කරන කාලය | (කමම සමය) |
| | දුර ගමන් යන කාලය | (අදධානගමන සමය) |
| | දූවිලි සහිත සුලං එන කාලය | (වාතවුටයී සමය) |

## 107. දුබබණණකරණ ශික්ෂාපදය

**නවං පන භික්ඛුනා චීවරලාභේන තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං ආදාතබ්බං, නීලං වා කද්දමං වා කාළසාමං වා. අනාදා චේ භික්ඛු තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං නවං චීවරං පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියං.**

*අළුත් සිවුරක් ලැබූ භික්ෂුව විසින් එය දුර්වර්ණ කිරීම පිණිස (කප්බින්දු තැබීම් වශයෙන්) නිල් පාට හෝ මඩ පාට හෝ කළු පාට හෝ ගත යුතුයි. මේ වර්ණත්‍රයෙන් එක ද වර්ණයක් නොගන්වා අළුත් සිවුරක් පරිභෝග කරන භික්ෂුවට පචිති වේ.*

## 108. විකප්පන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණේරස්ස වා සාමණේරියා වා සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් භික්ෂු, භික්ෂුණී, සික්ඛමානා, සාමණේර, සාමණේරීන්ට තමාම සිවුරක් විකප්පනය කොට (පවරා) පසුව පච්චුද්ධරණය නොකොට (ඒ පැවරීම අවලංගු නොකොට) පරිභෝග කෙරේනම් පචිති වේ.*

චීවර විකපපනය අමතර සිවුරක් වෙන අයකුට පැවරීමයි. ඉන් පසු එම සිවුර ලබාගත් භික්ෂුව තමාගේ එකක් හැටියට පරිභෝග කරන ලෙස හෝ කැමති දෙයක් කරන ලෙස නැවත ලබා දෙයි.

චීවර විකපපනය කරන අයුරු

අමතර සිවුර රැගෙන භික්ෂුවක් වෙත ගොස් උත්කුටියෙන් හිඳ ‘ ඉමං චීවරං තුමහං/ තුයහං විකපෙපමි ‘ කියා සිවුර ඔහුට දිය යුතුය. එම භික්ෂුව ‘ ඉමං චීවරං මයහං සනතකං පරිභුඤජවා විසසජෙථ(හි) වා යථා පචජසං කරොථ (හි)‘ , (මෙමසිවුර මා සන්තකය. ඔබට පරිභෝජනය හෝ කැමති දෙයක් කරන්න.) කියා සිවුර පචචුදදරණය කොට සිවුර නැවත ලබා දිය යුතුය.

මෙලෙස විකල්පනය කරන ලද සිවුරක් පචචුදධරණය නොකර පරිභෝග කිරීමෙන් පචිති වේ.

## 109. චීවරාපනිධාන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුස්ස පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙය්‍ය වා අපනිධාපෙය්‍ය වා අන්තමසෝ හස්සාපෙක්ඛෝපි, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් වෙනත් භික්ෂුවකගේ පාත්‍රයක්, සිවුරක්, නිසීදනයක්, ඉදිකටු ගුලාවක්, හෝ පටියක් යටත් පිරිසෙයින් සිනා පිණිස වුව ද සඟවා නම් අනෙකෙකු ලවා හෝ සඟවාද පචිති වේ.*

**අනාපත්ති**

වෙනත් පරිෂ්කාරයක් සැඟවීමෙන් දුෂ්කට වේ.

අනුපසම්පන්නයකුගේ පාත්‍ර සිවුරු සැඟවීමෙන් දුෂ්කට වේ.

## සප්පාණක වර්ගය

### 110. සඤ්චිච්චපාණ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සඤ්චිච්ච පාණං ජීවිතා වෝරෝපෙය්‍ය පාචිත්තියං.**

*යම් භික්ෂුවක් දැන දැන සතකු දිවි තොර කෙරේනම් පචිති වේ.*

### 111. සප්පාණක ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් දැන දැන ප්‍රාණීන් සහිත වතුර පරිභෝග කෙරේ නම් පචිති වේ.*

ප්‍රාණීන් සහිත ජලයට ආවිස දැමීම, උණුවතුර දැමීම ආදිය දැමීම පචිති

### 112. උක්කොටන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ජානං යථාධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කෝටෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් විනයානුකූලව සමථය වූ අධිකරණයක් ඒ බව දැන දැන නැවත විනිශ්චය පිණිස අධිකරණයට ගනීද පචිති වේ.*

පුනකම්මා උක්කොටෙති නැවත කිරීම සඳහා උගුලවීම

### 113. දුට්ඨුල්ල ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් දැන දැන භික්ෂුවකගේ සඟවෙසෙස් ඇවතක් සඟවාද ඔහු හට පචිති වේ.*

භික්ෂුවකගේ පචිති ආදී වෙනත් ඇවතක් වසයි නම් දුෂ්කට වේ.

**අනාපත්ති**

සගවන අදහසක් නැතිව

## 114. ඌන වීසති වසස ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙය්‍ය, සෝ ච පුග්ගලෝ අනුපසම්පන්නෝ, තේ ච භික්ඛූ ගාරය්හා, ඉදං තස්මිං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් විසි වයසින් අඩු පැවිද්දකු උපසපන් කළේ නම් ඔහුද උපසපන් බවට නොපැමිණේ. සීමාවෙහි භික්ෂූහුද නින්දාකටයුත්තාහු වෙති. උපාධ්‍යාය භික්ෂුවට පචිති වේ.*

**අනාපත්ති**

| | |
|---|---|
| උපාධ්‍යායයන්ට | පචිති |
| කර්මාචාර්යයන්ට | දුෂ්කට |
| ඌනවීසතිවසස | පටිසන්ධියේ සිට මේ දක්වා විසි වයස් සම්පූර්ණ නොවූ අයට උපසම්පදාව නොපිහිටයි. යමෙක් උපසම්පදාව නොපිහිටි බව නොදැන සිටියහොත් නොදැනසිටින තාක් සගමොක් (ස්වර්ගස්ථ වීමේ අන්තරායක්) අන්තරායක් නැත. එහෙත් ඔහු යටතේ පැවිදි වන කිසිවකුට උපසම්පදාව පිහිටන්නේ නැත. |

## 115. ථෙය්‍යසත්ථසික ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ජානං ථෙය්‍යසත්ථේන සද්ධිං සංවිධාය ඒකද්ධානමග්ගං පටිපජ්ජේය්‍ය, අන්තමසෝ ගාමන්තරම්පි, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් දැන දැන හොර වෙළඳසාත්තුවක් සමග සාකච්ඡා කොට දීර්ඝ මගකට පිවිසියේ යටත් පිරිසෙයින් ගමකින් අනෙක් ගමකට හෝ යේද ඔහු හට පචිති වේ.*

## 116. සංවිධාන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු මාතුගාමේන සද්ධිං සංවිධාය ඒකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසෝ ගාමන්තරම්පි, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් ස්ත්‍රියක සමග සාකච්ඡා කොට ඇදන්මගකට පිළිපන්නේ යටත් පිරිසෙයින් ගමකින් අනෙක් ගමකට හෝ යේද පචිති වේ.*

මාතුගාම මනුෂ්‍ය ස්ත්‍රී

යක්ෂණිය/ ප්‍රේතිය/ තිරච්ජානගත සමග දුෂ්කට

මාගමක් සමග දැන ගියද නොදැන ගියද සංවිධානය වී යාමෙන් ඇවැත් වේ. ( නොදනී යනු මාගමක් යැයි ඇඳුමෙන් පැලඳුමෙන් ක්‍රියාවෙන් හඳුනාගත අසීරු බවයි)

## 117. අරිට්ඨ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ඒවං වදෙය්‍යඃ 'තථාහං භගවතා ධම්මං දේසිතං ආජානාමි, යථා යේමේ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා, තේ පටිසේවතෝ නාලං අන්තරායායාති. සෝ භික්ඛු භික්ඛූහි ඒවමස්ස වචනීයෝඃ 'මා ආයස්මා ඒවං අවච. මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතෝ අබ්භක්ඛානං, න හි භගවා ඒවං වදෙය්‍ය. අනේකපරියායේන ආවුසෝ! අන්තරායිකාධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලඤ්ච පන තේ පටිසේවතෝ අන්තරායායාති. ඒවඤ්ච පන සෝ භික්ඛු භික්ඛූහි වුච්චමානෝ තථේව පග්ගණ්හෙය්‍ය, සෝ භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බෝ තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චේ සමනුභාසියමානෝ තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චේතං කුසලං. නෝචේ පටිනිස්සජ්ජෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් "යම් මේ දහම් කොටසක් භාගයවතුන් වහන්සේ විසින් අන්තරායකර යැයි වදාරන ලද නමුත් ඒ ධර්මයන් සේවනය කරන්නා හට අන්තරාය පිණිස නොපවතී, ධර්මය අනුව එය මම දනිම්'යි කියානම්, සෙසු භික්ෂූන් ඔහුට මෙසේ කිවයුතු වන්නේය."ඇවැත්නි, එසේ නොකියව. භාගයවතුන් වහන්සේට අභිබවනය නොකරව. භාගයවතුන් වහන්සේට ගැරහීම සුදුසු නොවෙයි. මක් නිසාද, උන්වහන්සේ එසේ නොවදාරණ ලද්දේය. එහෙයින්, ඇවැත්නි, භාගයවතුන් වහනසේ යම් මේ ධර්ම කෙනෙක් අන්තරායකරය්'යි වදාරණ ලද නම් ඒ ධර්මයන්*

*සේවනය කරන්නා හට අන්තරාය පිණිස පවත්නේමය." මෙසේ පියවි භික්ෂූන් විසින් කියනු ලබද්දීත් යථෝක්ත භික්ෂුව එම මතයම ගෙන සිටී නම් තුන්වරක්ම කිය යුතුය. තෙවැනි වරද එම දෘෂ්ටිය නොහළේ නම් පචිති වේ.*

**ආපත්ති**

| | |
|---|---|
| මුලින්ම අවවාද කිරීමේදී | ඇවැත් නැත |
| ඤපතිය තැබීමේදී | දුකකට |
| කර්මවාක්‍යය පලමුවර/දෙවනවර | දුකකට |
| කර්මවාක්‍යය තෙවනවර කියා අවසන්වීමේදී | පචිති |

## 118. උක්ඛිත්තක සම්භෝග ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ජානං තථාවාදිනා භික්ඛුනා අකතානුධම්මේන තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨේන සද්ධිං සම්භුඤ්ජෙය්‍ය වා සංවසෙය්‍ය වා සහවාසෙය්‍යං කප්පෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් බුදු රජාණන් වහන්සේට නුගුණ කියන්නාවූ පැමිණි ඇවැතට පිළියම් නොකළාවූ ලාමක දෘෂ්ටීන් අත්නොහළාවූ යථෝක්ත ඇවැත්වන් භික්ෂුව සමග දැන දැන ධර්මාමිෂ සම්භෝගය පවත්වා ද, උපෝසථාදී සංඝ කර්ම කෙරේ ද, එක ගෙයි හෝ සයනය කෙරේද ඔහු හට පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| සමබුඤ්ජෙය්‍යා | එකට සම්භෝග කිරීම |
| | ආමිස සම්භෝගය - දානය දීම ගැනීම |
| | ධර්ම සම්භෝගය - ධර්මය කියා දීම. |
| සංවසෙය්‍යා | එකට විනය කර්ම කිරීම |
| සහසෙය්‍යය | එක වහලක් යට නිදා ගැනීම |

- පසුව ඔසාරණ නමැති විනය කර්මය කරගැනීමෙන් පසු ප්‍රකෘති විය හැකිය.

## 119. කණ්ටක ශික්ෂාපදය

**සමණුද්දේසෝපි චේ ඒවං වදෙය්‍ය: 'තථාහං භගවතා ධම්මං දේසිතං ආජානාමි, යථා යේමේ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා, තේ පටිසේවතෝ නාලං අන්තරායායාති. සෝ සමණුද්දේසෝ භික්ඛූහි ඒවමස්ස වචනීයෝ: 'මා ආවුසෝ**

**සමනුද්දේස ඒවං අවච. මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතෝ අබ්භක්ඛානං, න හි භගවා ඒවං වදෙය්‍ය. අනේකපරියායේන ආවුසෝ සමනුද්දේස, අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලඤ්ච පන තේ පටිසේවතෝ අන්තරායායාති. ඒවඤ්ච පන සෝ සමණුද්දේසෝ භික්ඛූහි වුච්චමානෝ තථේව පග්ගණ්හෙය්‍ය, සෝ සමණුද්දේසෝ භික්ඛූහි ඒවමස්ස වචනීයෝ: 'අජ්ජතග්ගේ තේ ආවුසෝ සමණුද්දේස න චේව සෝ භගවා සත්ථා අපදිසිතබ්බෝ, යම්පි චඤ්ඤේ සමණුද්දේසා ලභන්ති භික්ඛූහි සද්ධිං දිරත්තතිරත්තං සහසෙය්‍යං, සාපි තේ නත්ථි, චර පරේ විනස්සාති. යෝ පන භික්ඛු ජානං තථානාසිතං සමණුද්දේසං උපලාපෙය්‍ය වා උපට්ඨාපෙය්‍ය වා සම්භුඤ්ජෙය්‍ය වා සහවාසෙය්‍යං කප්පෙය්‍ය, පාචිත්තියං.**

*යම් සාමණේරයෙක් "භාග්‍යවතුන් වහන්සේ විසින් යම් දහම් කොටසක් අන්තාරයකරයයි වදාරණ ලද නමුත් ඒ ධර්මයන් සේවනය කරන්නා හට අන්තරාය පිණිස නොපවතී, ධර්මය අනුව එය මම දනිමි"යි කියා නම් භික්ෂූන් විසින් ඔහුට මෙසේ කිවයුතු වන්නේය. "සාමණේරය, එසේ නොකියව. උන්වහන්සේට අභිබවනය නොකරව. භාග්‍යවතුන් වහන්සේට ගැරහීම සුදුසු නොවෙයි. මක් නිසාද, උන්වහන්සේ එසේ නොවදාරණ ලද හෙයිනි. එම්බා සාමණේරය, භාග්‍යවතුන් වහන්සේ යම් ධර්ම කෙනෙක් අන්තරායකර යැයි වදාරණ ලද නම් ඒ ධර්මයන් සේවනය කරන්නා හට අන්තරාය පිණිස පවත්නේමය. මෙසේ භික්ෂූන් විසින් ඔහුට කියනු ලබද්දීත් යථෝක්ත සාමණේර නම ඒ මතයම ගෙන සිටී නම්, නැවැත ඒ භික්ෂූන් විසින් අද පටන් තොප ශාස්තෲන් වහන්සේ නොඇදිහිය යුත්තේය. අන් සාමණේරයෝ දෙතුන් රැයක් වුවද භික්ෂූන් සමග විසීමට ඉඩ ලබත් ද එයද තොපට නොවන්නේය. එහෙයින් කැමැති තැනක යව'යි කිව යුතු වන්නේය. යම් භික්ෂුවක් ඒ බව දැන දැනත් නෙරපන ලද එබඳු සාමණේරයකු සමග කථාකෙරේ ද, උවටැන් කරවා ගනී ද, සම්භෝගය පවත්වා ද, එක ගෙයි සයනය හෝ කෙරේ ද ඔහු හට පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| උලොපෙයය | පාත්‍ර ආදී පිරිකර දීම |
| උපටඨාපෙයය | උපස්ථාන කරවා ගැනීම |

# සහධම්මික වර්ගය

## 120. සහධම්මික ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛූහි සහධම්මිකං වුච්චමානෝ ඒවං වදෙය්‍ය: 'න තාවාහං ආවුසෝ ඒතස්මිං සික්ඛාපදේ සික්ඛිස්සාමි, යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං**

**විනයධරං පරිපුච්ඡාමී'ති, පාචිත්තියං. සික්ඛමානේන භික්ඛවේ භික්ඛුනා අඤ්ඤාතබ්බං, පරිපුච්ඡිතබ්බං, පරිපඤ්හිතබ්බං, අයං තත්ථ සාමීචි.**

*යම් භික්ෂුවක් පියවි භික්ෂුවක විසින් විනයානුකූලව අවවාද කරනු ලබන කල්හි ඇවැත්නි, මම අනෙක් ව්‍යක්ත විනයධරයකු අතින් නොවිචාරා මේ ශික්ෂාපදයෙහිලා නොහික්මෙන්නම්'යි කියා නම් පචිති වේ. හික්මීම කැමැති භික්ෂුව විසින් වස්තු නිදානාදිය දත යුතුය. පිළිවිසිය යුතුය. කෙසේද කෙසේදැයි විමසිය යුත්තේය. මේ එහිලා පිළි පැදිය යුතු වතයි.*

**අර්ථ**

| | |
|---|---|
| අඤ්ඤාතබ්බං | ශික්ෂාපද පිළිබඳව දැනගත යුතුය |
| පරිපුච්ඡිතබ්බං | විමසා දැනගත යුතුය |
| පරිපඤ්හිතබ්බං | සිතිය යුතුය |

## 121. විලේඛන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු පාතිමොක්ඛේ උද්දිස්සමානේ ඒවං වදෙය්‍ය: 'කිං පනි'මේහි ඛුද්දානුඛුද්දකේහි සික්ඛාපදේහි උද්දිට්ඨේහි, යාවදේව කුක්කුච්චාය විහේසාය විලේඛාය සංවත්තන්තී'ති. සික්ඛාපදවිවණ්ණනකේ පාචිත්තියං.**

*යම් භික්ෂුවක් පාමොක් උදෙසන විට'(ඇවැත්නි,) මේ කුඩා වූ ද ඉතා කුඩා වූද සික පද උදෙසීමෙන් කවර වැඩක් ද? හුදෙක් ඒවා කුකුස් පිණිසත්, වෙහෙසීම හෝ මනෝ විලේඛය හෙවත් සිත කීරි ගැසීම පිණිසත් පවත්නේ ය. එහෙයිනි'යි කියා ද එසේ සික පදයන්ට නින්දා කිරීමෙහි පචිති වේ.*

| | |
|---|---|
| සික්ඛාපද විවණ්ණකෙ | සිකපදවලට ගැරහීම |

ඉගෙනගන්නාවිට හා සජ්ඣායනා කරනවිට ඇවැත් නොවේ.

## 122. මොහන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අන්වද්ධමාසං පාතිමොක්ඛේ උද්දිස්සමානේ ඒවං වදෙය්‍ය: 'ඉදානේ'ව ඛෝ අහං ආජානාමී, අයම්'පි කිර ධම්මෝ සුත්තාගතෝ සුත්තපරියාපන්නෝ, අන්වද්ධමාසං උද්දේසං ආගච්ඡතී'ති. තඤ්චේ භික්ඛුං අඤ්ඤේ භික්ඛූ ජානෙය්‍යුං: 'නිසින්නපුබ්බං ඉමිනා භික්ඛුනා ද්වත්තික්ඛත්තුං,**

**පාතිමොක්ඛේ උද්දිස්සමානේ, කෝ පන වාදෝ හීයෙය්‍යාති. න ච තස්ස භික්ඛුනෝ අඤ්ඤාණකේන මුත්ති අත්ථි. යඤ්ච තත්ථ ආපත්තිං ආපන්නෝ, තඤ්ච යථාධම්මෝ කාරේතබ්බෝ, උත්තරිං ච’ස්ස මෝහෝ ආරෝපෙතබ්බෝ: ‘තස්ස තේ ආවුසෝ අලාභා, තස්ස තේ දුල්ලද්ධං. යං ත්වං පාතිමොක්ඛේ උද්දිස්සමානේ, න සාධුකං අට්ඨිකත්වා මනසිකරෝසී’ති. ඉදං තස්මිං මෝහනකේ පාචිත්තියං.**

*යම් භික්ෂුවක් අඩමසක් පාසා පාමොක් උදුරුවනු ලබන කල්හි, ‘ඇවැත්නි, මේ විනය කොටස් පෙළෙහි ආයේලු, පෙළට ඇතුළත්ලු සෑම අඩමසකට වරක් උදෙසාලු, එහෙත් මා දැන ගත්තේ දැන්මය’යි කියා නම්, සීමස්ථ භික්ෂූන් විසින් එබඳු භික්ෂුවක් පාමොක් උදෙසනකල්හී දෙතුන් වරක (අඩුම) සිටිබව දන්නාහු නම් ඔහු හට ඒ නොදැනීම පමණකින් නිදහස් වීමක් නොවේ. ඒ භික්ෂුව එම වරදෙහිලා යම් ඇවතකට පැමිණියේ නම් ඊට සුදුසු දඬුවම් කරවිය යුතුය. එසේම ‘ඇවැත්නි පාමොක් උදෙසන විට ඔබ අර්ථ වශයෙන් මෙනෙහි නොකරන්නෙහිය. එය ඔබට ආලාභයකි. මිනිසත් බව දුලබයැ’යි ඔහු හට මෝහාරෝපණ කර්මය කරවිය යුත්තේය. නැවැතත් මුළාවෙන් දොඩන භික්ෂුවට පචිති වේ.*

## 123. පහාර ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුස්ස කුපිතෝ අනත්තමනෝ පහාරං දදෙය්‍ය, පාචිත්තියං.**
*යම් භික්ෂුවක් කුපිතව නොසතුටු සිත් ඇතිව වෙනත් භික්ෂුවකට පහර දෙයි නම් පචිති වේ.*

| | |
|---|---|
| කයින්/ කායපටිබද්ධයෙන්/ නිස්සග්ගියෙන් පහරදීමෙන් | පචිති |
| සාමණේරයන්ට ගැසීමෙන් | දුකකට |

## 124. තලසතතික ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුස්ස කුපිතෝ අනත්තමනෝ තලසත්තිකං උග්ගිරෙය්‍ය, පාචිත්තියං.**
*යම් භික්ෂුවක් කුපිතව නොසතුටු සිත් ඇතිව වෙනත් භික්ෂුවකට පහර දීමේ අදහසින් අත්පා සැත් ආදිය ඔසවාද (අන්තිම වශයෙන් නෙළුම් පතකින් වුවද)පචිති වේ.*

| | |
|---|---|
| තලසතතිකං උගගිරෙය්‍යාති | ගැසීමට උත්සාහ කිරීම(බය කිරීම පිණිස ගසන බව පෙන්වීම) |

## 125. සඤ්චිච්ච ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුං අමූලකේන සඞ්ඝාදිසේසේන අනුද්ධංසෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් හේතු රහිත වූ සඟ වෙසෙස් ඇවතකින් භික්ෂුවකට චෝදනා කරේ නම් පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| සඤ්චිච්ච | ආපත්තිවලට පත් නොවූ බව දැන දැන |
| කුකකුච්චං උපදහෙය්‍ය | කුකුස් ඉපිදවීම |

## 126. අමූලක ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛුස්ස සඤ්චිච්ච කුක්කුච්චං උපදහෙය්‍යඃ 'ඉති'ස්ස මුහුත්තම්'පි අඵාසු භවිස්සතී'ති. ඒතදේ'ව පච්චයං කරිත්වා අනඤ්ඤං, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් "මොහොතකට හෝ මොහුට කරදරයක් ඇති කරන්නෙමි'යි" සිතා අනෙක් කාරණයක් නැතිවම කුකුස් උපදවා නම් පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| අමූලක | මුල්නැති(අදිට්ඨ, අසුත, අපරිසංකිත) |
| අනුද්ධංසෙය්‍ය | චෝදනා කිරීම, කරවීම |

අමූලක පචිති ඇවතකින් චෝදනා කලොත් දුෂ්කට වේ.

## 127. උපසසති ශික්ෂාපදය

**යෝ පන භික්ඛු භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨෙය්‍යඃ 'යං ඉමේ භණිස්සන්ති, තං සොස්සාමී'ති. ඒතදේ'ව පච්චයං කරිත්වා අනඤ්ඤං, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් දබර කරන, කෝලාහල කරන, විවාදයට බැසගත් භික්ෂූන්ගේ කතා බස් අසමි'යි සිතා ඔවුන්ගේ කථා ඇසෙන දුර ප්‍රමාණයේ අනෙක් කාරණයක් නැතිවම සිටී නම් පචිති වේ.*

**අර්ථ**

| | |
|---|---|
| උසසුතිං තිටෙය්‍යය | යම් භික්ෂුවක් කලහවලට වාද විවාදවලට පැටලුන භික්ෂූන් වහන්සේලාගේ කතාබස් ඇසීම සඳහා ගොස් අසා සිටීම |

## ආපත්ති

| | |
|---|---|
| යාමේදීපියවරක් පාසා | දුෂ්කට |
| අසා සිටීමේදී | පචිති |

- තමා සිටින තැනටවිත් ඔවුන කතා කරද්දී කැරීම ආදී ශබ්දකොට තමා එහි සිටින බව ඇගවියයුතුය.

  එසේ නොකර අසා සිටීමෙන්ද පචිති

  කලහ සංසිදවන අදහසින් අසා සිටීමෙන් ඇවැත් නැත

## 128. කමමපටිබාහන ශික්ෂාපදය

**යො පන භික්ඛු ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් අපලෝකනාදී විනය කර්මයන්ට ඡන්දය දී පසුව දොස් කියාද පචිති වේ.*

| | |
|---|---|
| ධමමිකානං කමමානං | අපලෝකන, ඤපති කර්ම, ඤපති දුතිය කර්ම- කඨින සිවුර පැවරීම, ඤපති චතුතථ කර්ම- උපසම්පදා, අබභාහන |

ඡන්දය දෙන කර්ම වාක්‍යය

| | |
|---|---|
| ඡනදං මෙ දමමි | - මගේ ඡන්දය දෙමි |
| ඡනදං මෙ හර | - මගේ ඡන්දය ගෙනයන්න |
| ඡනදං මෙ ආරොචෙති/ආරොචෙථ (බාල/වැඩිහිටි) | - මගේ ඡන්දය ආරොචනය කරන්න |

## 129. ඡනදං අදතවාගමන ශික්ෂාපදය

**යො පන භික්ඛු සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් සංඝයා පිළිබඳ වූ විනිශ්චයක් පැවැත්වෙද්දී ඡන්දය නොදී හුනස්නෙන් නැගී යේ ද ඔහු හට පචිති වේ.*

සංඝං විචජයකථාය යම් විනය කර්මයක් කිරීමේ හේතුව සංඝයාට දන්වා තිබීම හෝ විනය කර්මයේ ඤපතිය තබා ඇතිවිට

## ආපත්ති

| | |
|---|---|
| නැගිට යාමේදී | පියවරක් පාසා දුෂ්කට |
| සංඝයාගේ අත්පසින් බැහැරවීමෙන් | පචිති |

## 130. දබබ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සමග්ගේන සඞ්ඝේන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍යඃ 'යථාසන්ථුතං භික්ඛූ සඞ්ඝිකං ලාභං පරිණාමෙන්තී'ති, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් සමගි සංඝයා සමග භික්ෂුවකට සිවුරක් දී පසුව භික්ෂූහු විශ්වාසයන්ට (හිතවතුන්ට) සංඝික ලාභය පිරිනමන්නාහුය" යි භික්ෂූන්ට දොස් කියාද පචිති වේ.*

## අර්ථ

| | |
|---|---|
| ඛීයනධමමං | ගරහන ස්වභාවය |
| යථා සනථුතං | හිතවත් වූ පරිද්දෙන් |

## 131. පරිණාමන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් දැන දැන සඟ සතු (සංඝයා සඳහා වෙන්කළ) දැය පුද්ගලයකුට පවරාද පචිති වේ.*

## ආපත්ති

| | |
|---|---|
| සාංඝික ලාභයක් තමන්ට හරවාගැනීමේදී | නිසැගි |
| සාංඝික ලාභයක් අනුන්ට හැරවීමේදී | පචිති |
| සාංඝික ලාභයක් චෛත්‍යයකට හැරවීමේදී | දුෂ්කට |

# රාජ වර්ගය

## 132. රජනෙතපුර ශික්ෂාපදය

**යෝ පන භික්ඛු රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස අනික්ඛන්තරාජකේ අනිහතරතනකේ පුබ්බේ අප්පටිසංවිදිතෝ ඉන්දඛීලං අතික්කාමෙය්‍ය, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් අභිෂික්ත ක්ෂත්‍රිය රජ කෙනෙකුගේ යහන් ගබඩාවට වදිනු කැමැතිව රජු හා දේවිය පිටතට නොනික්මි කල්හි කලින් කරන ලද දැන්වීමක්ද නැතිව එළිපත ඉක්මවාද පචිති වේ.*

### අර්ථ

| | |
|---|---|
| අභිකඛනතරාජකෙ | රජු පිටතට නොගිය කල්හි |
| අභීඛතරතතකෙ | බිසව එළියට නොගිය කල්හි |
| ඉනදඛීලං අතිකඛාමියෙය | එළිපත ඉක්මවීමෙන් |

## 133. රතන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු රතනං වා රතනසම්මතං වා අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා පාචිත්තියං. රතනං වා පන භික්ඛුනා රතනසම්මතං වා අජ්ඣාරාමේ වා අජ්ඣාවසථේ වා උග්ගහෙත්වා වා උග්ගහාපෙත්වා වා නික්ඛිපිතබ්බං: 'යස්ස භවිස්සති, සෝ හරිස්සතී'ති, අයං තත්‍ථ සාමීචි.**

*යම් භික්ෂුවක් රුවන් හෝ රුවන් යැයි සම්මත වූ දෙයක් ආරාමය හෝ ආවාසය තුළදී හැර ඔසවා ගනී ද, අනෙකකු ලවා හෝ ගන්වාද පචිති වේ. මෙය අයිතිකරු ගෙනයේවා'යි සිතා එවැනි දෙයක් ආරාමය හෝ ආවාසය තුළදී ඔසවා හෝ අනුන් ලවා ඔසවවා හෝ තැබිය හැකිය. මේ ඒ පිළිබඳ පිළිවෙතයි.*

### අර්ථ

| | |
|---|---|
| රතන | රන්, රිදී, මසු, කහවනු, මුතු මැණික්, සංඛ, සක්, පවාලං(වෙරළු මිණි) |
| රතන සමමතං | මිනිසුන්ගේ පාරිභෝගික වස්තු |

## 134. විකාලෙ ගාමපපවෙවසන ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලේ ගාමං පවිසෙය්‍ය, අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා, පාචිත්තියං.**

*යම් භික්ෂුවක් අවශ්‍ය ඉක්මන් කටයුත්තකදී හැර (ආරාමස්ථ) භික්ෂුවකට නොදන්වා නොකල්හි ගම් වදී නම් පචිති වේ.*

සනතං භිකඛුං අනාපුචචා — විහාරයේ දැන්විය හැකි සීමාවක සිටින භික්ෂූන්ට නොදන්වා යෑම

**අනාපත්ති**

හදිසියකදී, වෙනත් ආරාමයකට යාමේදී, භික්ඛුණී, තීර්ථක අයගේ ආරාමවලට යාමේදී

## 135. සූචිඝර ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අට්ඨිමයං වා දන්තමයං වා විසාණමයං වා සූචිඝරං කාරාපෙය්‍ය, භේදනකං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් මාළු ආදී ඇටයකින් හෝ ඇත්දළයකින් හෝ මුව ආදි අඟකින් හෝ ඉදිකටු ගුලාවක් කරවා නම් භේදනක පචිතිය හෙවත් එය බිඳ  දමා දෙසිය යුතු පචිතිය වේ.*

වෙන අයකු සාදන ලද එකක් පරිභෝග කිරීමෙන් ඇවැත් නැත

## 136. මඤ්ච ශික්ෂාපදය

**නවං පන භික්ඛුනා මඤ්චං වා පීඨං වා කාරයමානේන අට්ඨඞ්ගුලපාදකං කාරේතබ්බං සුගතඞ්ගුලේන, අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියා, තං අතික්කාමයතො, ඡේදනකං පාචිත්තියං.**

*අළුත් ඇඳක් හෝ පුටුවක් කරවන භික්ෂුව විසින් යට විට්ටම හැර සුගත් අඟලෙන් අඟල් 8 ක් පා ඇතිව කරවිය යුතුය. එය ඉක්මවන්නාහට ඡේදනක පචිතිය වේ. ( සිඳ දමා දෙසිය යුතු පචිතිය වේ.)*

- වැඩි කොටස කපා දමා ආපත්ති දේශනා කරගත යුතුය
- වෙනකකු පූජා කල ඇදක් පරිභෝග කිරීමේදී දුෂ්කට
- සුගත අඟුල් 08 (සාමාන්‍ය අඟුල් 18)

## 137. තූලොනදධ ශික්ෂාපදය

**යෝ පන භික්ඛු මඤ්චං වා පීඨං වා තූලෝනද්ධං කාරාපෙය්‍ය, උද්දාලනකං පාචිත්තියං.**

*යම් භික්ෂුවක් ඇඳක හෝ පුටුවක පුළුන් ගවසා නම් (කුෂන් කරයි නම්) උද්දාලනක පචිතිය වේ. (පුළුන් උදුරා දැමීමෙන් පසුව දෙසිය යුතු පචිතිය වේ.)*

උදදාලනනක ගලවා ඉවත් කිරීම

තූලොනදධ පුටු ආදියට කරන පුළුං කුෂන් ආදී ක්‍රම

## 138. නිසීදන ශික්ෂාපදය

**නිසීදනං පන භික්ඛුනා කාරයමානේන පමාණිකං කාරේතබ්බං; තත්‍රි’දං පමාණං: දීඝසෝ ද්වේ විදත්ථියෝ සුගතවිදත්ථියා, තිරියං දියඩ්ඪං, දසා විදත්ථි. තං අතික්කාමයතෝ, ඡේදනකං, පාචිත්තියං.**

*නිසීදනයක් කරවන භික්ෂුව විසින් ප්‍රමාණ ලෙස කරවිය යුතුය. මේ එහි ප්‍රමාණයයි. දිගින් සුගත් වියතින් දෙවියතකි. පළලින් වියත් එක හමාරකි. දහවලුව වියතකි. එය ඉක්මවන්නා හට ඡේදනක පචිතිය වේ.*

## 139. කණ්ඩුපටිච්ඡාද ශික්ෂාපදය

**කණ්ඩුපටිච්ඡාදිං පන භික්ඛුනා කාරයමානේන පමාණිකා කාරේතබ්බා; තත්‍රි’දං පමාණං: දීඝසෝ චතස්සෝ විදත්ථියෝ සුගතවිදත්ථියා, තිරියං ද්වේ විදත්ථියෝ. තං අතික්කාමයතෝ, ඡේදනකං, පාචිත්තියං.**

*කණ්ඩුපටිච්ඡාදනක සිවුරක් (කුෂ්ට රෝගාදියක් වසා අඳින රෙද්දක්) කරවන භික්ෂුව විසින් එය ප්‍රමාණ ලෙස කරවිය යුතුය. දිගින් සුගත් වියතින් වියත් සතරක් හා පළලින් වියත් දෙකක් විය යුතුය. මේ එහි ප්‍රමාණයයි. මෙය ඉක්මවන්නා හට ඡේදනක පචිතිය වේ.*

## 140. වස්සිකසාටක ශික්ෂාපදය

**වස්සිකසාටිකං පන භික්ඛුනා කාරයමානේන පමාණිකා කාරේතබ්බා: තත්‍රිදං පමාණං: දීඝසෝ ඡ විදත්ථියෝ සුගතවිදත්ථියා, තිරියං අඩ්ඪතෙය්‍යා. තං අතික්කාමයතෝ, ඡේදනකං, පාචිත්තියං.**

*වැසි සළුවක් කරවන භික්ෂුව විසින් එය ප්‍රමාණ ලෙස කරවිය යුතුය. මේ එහි ප්‍රමාණයයි. දිගින් සුගත වියතින් වියත් සයකි. පළලින් දෙවියත් හමාරකි. මේ නියමය ඉක්මවන්නා හට ඡේදනක පචිතිය වේ.*

## 141. නනදපෙර ශික්ෂාපදය

**යෝ පන භික්ඛු සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙය්‍ය අතිරේකං වා ඡේදනකං, පාචිත්තියං. තත්‍රි'දං සුගතස්ස සුගතචීවරප්පමාණං : දීඝසෝ නව විදත්ථියෝ සුගතවිදත්ථියා, තිරියං ඡ විදත්ථියෝ. ඉදං සුගතස්ස සුගතචීවරප්පමාණං.**

*යම් භික්ෂුවක් සුගත් සිවුර තරම් සිවුරක් හෝ ඊට වඩා ලොකු සිවුරක් හෝ කරවා නම් ඡේදනක පචිතිය වේ. මේ සුගතයන් වහන්සේගේ සිවුරේ ප්‍රමාණයයි. දිගින් සුගත් වියතින් වියත් නවයකි. පළලින් වියත් හයකි.*

# පාටිදේශනී (04) (ගැරහිය යුතු බැවින්)

## 142. පඨම පාටිදේශනී ශික්ෂාපදය

**යෝ පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා, අන්තරඝරං පවිට්ඨාය, හත්ථතෝ ඛාදනීයං වා භෝජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා. පටිදේසේතබ්බං තේන භික්ඛුනාඃ ගාරය්හං, ආවුසෝ! ධම්මං ආපජ්ජිං, අසප්පායං, පාටිදේසනීයං, තං පටිදේසේමී'ති.**

*යම් භික්ෂුවක් ඇතුළු ගමට පිවිස ඥාති නොවූ භික්ෂුණියකගේ අතින් කෑ යුතු බුදියයුතු දැයක් සියතින් පිළිගෙන වළඳනම් එබඳු භික්ෂුව විසින් 'ඇවැත්නි, ගැරහිය යුතු වූ යෝගය නොවූ, නැවත අනුන්ට දෙසිය යුතු වූ ඇවතකට පැමිණියෙමි"යි (භික්ෂූන් හමුවෙහි ) ඇවැත් දෙසිය යුතුය.*

අනතරසරං පවිටඨාය වීථිය, මංසන්ධිය, ගෘහය

## 143. දුතිය පාටිදේශනී ශික්ෂාපදය

**භික්ඛූ පනේ'ව කුලේසු නිමන්තිතා භුඤ්ජන්ති. තත්‍රචේසා භික්ඛුනී වෝසාසමානරූපා ඨිතා හෝතිඃ 'ඉධ සූපං දේථ, ඉධ ඕදනං දේථා'ති. තේහි භික්ඛූහි සා භික්ඛුනී අපසාදේතබ්බාඃ 'අපසක්ක තාව, භගිනි! යාව භික්ඛූ භුඤ්ජන්තී'ති. ඒකස්ස චේ'පි භික්ඛුනෝ නප්පටිභාසෙය්‍ය තං භික්ඛුනිං අපසාදේතුංඃ 'අපසක්ක තාව, භගිනි! යාව භික්ඛූ භුඤ්ජන්තී'ති. පටිදේසේතබ්බං තේහි භික්ඛූහිඃ'ගාරය්හං ආවුසෝ! ධම්මං ආපජ්ජිම්හා, අසප්පායං, පාටිදේසනීයං, තං පටිදේසේමා'ති.**

*භික්ෂූහු දායක කුලයෙක්හි ආරාධනා ලැබ ගොස් වළඳමින් සිටිති. එහිදී භික්ෂුණියක් මෙහි බත් බෙදව, මෙහි හොදි බෙදව, මෙහි ව්‍යඤ්ජන බෙදව්'යි විධාන කරමින් සිටී නම් එහි සිටි භික්ෂූන් විසින් "නැගණිය, භික්ෂූන් වළඳ අවසන් වනතුරු තොප මෙයින් ඉවත්ව යව්'යි ඉවත් කළ යුතුය. වළඳමින් සිටි එකද භික්ෂුවකටවත් ඇය ඉවත් කිරීමට නොවැටහුණි නම් ඒ භික්ෂූන් විසින් "ඇවැත්නි, ගැරහිය යුතු වූ අයෝගය වූ නැවත අනුන්ට දෙසිය යුතු වූ ඇවතකට පැමිණියෙමු'යි (භික්ෂූන් හමුවෙහි) ඇවැත් දෙසිය යුතුය.*

වොසසමානා රූප තමන්ට හිතවත් ස්වාමීන්වහන්සේලාට විධාන කරමින් බත් සූප ආදිය ලබාදීම(සාමණේරී/සිකඛමානා ඇවැත් නැත)අ

**ආපත්ති**

| | |
|---|---|
| භික්ෂුනිය ඉවත් නොකර දානය පිළිගැනීම | දුෂ්කට |
| වැලදීමේදී ගිලින වාරයක් පාසා | පාටිදේශනී |

## 144. තතිය පාටිදේශනි ශික්ෂාපදය

**යානි ඛෝ පන තානි සෙක්ඛසම්මතානි කුලානි. යෝ පන භික්ඛු තථාරූපේසු සෙක්ඛසම්මතේසු කුලේසු, පුබ්බෙ අනිමන්තිතෝ අගිලානෝ, ඛාදනීයං වා භෝජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා. පටිදේසේතබ්බං තේන භික්ඛුනා: ගාරය්හං, ආවුසෝ! ධම්මං ආපජ්ජිං, අසප්පායං, පාටිදේසනීයං, තං පටිදේසේමීති.**

*යම් නොගිලන් භික්ෂුවක් සේඛ සම්මුතිය ලැබූ ගෙවලට කලින් නොපවරන ලද්දේම එළඹ කෑයුතු බුදියයුතු දැයක් සියතින් පිළිගෙන වළඳනම් ඒ භික්ෂුව විසින් "ඇවැත්නි, ගැරහිය යුතු වූ අයෝග්‍ය වූ නැවත අනුන්ට දෙසිය යුතු වූ ඇවතකට පැමිණියෙමි'යි භික්ෂූන් හමුවෙහි ඇවැත් දෙසිය යුතුය.*

සෙඛ සමමත කුල කිසියම් නිවසක ආර්යයන් වෙසෙත්ද එබදු කුලය ශ්‍රද්ධාවෙන් වැඩෙන බැවින් ධනයෙන් පිරිහෙත් නම් සංඝයා විසින් සේඛ යැයි සමමත කරන ලදී.

## 145. චතුතථ පාටිදේශනී ශික්ෂාපදය

**යානි ඛෝ පන තානි ආරඤ්ඤකානි සේනාසනානි, සාසඞ්කසම්මතානි සප්පටිභයානි. යෝ පන භික්ඛු, තථාරූපේසු සේනාසනේසු විහරන්තෝ, පුබ්බෙ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භෝජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා, අගිලානෝ, ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා. පටිදේසේතබ්බං තේන භික්ඛුනා: 'ගාරය්හං, ආවුසෝ! ධම්මං ආපජ්ජිං, අසප්පායං, පාටිදේසනීයං, තං පටිදේසේමීති.**

*යම් නොගිලන් භික්ෂුවක් සැකසහිත වූ ද භයසහිත වූ ද ආරණ්‍ය සෙනසුනෙක්හි වසමින් කලින් නොහඟුනන කෙනෙකුගෙන් කෑයුතු බුදියයුතු දැයක් සියතින් පිළිගෙන වළඳනම් ඒ භික්ෂුව විසින් "ඇවැත්නි, ගැරහිය යුතු වූ අයෝග්‍ය වූ නැවත දෙසිය යුතු වූ ඇවතකට පැමිණියෙමි'යි (භික්ෂූන් හමුවෙහි )ඇවැත් දෙසිය යුතුය.*

# සේඛියා (75) (ආර්යයන් වහන්සේලා හික්මෙන බැවින්)

## පරිමණ්ඩල වර්ගය

**146. පරිමණ්ඩලං නිවාසෙස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*හාත්පසින් වට කොට අඳනය අඳිමි'යි හික්මිය යුතුය.*

**147. පරිමණ්ඩලං පාරුපිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*හාත්පසින් වට කොට සිවුර පොරවමි'යි හික්මිය යුතුය.*

**148. සුපටිච්ඡන්නෝ අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*සුපිළිසන්ව ඇතුල්ගමෙහි යමි'යි හික්මිය යුතුය.*

**149. සුපටිච්ඡන්නෝ අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*සුපිළිසන්ව ඇතුල්ගමෙහි හිඳිමි'යි හික්මිය යුතුය.*

**150. සුසංවුතෝ අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*සංවර ඇතිව ඇතුල්ගමෙහි යමි'යි හික්මිය යුතුය.*

**151. සුසංවුතෝ අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*සංවර ඇතිව ඇතුල්ගමෙහි හිඳිමි'යි හික්මිය යුතුය.*

**152. ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*පහත හෙළූ ඇස් ඇතිව ඇතුල් ගමෙහි යමි'යි හික්මිය යුතුය.*

**153. ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*පහත හෙළූ ඇස් ඇතිව ඇතුල් ගමෙහි හිඳිමි'යි හික්මිය යුතුය.*

**154. න උක්ඛිත්තකාය අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*කැසපට ගන්වා ඇතුල් ගමෙහි නොයමි'යි හික්මිය යුතුය.*

**155. න උක්ඛිත්තකාය අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*කැසපට ගන්වා ඇතුල් ගමෙහි නොහිඳිමි'යි හික්මිය යුතුය.*

## උජ්ජග්ඝික වර්ගය

**156. න උජ්ජග්ඝිකාය අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*මහ හඬින් සිනාසෙමින් ඇතුල් ගමෙහි නොයෙමි'යි හික්මිය යුතුය.*

**157. න උජ්ජග්ඝිකාය අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*මහ හඬින් සිනාසෙමින් ඇතුල් ගමෙහි නොහිඳිම්'යි හික්මිය යුතුය.*

**158. අප්පසද්දෝ අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*ශබ්ද නොකොට ඇතුල් ගමෙහි යමි'යි හික්මිය යුතුය.*

**159. අප්පසද්දෝ අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*ශබ්ද නොකොට ඇතුල් ගමෙහි හිඳිම්'යි හික්මිය යුතුය.*

**160. න කායප්පචාලකං අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*කය සොලවමින් ඇතුල් ගමෙහි නොයමි'යි හික්මිය යුතුය.*

**161. න කායප්පචාලකං අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*කය සොලවමින් ඇතුල් ගමෙහි නොහිඳිම්'යි හික්මිය යුතුය.*

**162. න බාහුප්පචාලකං අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*අත් සොලවමින් ඇතුල් ගමෙහි නොයමි'යි හික්මිය යුතුය.*

**163. න බාහුප්පචාලකං අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*අත් සොලවමින් ඇතුල් ගමෙහි නොහිඳිම්'යි හික්මිය යුතුය.*

**164. න සීසප්පචාලකං අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*හිස සොලවමින් ඇතුල් ගමෙහි නොයමි'යි හික්මිය යුතුය.*

**165. න සීසප්පචාලකං අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*හිස සොලවමින් ඇතුල් ගමෙහි නොහිඳිම්'යි හික්මිය යුතුය.*

## ඛම්භකත වර්ගය

**166. න ඛම්භකතෝ අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*උකුලෙහි අත තබා ඇතුල් ගමෙහි නොයමි'යි හික්මිය යුතුය.*

**167. න ඛම්භකතෝ අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*උකුලෙහි අත තබා ඇතුල් ගමෙහි නොහිඳිම්'යි හික්මිය යුතුය.*

**168. න ඕගුණ්ඨිතෝ අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*හිස වැසුම් ඇතිව ඇතුල් ගමෙහි නොයමි'යි හික්මිය යුතුය.*

**169. න ඕගුණ්ඨිතෝ අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*හිස වැසුම් ඇතිව ඇතුල් ගමෙහි නොහිඳිම්'යි හික්මිය යුතුය.*

**170. න උක්කුටිකාය අන්තරඝරේ ගමිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*විළුඹ හෝ ඇඟිලි බිම අනිමින් ඇතුල් ගමෙහි නොයමි'යි හික්මිය යුතුයි*

**171. න පල්ලත්ථිකාය අන්තරඝරේ නිසීදිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*අතින් හෝ වස්ත්‍රයකින් දණහිස් බැඳගෙන ඇතුල් ගමෙහි නොහිඳිම්'යි හික්මිය යුතුය.*

**172.** සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමී'ති, සික්ඛා කරණීයා.

*සිහි ඇතිව පිඬු පිළිගනිම්'යි හික්මිය යුතුය.*

**173.** පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමී'ති, සික්ඛා කරණීයා.

*පාත්‍ර සඤ්ඤාව ඇතිව පිඬු පිළිගනිම්'යි හික්මිය යුතුය.*

**174.** සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමී'ති, සික්ඛා කරණීයා.

*බතින් සතරෙන් කොටසක් ව්‍යඤ්ජන ඇතිව පිඬු පිළිගනිම්'යි හික්මිය යුතුය.*

**175.** සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමී'ති, සික්ඛා කරණීයා.

*පාත්‍රයේ ඇතුල් මුව විට හා සමව පිඬු පිළිගනිම්'යි හික්මිය යුතුය.*

## සකකචච වර්ගය

**176.** සක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.

*සිහි ඇතිව පිඬු වළඳම්'යි හික්මිය යුතුය.*

**177.** පත්තසඤ්ඤී පිණ්ඩපාතං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.

*පාත්‍ර සඤ්ඤාව ඇතිව පිඬු වළඳම්'යි හික්මිය යුතුය.*

**178.** සපදානං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.

*පාත්‍රයේ තම පැත්තෙන් පටන් ගෙන පිඬු වළඳම්'යි හික්මිය යුතුය.*

**179.** සමසූපකං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.

*බතට සුදුසු ව්‍යංජන සහිතව පිඬු වළඳම්'යි හික්මිය යුතුය.*

**180.** න ථූපකතෝ ඕමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.

*බතේ මුදුනෙන් අනා පිඬු නො වළඳම්'යි හික්මිය යුතුය.*

**181.** න සූපං වා බ්‍යඤ්ජනං වා ඕදනේන පටිච්ඡාදෙස්සාමි භියෝ්‍යකම්‍යතං උපාදායා'ති, සික්ඛා කරණීයා.

*බොහෝ ලබා ගනු කැමතිව සූපයක් හෝ ව්‍යංජනයක් බතින් නොවසම්'යි හික්මිය යුතුය.*

**182.** න සූපං වා ඕදනං වා අගිලානෝ අත්තනෝ අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.

*නොගිලන්ව සූපයක් හෝ බතක් හෝ තමන් සඳහා ඉල්ලාගෙන නොවළඳම්'යි හික්මිය යුතුය.*

**183.** න උජ්ඣානසඤ්ඤී පරේසං පත්තං ඕලෝකෙස්සාමී'ති, සික්ඛා කරණීයා.

*ගරහනු කැමතිව අනුන්ගේ පාත්‍රය දෙස නොබලම්'යි හික්මිය යුතුය.*

**184.** නාතිමහන්තං කබලං කරිස්සාමී'ති, සික්ඛා කරණීයා.

*ඉතා මහත්ව බත් පිඬු නොකරම්'යි හික්මිය යුතුය.*

**185.** පරිමණ්ඩලං ආලෝපං කරිස්සාමී'ති, සික්ඛා කරණීයා.

*හාත්පසින් ගුළි කොට බත් පිඩු කරමි'යි හික්මිය යුතුය*

## කබළ වර්ගය

**186. න අනාහටේ කබළේ මුඛද්වාරං විවරිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*බත් පිඩු මුවට ළං වන තුරු මුව නාරිමි'යි හික්මිය යුතුය.*

**187. න භුඤ්ජමානෝ සබ්බං හත්ථං මුඛේ පක්ඛිපිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*වළඳන අතර සියලු අත මුඛයෙහි නොහෙළමි'යි හික්මිය යුතුය.*

**188. න සකබළේන මුඛේන බ්‍යාහරිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*මුව තුළ ආහාර ඇතිව කථා නොකරමි'යි හික්මිය යුතුය.*

**189. න පිණ්ඩුක්ඛේපකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*බත්පිඩු මුව තුළට විසි කරමින් නොවළඳමි'යි හික්මිය යුතුය.*

**190. න කබළාවච්ඡේදකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*බත් පිඩු කඩ කඩා අනුභව නොකරමි'යි හික්මිය යුතුය.*

**191. න අවගණ්ඩකාරකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*(වඳුරන් මෙන්) හක්කෙහි බත් පුරවා ගෙන නොවළඳමි'යි හික්මිය යුතුය.*

**192. න හත්ථනිද්ධුනකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*අත ගසා දමමින් නොවළඳමි'යි හික්මිය යුතුය.*

**193. න සිත්ථාවකාරකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*බත් හුළු විසුරුවමින් නොවළඳමි'යි හික්මිය යුතුයි*

**194. න ජිව්හානිච්ඡාරකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*(තොලෙන් පිටතට) දිව නෙරවමින් නොවළඳමි'යි හික්මිය යුතුය.*

**195. න චපුචපුකාරකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*චපු, චපු යන ශබ්ද ඇති වන සේ නොවළඳමි'යි හික්මිය යුතුය.*

## සුරු සුරු වර්ගය

**196. න සුරු සුරු කාරකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*සුරු, සුරු යන ශබ්ද ඇති වන සේ නොවළඳමි'යි හික්මිය යුතුය.*

**197. න හත්ථනිල්ලේහකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*අත ලෙව කමින් නොවළඳමි'යි හික්මිය යුතුය.*

**198. න පත්තනිල්ලේහකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*පාත්‍රය ලෙව කමින් නොවළඳමි'යි හික්මිය යුතුය.*

**199. න ඔට්ඨනිල්ලේහකං භුඤ්ජිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*දිවෙන් තොල් ලෙව කමින් නොවළඳමි'යි හික්මිය යුතුය.*

**200. න සාමිසේන හත්ථේන පානීයථාලකං පටිග්ගහෙස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*ඉඳුල් සහිත අතින් පැන් භාජනය නොපිළිගනිමි'යි හික්මිය යුතුය.*

**201. න සසිත්ථකං පත්තධෝවනං අන්තරඝරේ ඡඩ්ඩෙස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*බත් හුළු සහිත පාත්‍රය සේදූ ජලය ඇතුල් ගමෙහි හෝ ඇතුල් ගෙයි නොදමමි'යි හික්මිය යුතුය.*

**202. න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*කුඩයක් දරා සිටි නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

**203. න දණ්ඩපාණිස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*සැරයටියක් ගත් නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

**204. න සත්ථපාණිස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*ජත්‍රයක් ගත් නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

**205. න ආයුධපාණිස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*ආයුධයක් ගත් නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

## පාදුකා වර්ගය

**206. න පාදුකාරූළ්හස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*ලී සෙරෙප්පු පය ලූ නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

**207. න උපාහනාරූළ්හස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*වහන් පය ලූ නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

**208. න යානගතස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*රථයකට නැගුණා වූ නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

**209. න සයනගතස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*ඇඳක නිදන නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

**210. න පල්ලත්ථිකාය නිසින්නස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*අතින් හෝ වස්ත්‍රයකින් දෙදන බැඳ සිටින නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

**211. න වේඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*හිස් වෙළුම් සහිත නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

**212. න ඕගුණ්ඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*හිස වසා පෙරවූ නොගිලන් කෙනෙකුට දහම් නොදෙසමි'යි හික්මිය යුතුය.*

**213. ඡමාය නිසීදිත්වා ආසනේ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*තමා බිම හිඳ අසුනක සිටින නොගිලන් කෙනෙකුට දහම් නොදෙසම්'යි හික්මිය යුතුය.*

**214. න නීචේ ආසනේ නිසීදිත්වා උච්චේ ආසනේ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*හිස වසා පෙරවූ නොගිලන් කෙනෙකුට දහම් නොදෙසම්'යි හික්මිය යුතුය. තමා පහත් අසුනක හිඳ උස් අසුනක හුන්නාවූ නොගිලන් කෙනෙකුට දහම් නොදෙසම්'යි හික්මිය යුතුය.*

**215. න ඨිතෝ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*තමා සිටගෙන හිඳසිටින නොගිලන් කෙනෙකුට දහම් නොදෙසම්'යි හික්මිය යුතුය.*

**216. න පච්ඡතෝ ගච්ඡන්තෝ පුරතෝ ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*තමා පසුපසින් යමින් ඉදිරියෙන් යන්නාවූ නොගිලන් කෙනෙකුට දහම් නොදෙසම්'යි හික්මිය යුතුය.*

**217. න උප්පථේන ගච්ඡන්තෝ පථේන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දේසිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*තමා නොමගින් යමින් මඟින් යන නොගිලන් කෙනෙකුට දහම් නොදෙසම්'යි හික්මිය යුතුය.*

**218. න ඨිතෝ අගිලානෝ උච්චාරං වා පස්සාවං වා කරිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*නොගිලන්ව, සිටගෙන මළමුත්‍ර නොකරම්'යි හික්මිය යුතුය.*

**219. න හරිතේ අගිලානෝ උච්චාරං වා පස්සාවං වා ඛේළං වා කරිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*නොගිලන්ව නිල් තණ බිමක මළමුත්‍ර නොකරම්'යි, කෙළ නොගසම්'යි හික්මිය යුතුය.*

**220. න උදකේ අගිලානෝ උච්චාරං වා පස්සාවං වා ඛේළං වා කරිස්සාමී'ති, සික්ඛා කරණීයා.**

*නොගිලන්ව ජලයේ මළමුත්‍ර නොකරම්'යි, කෙළ නොගසම්'යි හික්මිය යුතුය.*

# අධිකරණ

විවාද අධිකරණය - අටලොස් භේදකර වස්තුවලින් හටගන්නා විවාද

අනුවාද අධිකරණය - සීල, ආචාර, දෘෂ්ඨි, ආජීව යන විපත්වලින් චෝදනා කලවිට ඇතිවන අධිකරණ

ආපත්ති අධිකරණය - තමාට ඇති ඇවතක් විසදාගන්නා ආකාරය හෙවත් සප්ත ආපත්තිස්කන්ධයෝ ආපත්ති අධිකරණයයි

කිච්චා අධිකරණය - අපලෝකනාදී විනයකර්ම කටයුතු

# අධිකරණ සමථ (07)

(ඉහත සදහන් අධිකරණයෝ සංසිදුවන අධිකරණ සමථ සතකි.)

සමමුඛා විනය

සංඝ, ධර්ම, විනය, පුද්ගල යන මොවුන්ගේ සමමුඛත්වයෙන් අධිකරණයක් විසදීම

සති විනය

අමූලක චෝදනාවට ලක් වූ රහතන් වහන්සේලාට දෙන විනය. ඉන් පසු එම භික්ෂුවට චෝදනා කල නොහැක.(දබබමලලපුතත රහතන් වහන්සේ)

අමූලහ විනය

උමතු (අවනත වන) භික්ෂුවට දෙන විනය මෙයයි.

පටිඤඤාතකරණ විනය

චූදිත භික්ෂුවගේ ප්‍රතිඥාවෙන් ඇවැත් කරවීම.යම් භික්ෂුවකට ඇවතකින් චෝදනා කලවිට එම භික්ෂුව ‘එය නොවේ මා අතින් සිදුවූයේ මෙම ඇවතයි‘ යයි ප්‍රතිඥා දෙන්නේ නම් එම ඇවතට අධිකරණ පැන වේ.

යෙභුයිහසිකා

ධර්මවාදී භික්ෂූන් වැඩිකරගෙන විසදන අධිකරණයයි.

තසසපාපියිහසිකා

ඇවැත් වසන් කරන පාපී භික්ෂූන්ට මෙය දෙනු ලැබේ.

තිණවතථාරක

යම් අධිකරණයක් විසදන්නට යාමේදී අශූචි ගොඩක් අවුස්සන විටමෙන් ගඳගසන්නේ නම් හෙවත් වැඩිවෙයි නම් එය අශූචි ගොඩක් වසා දමන්නාක් මෙන් වසා දමනු ලැබේ. එය තිනවතථාරකයයි.

# ශාසන ඉතිහාසය

අචාර්ය පරම්පරාව

**දඹදිව**

උපාලි ⟶ දාසක ⟶ සොණක ⟶ සිගගව ⟶ මොගගලීපුතතතිසස මහ රහතන්
වහන්සේලා

**බුරුම රට**

සොණ ⟶ සොභිත ⟶ සොමදතත ⟶ සුමනතිසස මහ රහතන් වහන්සේලා ⟶
............

⟶ සුරියවංශාලංකාර සංඝරාජ ඥෙයාා ධමමාභි මුනිවර ඥාණකිතති සිරිපවර ධමම සෙනාපති මහාධමම රාජාධිරාජගුරු සංඝරාජ මහා ස්ථවිර

**ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය පිහිටුවීම**

බුරුම රට එම නිකායෙන් උපසම්පදාව ලබාගත්

අතිපූජනීය වරාපිටියේ සුමිත්ත මාහිමිපාණන් වහන්සේ (උපාධ්‍යාය)

අතිපූජනීය පුවක්දණ්ඩාවේ පඤ්ඤානන්ද මාහිමිපාණන් වහන්සේ

සාසනවංස කවිධජ සිරිසද්ධම්මාචාරිය යති සංඝපති අතිපූජනීය අඹගහවත්තේ ඉන්දාසභවරඤාණසාමි (සරණංකර) මාහිමිපාණන් වහන්සේ (මූලිකත්වය)

යන ස්වාමීන්වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් 1864-07-12 (බු.ව. 2407) දින ගාල්ල මහමෝදර උදකුක්ඛේප සීමා මාලකයේදී සිදුකල ගරු උපසම්පදා විනය කර්මයකින් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය පිහිටුවන ලදී.

**<u>ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය</u>**

හිටපු මහා නායක අතිපූජනීය වේවැල්දෙණියේ මේධාලංකාර මහා නායක ස්වාමීන් වහන්සේ

නව මහා නායක අතිපූජනීය නාපානේ පේමසිරි මහා නායක ස්වාමීන් වහන්සේ

ලේකම් මකුලැවේ විමල නායක ස්වාමීන් වහන්සේ

**<u>ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවීම</u>**

රාමඤ්ඤ මහ නිකායේ ගුරු පරම්පරාවටම අයත් වූ

අතිපූජනීය මාතලේ සිරි අග්ගධම්මාලංකාර

අතිපූජනීය කැකණුදුරේ සිරි අරියවිලාස මාහිමිපාණන් වහන්සේලාගේ ශිෂ්‍යරත්නයක් වූ

අතිපූජනීය මාතර සිරි ඤාණාරාම මාහිමිපාණන් වහන්සේ (උපාධ්‍යායන්)

අතිපූජනීය කඩවැද්දුව සිරි ජිනවංශ මාහිමිපාණන් වහන්සේ (සමුප්පාදක)

යන ගරු ස්වාමීන්වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් 1951-06-18 (බු.ව. 2495) වෙනි දින දෙල්දූව විවේක සේනාසනයේදී කරනලද පැවිදි පිංකමකින් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍ර සංස්ථාව පිහිටුවන ලදී.

**<u>ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව</u>**

ප්‍රධාන අනුශාසක ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක මහෝපාධ්‍යාය සාසනධජ ත්‍රිපිටකවාගීෂ්වරාචාර්ය මහා කම්මට්ඨානාචාර්ය අතිපූජනීය නා උයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ

සභාපති අතිපූජනීය පහලවිටියල ජනානන්ද මාහිමිපාණන් වහන්සේ

සංඝා ලේඛකාධිකාරී(හිටපු) අතිපූජනීය රහතුන්ගොඩ බෝධිරක්ඛිත මාහිමිපාණන් වහන්සේ

සංඝා ලේඛකාධිකාරී(වර්තමාන) අතිපූජනීය කහගොල්ලේ සෝමවංශ ස්වාමීන් වහන්සේ

ලේකම් අතිපූජනීය හැවැන්පැලැස්සේ චන්දවංශ ස්වාමීන් වහන්සේ

<u>ආදර්ශ පාඨය</u>

## ‘අත්ථිකෙහි උපඤ්ඤාතො මග්ගො’

අර්ථය කැමති වන්නහු විසින් මාර්ගය සොයාගන්නා ලදි.

(අර්ථය කැමති වන්නහු විසින් මාර්ගය සෙවිය යුතුය)